# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014 සැප්තැම්බර් 23** වන අඟහරුවාදා
2014 புறட்டாசி 23 செவ்வாய்க்கிழமை
Tuesday 23rd September 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.38 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.38 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.38 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.09.10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 1277/5 හි පදිංචි ප්‍රින්ස් දළුගොඩ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පාදුක්ක, වේරගල, අංක 42/1 හි පදිංචි ඩී.ඒ.එම්. කළුබෝවිල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ජා-ඇළ, මාකෙවිට, ගෝනගහ, අංක 08 හි පදිංචි ආර්. සිරිපාල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, වස්කඩුව, කු/වස්කඩුව, 23 කණුව අසල, අංක 390 B හි පදිංචි ඒ. චන්ද්‍රරත්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**[සභා මේසය මත තබන ලද පෙත්සම්]*
*[Tabled petitions]*

රෝජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

අවිස්සාවේල්ල, කොළඹ පාර, I වන පටුමග, අංක 138/21 A හි පදිංචි කේ.පී. විතාරණ යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය විදුලිබල හා බලශක්ති ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon. George Perera-Member, under item No. 01 in the agenda was presented to the Hon. Minister of Electricity and Power and as two weeks time was asked for it by Hon. Minister Nimal Lansa on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

# දහම් පාසල් : ප්‍රතිපාදන
## DAHAM SCHOOLS : PROVISIONS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**02.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/14/37)**

අ. මේ වසර තුළ මෙතෙක් රුපියල් ලක්ෂය බැගින් ලැබූ දහම් පාසල් ගණන කොපමණද?

ආ. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් කීයකට මෙම මුදල් ලබා දී තිබේද?

ඇ. තවත් දහම් පාසල් කීයකට මෙම ප්‍රතිපාදන ලබා දීමට ඉතිරිව ඇත්ද?

ඈ. එම දහම් පාසල්වලට ප්‍රතිපාදන ලබා දීමට කිසියම් බාධාවක් තිබේද?

ඉ. දහම් පාසල්වලට ප්‍රතිපාදන නිකුත් කිරීම හා අධීක්ෂණය කරනු ලබන්නේ කවුද?

ඊ. කලින් වතාවල සිදු කළ ආකාරයට වඩා වෙනස්ව යමින්, මෙම මුදල් ආධාර බෙදා දීමේ කටයුතු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට බාර දෙන ලෙස නියෝග කරමින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඔබතුමා ලිපි යවා තිබේද?

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development) [On behalf of Hon. Chief Minister]

අ. පළමු අදියර - 2056
දෙවන අදියර - 2020

ආ. පළමු අදියර - 65
දෙවන අදියර - 46

ඇ. 19

ඈ. පළමු ආධාර මුදල යෙද වූ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය හා දෙවන ආධාර මුදල ලබා ගැනීමේ ව්‍යාපෘති යෝජනාව නියමිත දිනට අප කාර්යාංශයට ලබා නොදීම හේතුවෙන් එම දහම් පාසල් සඳහා මෙම ආධාර මුදල ලබා ගැනීමට අපහසු වී ඇත.

ඉ. ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

ඊ. නැත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් මේ සමහර ආධාර මුදල් ලබා දීමේ කටයුතු ඇතැම් මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා කියලා දැනගන්න තිබෙනවා. මීට කලින් ඒ මුදල් ලබා දුන්නේ, ප්‍රාදේශීය ලේකම්වරයා හරහා. මම අහලා තිබෙන ප්‍රශ්නය - ඉතාම වගකීමෙන් කියන්නේ, මන්ත්‍රීවරුන්ට මේක බෙදලා දෙන්න කියලා. මන්ත්‍රීවරුන් ගිහිල්ලා තමන්ගේ ප්‍රතිපාදනවලින් පොඩි දේශපාලන කටයුත්තක් කරනවා මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට දීර්ඝ විස්තරයක් කරන්න දෙන්න අමාරුයි. ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම අහන්නේ, මෙහෙම ලිපි නිකුත් කරලා තිබෙනවාද? මන්ත්‍රීවරුන් බෙදලා නැහැයි කියලා කියනවාද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

එහෙම ලිපි නිකුත් කර නැත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මන්ත්‍රීවරුන් ගිහිල්ලා බෙදලා තිබෙනවාද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

මෙහෙමයි ආසනයක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හරහා රජයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙද්දී, ඕනෑම මන්ත්‍රීවරුයෙකුට ඒකට සහභාගී වෙන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ඕනෑම උත්සවයක්, විමධ්‍යගත හෝ පළාත් නිශ්චිත හො ප්‍රදාන හෝ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැබැයි මෙතෙක් කල් -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

මගේ පිළිතුරු ඉවර නැහැ ගරු මන්ත්‍රීතුමා. රජයේ ඕනෑම අරමුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට - ඔබතුමාගේ විමධ්‍යගත අරමුදල් කියන්න කෝ? ඔබතුමා විමධ්‍යගත අරමුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොදවලා ඒකේ උත්සවයට ඔබතුමා යනවා. ඔබතුමා විවෘත කරනවා. ඒක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. ඉතින් ආණ්ඩුවේ පළාත් සභාවේ මුදල් ගියාම උත්සවයක් තිබෙනවා නම්, ඒකට සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගී වීමේ අයිතිය තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සමහර මන්ත්‍රීවරු ප්‍රාදේශීය ලේකම්ගෙන් චෙක්පත ඉල්ලාගෙන පන්සල්වලට ගිහිල්ලා, එහෙම උත්සව තියලා නොවෙයි. තමන් පෞද්ගලිකව ගිහිල්ලා, කිසිදු නිලධාරියෙක් සම්බන්ධ වෙන්නේ නැතුව ගිහිල්ලා ලබා දීලා තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

එහෙම සිද්ධියක් නැහැ. එහෙම සිද්ධියක් වාර්තා වෙලාත් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම සිද්ධියක් නැහැයි කියනවා නම්, ඔබතුමාට මට ඒක ඔප්පු කරලා පෙන්වන්න පුළුවන්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ඔබතුමා ඔප්පු කරලා පෙන්වන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතා වගකීමෙන්. ඕනෑ නම් ඡායාරූප සහිතව පෙන්වන්න පුළුවන්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ප්‍රාදේශීය ලේකම්තුමා තමයි බස්නාහිර පළාතේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රාදේශීය ලේකම්තුමා මේවාට ගිහිල්ලාත් නැහැ ගරු ඇමැතිතුමා. ඒකයි මම කියන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ඔබතුමා ඔය කියන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා විවාදයකට යන්න දෙන්න අමාරුයි. ඔබතුමාගේ ප්‍රශ්න ඉවර නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තව එක ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, සමහර දහම් පාසල්වලින් කියනවා, අපි ලියුම් යැව්වා. තොරතුරු දැනුම් දුන්නා. නමුත් තවම ප්‍රතිචාරයක් නැහැයි කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

තමුන්නාන්සේ ඉදිරිපත් කළොත් සුදුසුකම් තිබිලා එහෙම ලැබිලා නැත්නම් අපට දෙන්න පුළුවන්. ගැටළුවක් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ඒක සොයා බලා අපි ඉදිරිපත් කරන්නම්. ස්තුතියි.

## ඩෙංගු රෝගය වැළැක්වීම : පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කිරීම
## PREVENTING DENGUE EPIDEMIC : ALLOCATING FINANCE TO LOCAL GOVERNMENT AUTHORITIES

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**02.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/14/38)**

අ. ඩෙංගු රෝගය වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කර තිබේද?

ආ. එය කොපමණ මුදලක්ද?

ඇ. එම මුදල් වැය කරමින් ක්‍රියාත්මක වැඩ සටහන් මොනවාද?

ඈ. පළාත් පාලන ආයතනවලට ප්‍රතිපාදන ලබා දීමේදී අදාළ ප්‍රදේශයේ ඩෙංගු තත්ත්වය සැලකිල්ලට ගෙන එම මුදල් වෙන් කළේද?

ඉ. අදාළ පළාත් පාලන ආයතන මුදල් වැය කළ ආකාරය සම්බන්ධයෙන් පසු විපරම් සිදු කළේද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

අ. බස්නාහිර පළාත් සභාව විසින් බස්නාහිර පළාතේ ඩෙංගු රෝගය වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කරන මුදල් ප්‍රතිපාදන යටතේ සිදු කරනු ලබන අතර, පළාත් පාලන ආයතන වෙත මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.

ආ. පැන නොනගී.

ඇ. පැන නොනගී.

ඈ. පැන නොනගී.

ඉ. පළාත් පාලන ආයතන විසින් ස්වකීය අරමුදල් යොදවමින් සිදු කරනු ලබන ඩෙංගු මර්ධන වැඩ සටහන් පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් සිදු කරයි. ඒ අනුව ඒ ඒ පළාත් පාලන ආයතන විසින් 2014 වර්ෂය සඳහා මෙතාක් වියදම් කර ඇති වියදම් පිළිබඳ වාර්තාවක් මේ සමග සභාගත කරමි.[1]

"ඇමුණුම 01

<u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන</u>
<u>2014 වර්ෂයේ ඩෙංගු මර්දන කටයුතු සඳහා</u>
<u>සභා අරමුදලින් වෙන් කරන ලද මුදල් පිළිබඳ වාර්තාව</u>

| අනු අංක | පළාත් පාලන ආයතනයේ නම | 2014 වර්ෂයේ ඩෙංගු මර්දන වැඩසටහන් වලට සභා අරමුදලින් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය | 2014 වර්ෂයේ ඩෙංගු මර්දන වැඩසටහන් වලට සභා අරමුදලින් වියදම්කර ඇති මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| | කොළඹ දිස්ත්‍රික්කය | | |
| 01 | කොළඹ ම.න.ස | 148 ,575,000.00 | 136,300,000.00 |
| 02 | දෙහිවල ගල්කිස්ස ම.න.ස | 2,500,000.00 | 880,000.00 |
| 03 | මොරටුව ම.න.ස | මුදල් වෙන් කර නැත. වෙනත් වැය ශීර්ෂ වලින් ලබා ගෙන ඇත. | 959,665.00 |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ම.න.ස | 5,765,000.00 | 3,300,000.00 |
| 05 | කඩුවෙල ම.න.ස | 2,499,000.00 | 2,046,350.00 |
| 06 | සීතාවකපුර න.ස | 300,000.00 | 179,000.00 |
| 07 | මහරගම න.ස | 4,000,000.00 | 2,300,000.00 |
| 08 | කැස්බෑව න.ස | 4,020,000.00 | 2,131,103.00 |
| 09 | කොලොන්නාව න.ස | 6,026,470.00 | 3,721,763.00 |
| 10 | බොරලැස්ගමුව න.ස | 250,000.00 | 31,077.00 |
| 11 | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස | 6,000,000.00 | 3,200,000.00 |
| 12 | හෝමාගම ප්‍රා.ස | 1,000,000.00 | 124,830.00 |
| 13 | සීතාවක ප්‍රා.ස | 700,000.00 | 281,105.05 |
| | ගම්පහ දිස්ත්‍රික්කය | | |
| 14 | මීගමුව ම.න.ස | 600,000.00 | 592,573.70 |
| 15 | ගම්පහ ම.න.ස | 2,235,000.00 | 1,000,942.00 |
| 16 | මිනුවන්ගොඩ න.ස | 3,057,000.00 | 15,797.30 |
| 17 | ජා ඇල න.ස | 2,245,000.00 | 592,794.00 |
| 18 | වත්තල මාබෝල න.ස | 1,500,000.00 | 799,955.89 |
| 19 | පෑලියගොඩ න.ස | මුදල් වෙන් කර නැත වෙනත් වැය ශීර්ෂ වලින් ලබා ගෙන ඇත. | 66,334.00 |
| 20 | කටුනායක සීදූව න.ස | මුදල් වෙන් කර නැත වෙනත් වැය ශීර්ෂ වලින් ලබා ගෙන ඇත. | 1,770,934.00 |
| 21 | ජා ඇල ප්‍රා.ස | 1,440,000.00 | 1,554,384.00 |
| 22 | මීරිගම ප්‍රා.ස | 1,863,000.00 | 147,221.00 |
| 23 | මහර ප්‍රා.ස | 4,5000,000.00 | 2,279,600.00 |
| 24 | මිනුවන්ගොඩ ප්‍රා.ස | 1,000,000.00 | 660,200.00 |
| 25 | කටාන ප්‍රා.ස | 4,340,000.00 | 1,083,678.51 |
| 26 | දිවුලපිටිය ප්‍රා.ස | 50,000.00 | 299,100.50 |
| 27 | දොම්පෙ ප්‍රා.ස | 179,000.00 | 76,187.70 |
| 28 | ගම්පහ ප්‍රා.ස | 2,300,000.00 | 108,275.00 |
| 29 | අත්තනගල්ල ප්‍රා.ස | 988,000.00 | 968,316.00 |
| 30 | කැලණිය ප්‍රා.ස | 3,895,000.00 | 3,956,184.00 |
| 31 | වත්තල ප්‍රා.ස | 1,542,000.00 | 9,259,145.00 |
| 32 | බියගම ප්‍රා.ස | 3,000,000.00 | 404,937.02 |
| | කළුතර දිස්ත්‍රික්කය | | |
| 33 | කළුතර න.ස | 623,000.00 | 227,970.00 |
| 34 | පානදුර න.ස | 142,000.00 | 52,435.00 |
| 35 | බේරුවල න.ස | 300,000.00 | 41,304.10 |
| 36 | හොරණ න.ස | 610,000.00 | 421,300.00 |
| 37 | පානදුර ප්‍රා.ස | 50,000.00 | 122,226.00 |
| 38 | කළුතර ප්‍රා.ස | මුදල් වෙන් කර නැත වෙනත් වැය ශීර්ෂ වලින් ලබා ගෙන ඇත. | 27,395.20 |
| 39 | බේරුවල ප්‍රා.ස | 6,200,000.00 | 2,017,345.00 |
| 40 | දොඩංගොඩ ප්‍රා.ස | 50,000.00 | 14,198.00 |
| 41 | අගලවත්ත ප්‍රා.ස | 138,000.00 | 18,918.00 |
| 42 | බණ්ඩාරගම ප්‍රා.ස | 25,000.00 | 20,496.00 |
| 43 | හොරණ ප්‍රා.ස | 165,000.00 | 43,300.00 |
| 44 | මතුගම ප්‍රා.ස | 160,000.00 | 90,483.00 |
| 45 | බුලත්සිංහල ප්‍රා.ස | 100,000.00 | 33,375.40 |
| 46 | වලල්ලාවිට ප්‍රා.ස | 384,000.00 | 41,119.00 |
| 47 | පාලින්දනුවර ප්‍රා.ස | 600,000.00 | 333,800.00 |
| 48 | මදුරාවල ප්‍රා.ස | 325,000.00 | 137,987.74 |

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අපි මේ ඩෙංගු රෝගය ගැන දිගින් දිගටම මේ සභාවේදීත් සාකච්ඡා කළා. ඒ වෙලාවේදී කියැවුණු කාරණයක් තමයි පළාත් සභාව හැටියට මේකට මැදිහත් වෙලා යම් ක්‍රියාකාරකම් සිද්ධ කරනවා කියන එක. ඒ පදනම උඩ තමයි ගරු සභාපතිතුමනි මම ඇහුවේ, මේකට මුදල් වෙන් කර තිබේද කියලා. එහෙම මුදල් වෙන් කරලා නැත්නම්, ඒ කියන්නේ පළාත් සභාවේ මැදිහත් වීමක් මේකට වෙලා නැහැයි කියන එකයි.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

මැදිහත් වීමක් නැහැයි කියන එක නොවෙයි කියන්නේ. පළාත් සභාව පසු විපරම් කිරීම කරනවා. ඊළඟට ප්‍රාදේශීය සභාවලට, පළාත් පාලන ආයතනවලට තමන්ගේ ඩෙංගු ව්‍යාප්තිය අවම කර ගැනීම සඳහා අවශ්‍ය සේවකයන් බඳවා ගැනීම, සේවකයන්ට පඩිනඩි ගෙවීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලුවාම, ඒ සඳහා සියලු අනුමැතිය බස්නාහිර පළාත් සභාව ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඩෙංගු ව්‍යාප්තිය සඳහා මූල්‍යමය වශයෙන් සක්‍රිය දායකත්වය නොදැක්කුවත්, මේවා සඳහා සක්‍රීය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දීම, ඒ සඳහා අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම, ප්‍රතිපාදනවලට අවශ්‍ය වියදම් කිරීමේ බලය ලබා ගන්න ගියාම ඒකට අවශ්‍ය අනුමැතිය ලබා දීම මේ සියල්ලක් බස්නාහිර පළාත් සභාව විසින් කරලා තිබෙනවා. ඒත් එක්කම පසුගිය කාලය තුළ සියලුම සභාපතිවරු ගෙන්නලා, සියලුම PHI මහත්වරු ගෙන්නලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහ ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් දීර්ඝව සාකච්ඡා කළා. ඒත් එක්කම සෞඛ්‍ය ඇමැතිතුමාත් විශේෂයෙන්ම මේ පිළිබඳව මැදිහත් වෙලා, මේ සම්බන්ධව රෝහලක් රෝහලක් ගානේ ගිහිල්ලා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවක් ගානේ ගිහිල්ලා මේ කටයුත්ත කරන්න කියලා උපදෙස් ලබා දීලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ කියන්නේ, මේ සඳහා පළාත් සභාවෙන් කිසිදු මුදලක් වෙන් කළේ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ප්‍රාදේශීය සභාව නේ ආයතනය. ප්‍රාදේශීය සභාවට මුදල් තිබෙනවා. ඉතින් ප්‍රාදේශීය සභාව, නගර සභාව, පළාත් පාලන ආයතන මේකට මුදල් වෙන් කරලා තිබෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මගේ ගෞරවයත්, ස්තූතියත් ඔබතුමාට පුද කරන්න කැමැතියි. පසුගිය ඌව මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ජයග්‍රාහී මාවතකට යොමු කරන්න, ඌවේ ජනතාව අප වෙත ලබා දීපු තීන්දුව පිළිබඳව අපේ ගෞරවයත්, ස්තූතියත් ඌවේ ජනතාව වෙත පිරිනැමීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගන්න කැමැතියි. විශේෂයෙන්ම පසුගිය ඌවේ මැතිවරණයට රජයේ සියලුම සම්පත් භාවිතා කරමින්, රජයේ සියලු වරප්‍රසාද, වරදාන ලබා දෙමින් ජනාධිපතිවරයා පවා විවිධ විවෘත කිරීම්, උත්සවවලට, සැණකෙළිවලට සම්බන්ධ වෙමින් සියලුම රාජ්‍ය ආයතනවල විවිධ සංදර්ශන, සැණකෙළි පවත්වමින් ඌව මැතිවරණය ජයග්‍රහණය කරන්නට තමන්ට කරන්න පුළුවන් උපරිම බලය යෙදවූවා කියන එක අපි දන්න කාරණයක්. ඒ මත, එක්සත් ජාතික පක්ෂය හැටියට මේ මැතිවරණ ප්‍රතිඵල දිහා බැලුවාම, අපට සන්තෝෂ වෙන්න පුළුවන් තැනක අපි අද ඉන්නවා. ජනතාව තේරුම් අරගෙන තිබෙනවා, ආණ්ඩුවට විරුද්ධව පෙළ ගැසිලා, ඒ බලය, විකල්ප බලය විධියට එක්සත් ජාතික පක්ෂයට ලබා දිය යුතුයි කියලා. ඒ නිසා අපි මතක් කරන්න කැමැතියි. 2009 අපි ගත්තු ඡන්ද ප්‍රමාණයට වැඩිය, මුළු ඌවේම 19% ක ඡන්ද ප්‍රමාණයක් ආණ්ඩුවට අහිමි කරලා තිබෙනවා. ඒ 19% ඡන්ද ප්‍රමාණය එක්සත් ජාතික පක්ෂයට ලබලා දීලා තිබෙනවා. ඒ වාගේම මන්ත්‍රී ධූර 06 ක් ආණ්ඩුවට අහිමි කරලා, ඒ මන්ත්‍රී ධූර 06 එක්සත් ජාතික පක්ෂයට ලබලා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි 2009 ට වඩා 95% ක් බදුල්ලේ ඡන්ද ප්‍රමාණය අපට වැඩි කරලා තිබෙනවා. සමහර අය කියනවා මොණරාගල දිස්ත්‍රික්කයේ අපට ලැබුණු ඡන්ද ප්‍රමාණය අඩුයි කියලා. 95% ක්

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

බදුල්ලෙන් ලැබෙද්දී 110% ක් මොණරාගල දිස්ත්‍රික්කයෙන් ලැබිලා තිබෙනවා. 2009 ට වැඩියි. හේතුව තමයි 2009 පළාත් සභා මැතිවරණයේදී අපි ගත්තේ ඡන්ද 30,000 යි. මන්ත්‍රී ධූර 02 යි ලැබුණේ. හැබැයි, මේ මැතිවරණයේදී මන්ත්‍රී ධූර 05 ක් ලැබුණා. මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාව අපේ පක්ෂයට 76,000 ක් ඡන්දය පාවිච්චි කරලා තිබෙනවා කියන එක මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මේ ආණ්ඩුව, ආණ්ඩුවේ සම්පූර්ණ වෙර යොදමින්, ආණ්ඩුවේ සම්පූර්ණ බලය යොදමින් මේ ජයග්‍රහණය කරන්න ගත්තු උත්සාහයේදී එක්සත් ජාතික පක්ෂයට කොළ එළියක් වාගේම ආණ්ඩුවට රතු එළියක් දල්වලා තිබෙනවා. මෙපමණ කල් බොරු කළා. මිනිස්සු රැවැට්ටුවා. අද පෙළ ගැහෙමින් දවසින් දවස එක්සත් ජාතික පක්ෂය වටා මිනිසුන් එකතු වෙනවා. ඒ නිසා ග්‍රාමීය මට්ටමේ ජනයා ආකර්ෂණය කර ගන්න බැරි පක්ෂයක්, ග්‍රාමීය මට්ටමේ මිනිස්සු එකතු කර ගන්න බැරි පක්ෂයක් විධියට තීන්දු තීරණ කළාට, බස්නාහිර බැලුවාම, දකුණ බැලුවාම ඒ පසුගිය මැතිවරණවලදී දවසින් දවස එක්සත් ජාතික පක්ෂය, අපි ජනයා අතර ජනප්‍රිය වෙමින්, ජයග්‍රාහී මාවතකට පත් වෙමින් ඒ හැරවුම් සන්ධිස්ථානය විධියට ඌව මැතිවරණය ජනයා පාවිච්චි කරලා දුන්නාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඒ කොයි තරම් මේ මැතිවරණය අපට ශක්තියක් වුණාද කිව්වොත්, අද පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ඉතාම තදින්, දරුණු විධියට ක්‍රියාත්මක වෙනවා. අනෙක් පැත්තෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ අවසාන සතියේ නියං සහනාධාරය සඳහා ආණ්ඩුව රුපියල් 2500/- ක් ලබා දෙන්න උත්සාහ කරද්දී, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒක තහනම් කළා. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තීන්දුවක් ගත්තා, ඒ රුපියල් 2500/- මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දෙන්න. නැවත, පැෆරල් සංවිධානය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. දිස්ත්‍රික්ක අටක නියං තිබෙනවා. ඒ දිස්ත්‍රික අටේම මිනිස්සුන්ට අසීරුකම්, අමාරුකම් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම වැඩි ජනතාවක් ඉන්න, වැඩි වශයෙන් නියඟයකට පත් වෙලා ඉන්න හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළු අනෙක් දිස්ත්‍රික්කවලටත් මේ ලබා දීපු නියං සහනාධාරය ලබා දිය යුතුයි කියලා පැෆරල් සංවිධානය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. නමුත් මොණරාගලට දීපු තීන්දුව ලැබුණේ නැහැ. ඒ මෝෂම දින නියමයක් නැතුව කල් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, ආණ්ඩුව අධිකරණය විසින් ලබා දීපු වරප්‍රසාදයත් පාවිච්චි කරලා, මොණරාගල ජනතාවට අවසාන සතියේ නියං සහනාධාරයක් නොවෙයි, ඡන්ද සහනාධාරයක් දුන්නත් ආණ්ඩුව බලාපොරොත්තු වුණු ප්‍රතිඵලයට එන්න බැරි වුණා විතරක් නොවෙයි, මහ රාජපක්ෂ මහත්තයා වාගේම පොඩි රාජපක්ෂ මහත්තයාටත් ඡන්ද 50,000 කට වඩා අඩු මනාප ප්‍රමාණයක් ලබලා දීලා, මොණරාගලින් අප්‍රසාදය පළ කළාය කියන එක විතරක් අපි මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මේ අවස්ථාවේදී ආණ්ඩුවට යම් ප්‍රහාරයක් එල්ල කරමින්, මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ වැරැදියි කියන එක මේ අවස්ථාවේ මතක් කර දීම පිළිබඳව අපි මොණරාගල ජනතාවට, බදුල්ලේ ජනතාවට එක්සත් ජාතික පක්ෂය විධියට අපේ කෘතවේදීත්වය පළ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතියි. විශේෂයෙන්ම මේ මාසයක කාලයක් තුළදී ඌව පළාත් සභා මැතිවරණයේදී අපට දකින්නට ලැබුණු -විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. මේ ආණ්ඩුවේ සියලුම මන්ත්‍රීවරුන්, රාජපක්ෂ පරම්පරාවත්, සියලුම ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරුත් ගිහිල්ලා (බාධා කිරීම්) මම හිතන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේත්, මොණරාගල දිස්ත්‍රික්කයේත් මේ මැතිවරණයට නොකරපු දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මට ඒ වාගේම කාලය ලබා දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

අයිතියක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා වාඩි වෙන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය මන්ත්‍රීතුමා කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. එතුමාට බොහොම පුංචි කාලයක් තිබෙන්නේ. එතුමාට විනාඩි 03 යි තිබෙන්නේ. එතුමාට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බොහොම ස්තුතියි. අපි කවුරුත් දන්නවා, මේ මැතිවරණයෙන් බේරා ගන්න මේ ආණ්ඩුව නොකරපු දෙයක් නැහැ. බෙදපු නැති දෙයක් නැහැ. නමුත් අද මේ මැතිවරණ ප්‍රතිඵල දිහා බලනකොට බදුල්ල දිස්ත්‍රික්කය පමණක් ගත්තාම අපට ඡන්ද ලක්ෂයක් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මොණරාගල දිස්ත්‍රික්කය ගත්තාම ඡන්ද 46,000 ක් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් අපට වැඩි වෙලා තිබෙනවා. ඉතින් මේ අවස්ථාවේදී මේ ජයග්‍රහණයට පාර්ලිමේන්තුව නියෝජනය කරපු අපේ හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, මම හිතන්නේ එතුමාගේ සියලුම පාර්ලිමේන්තු වරප්‍රසාද අහිමි කරගෙන, මේ රට වෙනුවෙන්, එක්සත් ජාතික පක්ෂයට කරපු කැපවීම අපි හැමෝම අගය කළ යුතුයි. ඒ විතරක් නොවෙයි. සැප්තැම්බර් 06 වැනිදා අපි කවුරුත් බලාපොරොත්තු වුණු ආකාරයට අපේ පක්ෂයේ සංවත්සරය දිනයේදී එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් වෙන්න, එක්සත් ජාතික පක්ෂය පමණක් නොවෙයි, මුළු රටම බලාපොරොත්තු වුණු ඒ වෙනස, එකමුතුව අපේ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ඒ වාගේම අද එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක වන සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ සියලුම දෙනා එකතු වෙලා එක්සත් ජාතික පක්ෂය ජයග්‍රාහී මාවතට ගෙනිහිල්ලා තිබෙනවා. අලුතෙන් පත් වන නියෝජ්‍ය නායකතුමාටත් අපේ සුභ පැතුම් එකතු කරන්නට ඕනෑ. හැබැයි, මේ ජයග්‍රහණය ඉවසා ගන්න බැරුව අද ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කල්පනා කරලා බලන්න. පශ්චාත් මැතිවරණ කාලසීමාවේදී අපේ අපේක්ෂකයින්ට, අපේ මහ ඇමැති අපේක්ෂකතුමාට ඒ විතරක් නොවෙයි, නිවාසවලට, කාර්යාලවලට, අපේ පාක්ෂිකයන්ට විශාල වශයෙන් හානි සිදු වෙලා තිබෙනවා. තර්ජන එකතු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අද ජීවිත හානිවලටත් පත් වෙලා තිබෙනවා. ඉතින් මම ඉල්ලීමක් කරනවා. අද පොලීසියේ නිලධාරීන්ට, මැතිවරණ කොමසාරිස්තුමාට බලය තිබෙනවා, මැතිවරණය අවසන් වෙලා තවත් සතියක කාලයක් කටයුතු කරන්න. මේ කාලසීමාවේදී අපේ පාක්ෂිකයන්ට සාධාරණයක් ඉටු වෙන්න, අපේ පාක්ෂිකයන්ව රැක ගන්න මේ පොලීසිය, ඒ වාගේම මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ සියලුම නිලධාරීන් - මේ ජයග්‍රහණය ඉවසා ගන්න බැරුව, මේ ජයග්‍රහණය බලාගෙන ඉන්න බැරුව අද මොණරාගලදී ඇති වෙලා තිබෙන තත්ත්වයත්, බදුල්ලේදී ඇති වෙලා තිබෙන තත්ත්වයත් -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කොහේද ජයග්‍රහණයක් තියෙන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

විශේෂයෙන්ම හාලිඇළ ප්‍රදේශයේ, මොණරාගල අපේ රෝයි අපේක්ෂකතුමා ඇතුළු සියලුම අපේක්ෂකයින්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඇති වෙලා තිබෙන හානියෙන් ආරක්ෂා කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, මගේ මංගල කථාවේදී ඌව පළාත් සභා මැතිවරණයේ ජයග්‍රහණය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධව මම ඉතාමත් සතුටට පත් වෙනවා. විශේෂයෙන්ම මාව පළාත් සභා මැතිවරණයෙන් ජයග්‍රහණය කරවන්න මහර ආසනයේ ජනතාව ලබා දුන් සහයෝගයට, දායකත්වයට මගේ කෘතවේදීත්වය මේ අවස්ථාවේදී පළ කරනවා. ඒ වාගේම ගම්පහ

[ගරු සහන් ප්‍රදීප් විතාන]

දිස්ත්‍රික්කයේ ජනතාව ඒ ලබා දුන්නු සහයෝගයට මගේ කෘතවේදීත්වය මේ අවස්ථාවේදී පළ කරනවා. ඒ වාගේම මගේ මිතුරන් ඇතුළු සහෝදර සියලු දෙනා, පළාත් පාලන ආයතන ප්‍රධානීන්, මන්ත්‍රීවරුන් ඇතුළු සියලු දෙනාටත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම අපි වාගේ සාමාන්‍ය පවුල්වල අයට මේ වාගේ ජයග්‍රහණ ලබා දේශපාලනයට ගෙන එන්න නායකත්වය ලබා දුන්නු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මගේ ස්තුතිය, ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික් නායක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත්, ලසන්ත අලගියවන්න ගරු ඇමැතිතුමාටත්, මාව දේශපාලනයට ගෙන ආපු අතුල නිමලසිරි ජයසිංහ හිටපු ගරු ඇමැතිතුමාට මගේ ස්තුතිය, ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම ඌව පළාත් සභා මැතිවරණයේදී අතිවිශිෂ්ට ජයග්‍රහණයක් එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දුන්නු ඌවේ ජනතාවට -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

19% ක් අඩු වුණා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඌවේ ජනතාවට අපේ ස්තුතිය ගෞරවය ආණ්ඩු පක්ෂයේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

19% ක් අඩු වෙලා ජයග්‍රහණය ආවේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

බස්නාහිර පළාතේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපේ ගෞරවය, ස්තුතිය ඒ ජනතාවට පුද කරනවා. ඌවේ ජනතාව අද මේ අතිවිශිෂ්ට ජයග්‍රහණය ලබා දුන්නේ අද ගැන හිතලා නොවෙයි. හෙට දවසේ උපදින දරුවන්ගේ අනාගතය ගැන හිතලා. සන්ධානයට, ආණ්ඩුවට, අතිගරු ජනාධිපතිතුමාට ඌවේ ජයග්‍රහණය ඒ ජනතාව ලබා දුන්නා. ඒ ජයග්‍රහණය මම දකින්නේ හෙට දවසේ මේ මහ සංවර්ධනය ඌවට ගෙන යන්න ලබා දීපු ජයග්‍රහණයක් හැටියටයි. මෙතුමන්ලා 2009 මැතිවරණය පිළිබඳව කථා කරනවා. ඒක සුවිශේෂී වූ මැතිවරණයක්. යුද්ධ ජයග්‍රහණයත් එක්ක එක්සත් ජාතික පක්ෂය යුද්ධය කරන්නේ නැහැයි කියලා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අනේ පරාජය පිළිගන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඒ ජනතාවගේ හිත් බිදලා පවත්වපු මැතිවරණයේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඉතාම පුංචි කාලයක් තිබෙන්නේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මම හිතන්නේ ඒ විශිෂ්ට ජයග්‍රහණය 2009 දී අපට ලැබුණා. නමුත් 2010 මහ මැතිවරණයත් එක්ක අපි බලමු. 2010 මහ මැතිවරණයේදී ලබා ගත්තු ඡන්ද ප්‍රමාණයට වඩා අපි වැඩි ඡන්ද ප්‍රමාණයක් බදුල්ල දිස්ත්‍රික්කයෙනුත්, මොණරාගල දිස්ත්‍රික්කයෙනුත් එක්සත් ජනතා නිදහස් සන්ධානය මේ මැතිවරණයේදී ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

විහිළු කරනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඒ වාගේම 2011 පළාත් පාලන මැතිවරණයේදී ලබා ගත්තු ඡන්ද ප්‍රමාණයට වඩා බදුල්ල දිස්ත්‍රික්කයේත්, මොණරාගල දිස්ත්‍රික්කයේත් වැඩි ඡන්ද ප්‍රමාණයක් මේ මැතිවරණයේදී අපි සන්ධානය හැටියට ලබා ගෙන තිබෙනවා. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් ඒ සියලු තොරතුරු, මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත්තු සියලු තොරතුරු මා ළඟ තිබෙනවා. තමුන්නාන්සේලා එන්න. ඇවිල්ලා බලන්න. මේ සියලු තොරතුරුත් එක්කයි අපි කථා කරන්නේ. ඒ නිසා 2010, 2011 මැතිවරණවලදී ලබා ගත්තු ඡන්දවලට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් අද සන්ධානයට - ජනාධිපතිතුමා කෙරෙහි විශ්වාසය තබලා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

බොරු කියන්න එපා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තියලා, ඌවේ ජනතාව ලබා දීලා තිබෙනවා කියන එක අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. බොහොම පුංචි කාලයක් තිබෙන්නේ. බාධා කිරීම් කරන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමා බොරු කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොරු හරි, ඇත්ත හරි ඔබතුමාලාත් ඒ ටික කියන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

තමුන්නාන්සේලා අද කොහොම කථා කළත් ඒ ඓතිහාසික ජයග්‍රහණය අද අපි ලබාගෙන තිබෙන්නේ, එදා ඡන්ද 181,000 කින් මේ රටේ ජනාධිපති ධූරයට පත් වුණු අපේ අතිගරු ජනාධිපතිතුමා. 2/3 පාර්ලිමේන්තු බලය ලබාගෙන මේ රට සංවර්ධනය කරලා, බිළින්දාගේ ඉඳලා සෑම පුරවැසියෙකුගේම හිත් දිනාගෙන කටයුතු කළා වාගේ මේ මැතිවරණයේදීත් ඡන්ද 75,000 කින් ජයග්‍රහණය කළා. අපේ ජනාධිපතිතුමා, අපේ ආණ්ඩුව, සන්ධානය කළ හැකි සෑම සත්කාරයක්ම ඌවේ ජනතාවට ඉටු කරන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම බටහිර පරගැති චින්තනය පසුපස හඹා යන එක්සත් ජාතික පක්ෂය අද පරාජයට පත් කරන්නට අපේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

විහිළු කරනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඌව වෙල්ලස්ස ජනතාව කටයුතු කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. එතුමාට තව විනාඩි 02 යි තිබෙන්නේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

එදා කැප්පෙට්ටිපොළ දිසාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත වාදයට විරුද්ධව ඌව වෙල්ලස්ස කැරැල්ල ඇති කරලා ඒ අභිමානයත්, ගෞරවයත් එක්ක කටයුතු කරන, ඒ ලේ ඇගේ තිබෙන අපේ ඌව වෙල්ලස්ස ජනතාව මේ මැතිවරණයේදී තමන්ගේ රට වෙනුවෙන් තමන්ගේ යුතුකම ඉටු කරමින් සන්ධානයට ඡන්දය දීලා, අපේ ජනාධිපතිතුමාට ඌව වෙල්ලස්ස භාර දීලා තිබෙනවා, මේ සංවර්ධනය ඇති කිරීම සඳහා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ ඓතිහාසික ජයග්‍රහණය අද අපට ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි ඒ ජයග්‍රහණයත් එක්ක හෙට දවසේ ඓතිහාසික සංවර්ධනයක් තුළින් මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් වනකොට ඒ විජයග්‍රහණය ඌව වෙල්ලස්ස ජනතාවට ලබා දෙන්නට කටයුතු කරන්න සියලු දෙනා සූදානමින් ඉන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ ජයග්‍රහණය පිළිබඳව, අද මොන විධියට තමුන්නාන්සේලා උදම් ඇනුවත්, ඒ විජයග්‍රහණය ලබලා තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයයි.

[සභාවේ ඝෝෂා]

ඒ නිසා එම ජයග්‍රහණය තමුන්නාන්සේලාට අවතක්සේරු කරන්න පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේලා මගේ මංගල කථාවට මෙපමණ ප්‍රතිචාර දක්වන එක ගැන මම සතුටු වෙනවා. මගේ මංගල කථාවට ප්‍රතිචාර දක්වන එක පිළිබඳව මම සතුටු වෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි. තමුන්නාන්සේලා මතක තියා ගන්න ඕනෑ, තරගයක් කියලා කියන්නේ එක ලකුණකින් හරි පරාද නම් පරාදයි. එක නිමේෂයකින් හරි පරාද නම් පරාදයි. වැඩි ඡන්ද 75,000 කින් දිනුවා. මේ තරගය ජයග්‍රහණය කරලා - (බාධා කිරීමක්) ජය ගත්තේ සන්ධානය කියලා කියන්නට ඕනෑ. ඒ වාගේ අපි එක්සත් ජාතික පක්ෂයට කියනවා මඩ ගැන විතරයි කිව්වේ. ඌව දිනවන්න වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසා අද -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමා එන්න අපේ පැත්තට.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

නායකයා පාර්ලිමේන්තුවෙන් අස් කරලා, ඌවට යැව්වේ ඒ ජයග්‍රහණය බලාපොරොත්තුවෙන්. නමුත් අතිවිශිෂ්ට පරාජයකට පත් වුණා. අපි පැහැදිලිව කියනවා. හෙට දවසේ අපේ ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක පාර්ලිමේන්තුවෙන් අස් වෙලා පළාත් සභාවට ඉල්ලන්න නොවෙයි, හෙට දවසේ පළාත් පාලන මැතිවරණවලටත් එක්සත් ජාතික පක්ෂයේ අයට අස් වෙලා තරග කරන්න වෙයි, අපේ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ නිසා. ඒ නිසා පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ ජනතා විමුක්ති පෙරමුණත් පැහැදිලිවම කළේ මඩ ගහපු එක විතරයි. නියඟය විකුණාගෙන කෑවා .

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද කෑවේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

නමුත් අවසානයේ ජයග්‍රහණය ලබා දුන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

නියඟය විකුණාගෙන කෑවේ ඔයගොල්ලෝ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ ඌව වෙල්ලස්ස ජනතාව එක්සත් ජාතික පක්ෂයටත්, ජනතා විමුක්ති පෙරමුණටත් අන්ත පරාජයක් ලබා දීලා, එක්සත් ජනතා නිදහස් සන්ධානයට, ජනාධිපතිතුමාට, අපේ ආණ්ඩුවට අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා දුන්නා කියන එක මතක් කරන්න ඕනෑ. ස්තුතියි.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, ඓතිහාසික ඌව වෙල්ලස්ස පුරවරයේ ජනතාව පක්ෂ විපක්ෂ අපි දෙපාර්ශවයටම හිතට දැනෙන දේශපාලන තීන්දුවක් ලබා දීලා තිබෙන අවස්ථාවක මුළු රටේ බහුතර ජනතාවගේ කුසට දැනෙන ගැටළුවක් පිළිබඳව මේ සභාවේ අවධානයට යොමු කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මාගේ ස්තූතිය ප්‍රථමයෙන් පුද කර සිටිනවා. ගරු සභාපතිතුමනි, මේ වනවිට රටේ පවතින බහුතරයක් 90% කට වඩා ජනතාව තමන්ගේ ප්‍රධාන ආහාරය වන බත සරි කර ගන්නට සහල් ලබා ගැනීමේදී වෙළඳ පොළේ මුහුණ දෙන ප්‍රායෝගික ගැටළුව, දුෂ්කරතාවය සහ අර්බුදය පිළිබඳව මේ සභාවේ අවධානයට යොමු විය යුතු යැයි මම පෞද්ගලිකව විශ්වාස කරනවා. මේ සහල් මිල පිළිබඳව අද පවතින අර්බුදයට පසුගිය මාස කිහිපයක් පුරාවට රටේ ජනාධිපතිවරයා ඇතුළු අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරයා, නිලධාරීන් මේ වනවිට අවධානය යොමු කළත්, මේ රටේ දුප්පත් පාරිභෝගිකයාට අවශ්‍ය සහනය ලබා දෙන්නට මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේදී මම සිහිපත් කර සිටිනවා.

අපි පිළිගන්නවා, මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි, මෙතැන ඉන්න පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන් වැඩි පිරිසක් ප්‍රධාන ආහාරය වශයෙන් ගන්නේ බත් කියන එක. එහෙම නම් මේ වනවිට පාලන මිලක් ක්‍රියාත්මක වෙනවා. සහල් සඳහා පාලන මිලක් ක්‍රියාත්මක වෙනවා. සම්බා, නාඩු, කැකුළු ඇතුළු සෑම සහල් වර්ගයක්ම පාලන මිලට වඩා රුපියල් 10, 20 ත් අතර වැඩි මිලක් ගෙවලා තමයි පාරිභෝගිකයාට මේ සහල් මිලදී ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වනවිට අද පාලන මිලට සහල් විකුණා ගන්න බැරුව සහල් විකුණන සිල්ලර වෙළෙන්දා ඉතාමත්ම අපහසුතාවයට, දුෂ්කරතාවයට, බරපතළ ගැටළුවලට මුහුණ දෙනවා ගරු සභාපතිතුමනි. මෙතැන ඉන්න සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ගමේ ඉන්න සිල්ලර වෙළෙන්දන්ගෙන් ඇහුවොත් සහල් විකුණන්නේ කොහොමද කියලා, මොනතරම් භයකින්ද, තිගැස්මකින්ද ඒ සහල් වෙළෙන්දා තමන්ගේ වෙළඳාම කරන්නේ කියන එක අද පසක් වෙනවා, සහතික වෙනවා ගරු සභාපතිතුමනි. ගමේ ඉන්න කසිප්පුකාරයා, ගමේ ඉන්න ගංජා විකුණන ගංජා වෙළෙන්දා තමන්ගේ නීති විරෝධී වෙළඳාම කරනවා

හා සමානව තමයි ගමේ ඉන්න සිල්ලර කඩේ මුදලාලිටත් සහල් විකුණනන්න වෙලා තිබෙන්නේ. මොකද, පාලන මිලට වඩා වැඩියෙන් තමයි අද වෙළඳ පොළේ සහල් විකුණන්න වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ රටේ තිබෙන පළාත් සභාවලින් ප්‍රධානම පළාත් සභාව වන බස්නාහිර පළාත් සභාවේ අවධානයට යොමු කර, මේ පිළිබඳව සහනදායී තීන්දුවක් ගැනීමට මධ්‍යම රජයට බල කර සිටිය යුතු යැයි මා විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, මේ රටේ සිටින බහුතර ජනතාව හැම් බේකන්, එහෙම නැත්නම් චීස්, බටර්, පැස්ටා, මැකරෝනි, පීට්සා, ලසංඤඤා කන අය නොවෙයි. තුන් වේලට යම්තම් නිවිඩු සහල් වේලක් සරි කර ගන්නට, තුන් වේල කන්න බැරුව එක් වේලක් හෝ සරි කර ගන්න දුක් විඳින ජනතාවක් සිටින සමාජයක්. වසර 1 ½ කට අධික කාලයක් මේ රටේ පාලන මිලට සහල් විකුණා ගන්න බැරුව, ඒ පාලන මිලට වෙළඳ පොළේ සහල් මිල ගෙන එන්නට මේ රජය අපොහොසත් වෙලා තිබෙන මොහොතක, මේ පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කළ යුතු යැයි මා විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම පූර්ණ බලැති විධායකයක් පවතින, 2/3 කට වඩා වැඩි බහුතර බලයක් සමග ව්‍යවස්ථාදායකයක් පවතින රටක පළාත් සභා 09 න් පළාත් සභා 08 ක බලය පවතින, පළාත් පාලන ආයතනවලින් 90% ක බලයක් පවතින මේ රජයට ගැසට් කරලා තිබෙන පාලන මිලට සහල් ලබා දෙන්න බැරි නම් ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව මේ පළාත් සභාවේ අවධානය යොමු කළ යුතුයි කියන එක මා විශ්වාස කරනවා. මා විශේෂයෙන්ම අදහස් කරනවා, පසුගිය වසර දහය, පහළොවට වඩා වෙනසක් සිදු වෙමින් මේ රටේ ජනතාව වැඩිපුර බත් ආහාරයට ගන්නා බවට මේ වනවිට අපට සාක්ෂි ලැබෙමින් පවතිනවා. ඒකට හොඳම උදාහරණය තමයි ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ ඌව පළාත් සභාවේ මැතිවරණ ප්‍රතිඵලය කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. බත් කන මිනිසුන් ප්‍රමාණය වැඩි වෙමින් සිටිනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ අවධානය මේ අවස්ථාවේදී යොමු කරමින් මේ දුප්පත් මනුස්සයාගේ ප්‍රධාන ආහාරයට සහනයක් ලබා දෙන්නට මේ සභාවේ ක්‍රියාකාරී මැදිහත්වීම සිදු කරන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, මම ඉතාම සතුටු වෙනවා ආණ්ඩු පක්ෂය වෙනුවෙන් උතුරු පළාත් සභා මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඌව.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඌව පළාත් සභා මැතිවරණයේදී (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගියෙත් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

උතුර කියලා කිව්වේ. ගරු සභාපතිතුමනි, යම්කිසි පුද්ගලයෙකුට වචනයක් එහා මෙහා වෙන්න පුළුවන්. ඉතින් අල්ල ගන්න දෙයක් නැති වුණාම ඒක හරි අල්ල ගන්න සිද්ධ වෙනවා. විපක්ෂ නායකතුමාගෙන් පටන් ගත්තාම මේ හැම කෙනාම කථා කරන දේවල් මම අහගෙන හිටියා. සභානායකවරයා වශයෙන් වුණත් සියලු දෙනාම පිළිගන්න දේවල් ටිකක් මම කියන්න හදන්නේ. අපි දන්නවා, මේ මැතිවරණය වෙලාවේදී තමුන්නාන්සේලාගේ පක්ෂයේ නියෝජ්‍ය නායකකම දෙන්න ඒ වාගේම සියලු දෙනාම ඒකරාශී කරගෙන තමුන්නාන්සේලාගේ රැස්වීම තිබ්බේ කොහේද? පස්සර මැතිවරණ කොට්ඨාශයේ. බොහොම ෆයිට් එකක් තියෙන ආසනයක් කියලා මමත් පෞද්ගලිකව හිතුවා. සියලු බලතල යෙදුවා. නමුත් පස්සර ආසනය ඡන්ද 7000 කින් පරාදයි.

[සභාවේ සෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

තොණ්ඩමන් ඔයගොල්ලොත් එක්ක නේ?

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඡන්ද 7000 කින් පරාද වුණා. ගරු සභාපතිතුමනි, මගේ කථාව කරන්න දෙන්න. ඇයි මේවා කියනකොට කනගාටු වෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙමළ අය ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඡන්ද 7000 කින් පරාදයි. දෙමළ, සිංහල, මුස්ලිම් කියලා මෙතැන ප්‍රශ්නයක් නැහැ. ඡන්දදායකයා ඡන්දදායකයාමයි. එහෙම කථා කරන්න එපා. එතකොට දෙමළ ජනතාව ඡන්දදායකයන් නොවෙයිද? එහෙම නම් මුස්ලිම් ජාතිකයන් ඡන්දදායකයන් නොවෙයිද? එහෙම නම් තමුන්නාන්සේලා කොළඹ දිස්ත්‍රික්කයේ ජයග්‍රහණය ගැන කථා කරන්න එපා. (බාධා කිරීම්) ඉන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඇයි නිමල් සිරිපාල ඇමැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට නැවත වරක් කියනවා. කරුණාකරලා ඔය වැඩේ කරන්න එපා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මේ අහන්න. මහ ලොකුවට රටම හොල්ලලා, පස්සර ආසනයට ගිහිල්ලා රැස්වීම තියලා, මහ බලපෑම් කරලා මේ රටේ තිබුණු සියලුම රාජ්‍ය නොවන සංවිධාන හිටියේ එක්සත් ජාතික පක්ෂයේ ස්ටේජ් එකේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

රාජ්‍ය සංවිධාන ආණ්ඩුවත් එක්ක.

[සභාවේ ඝෝෂා]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, බදුල්ල දිස්ත්‍රික්කය -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මම හිතුවේ නැහැ මෙහෙම කඩේ යයි කියලා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මේක කඩේ යෑමක් නෙවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමා සභානායකතුමා. එතුමාට පුංචි කාලයක් තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මට කථා කරන්න දෙන්න. දැන් 2005 ජනාධිපතිවරණය තිබ්බා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඇමැතිකම ගන්න වෙන්න -

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒක මම කියන්න යන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මට විනාඩි 05 කථා කරන්න දෙන්න. අපේ විපක්ෂ නායකතුමා කථා කරද්දී මම ශබ්ද නොකර හිටියා. දැන් අපේ විපක්ෂයේ සංවිධායකතුමා කිව්වා, ජනාධිපතිතුමාගෙන් පටන් ගත්තාම මුළු කැබිනට් මණ්ඩලය කරපුවා, බෙදපුවා සහ තිබ්බ සංදර්ශන පිළිබඳව. මම අහන්න කැමැතියි තමුන්නාන්සේලාගෙන්, මාධ්‍ය තුළින් දකින්න ඇති කිසිම සංදර්ශනයක ජනාධිපතිතුමා හිටියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

සංදර්ශනයක හිටියේ නැහැ. සංදර්ශනය කියන්නේ සිංදු කියලා ප්‍රීති වෙන තැනක්. පක්ෂ දෙකේම මන්ත්‍රීවරු සිංදු කිව්වා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ජනාධිපතිතුමා හන්දි, හන්දි ගාණේ ගියා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ජනාධිපතිතුමා කිසිම සංදර්ශනයක හිටියේ නැහැ. රාජ්‍ය උත්සවලට -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ජනාධිපතිතුමා හන්දි, හන්දි ගාණේ -

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

පන්සලකට ගිහිල්ලා, පාසලකට ගිහිල්ලා ගොඩනැගිල්ලක් විවෘත කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විනාඩියක් ඉන්න. එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා නිතරම බාධා කිරීම් කරන්න මයික්‍රෆෝනය පාවිච්චි කරනවා. ඔය වැඩේ කරන්න දෙන්න බැහැ. ඔබතුමා අනවශ්‍ය ලෙස බලපෑම් කරන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ගරු සභානායකතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, දැන් බලන්න මේකේ සමස්ත ප්‍රතිඵලය. අරවා මේවා නැතිව අවංකව හදවතේ තියාගෙන කථා කරන්න පුළුවන් දේවල් මම කථා කරන්නේ. දැන් උදාහරණයකට මොණරාගල දිස්ත්‍රික්කය ගන්න. මොණරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵලය 140,850 යි එක්සත් ජනතා නිදහස් සන්ධානය. එක්සත් ජාතික පක්ෂය 77,065 යි. දෙගුණයකින් අපි වැඩියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කීයක් අඩු වුණාද?

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඉතිහාසයේ කවදාවත් ජයග්‍රහණය කරන්න පුළුවන්ද? 2005 දී 180,000 කින් දිනපු ජනාධිපති මැතිවරණය 2010 දී 18 ලක්ෂයකින් අපි දිනුවා. ඊළඟ මැතිවරණය ජනාධිපතිතුමා ජයග්‍රහණය කරන්නේ වැඩි ඡන්ද ලක්ෂ 20 කින්. මේක ජනාධිපතිතුමාගේ ඡන්දයක් නොවෙයි. සමහර විට හිතාගෙන ඇති මේ එන ඡන්ද ප්‍රතිඵලයත් එක්ක ඊළඟ ජනාධිපති මැතිවරණය තියන්න. එය අපට ජයග්‍රහණය කරන්න පුළුවන්. අද බලන්න එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ, මොකක්ද අර කමිටුවෙන් ලේකම්තුමා අස් වෙලා. සෑම පත්තරයකම මුල් පිටුවේ. ඒවා ගැන කථා කළාද? අද පක්ෂයේ ලේකම්තුමා අර සංවිධානයෙන් අයින් කළා. ඇයි ඒවා ගැන කථා කරනවාද? එකමුතුවක් තියෙනවාද? මේ නායකයෝ දෙන්නාම දැන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නායකත්ව මණ්ඩලයේ කවල්. කෝ සමගිය.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

අපි හරි කැමැතියි ගරු සභාපතිතුමනි. කොයි පක්ෂයක් වුණත් එකමුතුව මේ ගමන යන්න ඕනෑ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අන්න නායකත්ව මණ්ඩලය පුපුරලා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

එකමුතුව ගමන යනකොට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් පක්ෂය දාලා යනවා. මම නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. ජීවිත ඉතිහාසයේවත් එක්සත් ජාතික පක්ෂය තුළ එකමුතුවක් නම් හදන්න බැහැ. ඒ නිසා මේ ගැන තමුන්නාන්සේලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ මැතිවරණයට සුභ පතන්න කෝ?

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

තව ඉදිරියට කාලය තිබෙනවා. හැම කෙනාම අරවා මේවා බෙදුවා කියන්නේ මොනවාද? කොළඹ දිස්ත්‍රික්කයට බෙදුවේ නැද්ද? බස්නාහිර පළාතේ බෙදුවේ නැද්ද? රැස්වීම් තිබ්බේ නැද්ද? මන්ත්‍රීවරු සිංදු කිව්වේ නැද්ද? සිංදු කිව්වේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු විතරද? හැබැයි කිසිම සංදර්ශණයකට ජනාධිපතිතුමා සහභාගී වුණේ නැහැයි කියන එක විශේෂයෙන්ම විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට දැනුම් දෙන්න ඕනෑ. මේ කාලය ලබා දීම පිළිබඳව මම බොහොම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, රට පුරා එකවර තියන්න ඕනෑ පළාත් සභා මැතිවරණයක් සලාක ක්‍රමයට, කෑළි හතරට කඩලා ආණ්ඩුව තිබ්බා. ආණ්ඩුව බලාපොරොත්තු වුණා වැල්ලේ ගැහුවත් බඹරය කැරකෙයි කියලා. බස්නාහිර, දකුණ දිස්ත්‍රික්ක හයක ඡන්දය ඉවර වනකොට ආණ්ඩුවට ලක්ෂ 2 ½ ක් ඡන්ද අඩුයි. 12% ක් පල්ලම් බැහැලා, ආසන 17 ක් අහිමි කර ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

17 ක්?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ආසන 17 ක් බස්නාහිර, දකුණ අහිමි කරගත්තා. අමතකද? දැන් ඌව පළාත් සභා ඡන්දය ඉවර වෙලා මොක්කද කියන්නේ? ආණ්ඩුවේ ඓතිහාසික ජයග්‍රහණය. ඡන්ද 69,000 ක් අඩුයි. ආණ්ඩුවේ විජයග්‍රහණය. 21% කින් ආණ්ඩුව පල්ලම් බැහැලා. මොණරාගල දිස්ත්‍රික්කයේ 23% ක් පල්ලම් බැහැලා. ආසන 06 ක් අඩු කරගෙන. ඓතිහාසික ජයග්‍රහණයලු. ගරු සභාපතිතුමනි, (බාධා කිරීම්) දිස්ත්‍රික්ක 8 ක ඡන්දය ඉවර වනකොට 320,000 ක් අහිමි කරගත්තු ආණ්ඩුවක්. 320,000 ක් අහිමි කරගෙන. ඒත් කියනවා අතිවිශිෂ්ට ජයග්‍රහණයලු. විජයග්‍රහණය. ජනාධිපතිතුමා ගැන විශ්වාසය තියලාලු. විශ්වාසය තියලා දිස්ත්‍රික්කවලින් 320,000 ක් අඩු කරගෙන. මේක කොහොමද ගත්තේ? තමුන්නාන්සේ දන්නවා ගරු සභාපතිතුමනි, මේ මැතිවරණය මැරවරණයක් බවට පත් වෙලා තිබුණේ. මේක තමයි පසුගිය ඉතිහාසයේ රාජ්‍ය බලය වැඩියෙන්ම පාවිච්චි කරපු මැතිවරණය. රාජ්‍ය දේපළ වැඩිපුරම පාවිච්චි කරපු මැතිවරණය. රාජ්‍ය නිලධාරීන් වැඩිපුරම යොදවපු මැතිවරණය. මේ මැතිවරණය පටන් ගත්තේ නාම යෝජනා දෙන දවසේ. අපේ රටේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකුට, නාමල් තලංගම මහත්තයාට බදුල්ල දිස්ත්‍රික්කයේදී මරණීය තර්ජනය කරලා, ඔහුගේ කැමරා එක උදුරගෙන, ඒකේ තිබුණු මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ ඡායාරූප Delete කරලා දාලා, ඔහුට අඩු තරමින් තමන් ආපු පාරෙන්වත් බදුල්ල නගරයට යන්න දුන්නේ නැහැ. එහෙම පටන් ගත්තු මැතිවරණයක්. අපි අහන්නේ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් හරි, අපේ රටේ පොලීසියෙන් හරි තමන්ගේ නිලධාරියෙක් ආරක්ෂා කර ගන්න - ඔහු සාධාරණව රාජකාරී කරපු කෙනෙක්. ඔහුව ආරක්ෂා කර ගන්න මොනවාද කළේ? කිසි දෙයක් කළේ නැහැ.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් තමුන්නාන්සේ දන්නවා, අගෝස්තු 25 රාත්‍රියෙන් පස්සේ මොණරාගල දිස්ත්‍රික්කය ඇතුළේ කොහොමද ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වුණේ කියලා. ශෂීන්ද්‍ර රාජපක්ෂ මහත්මයාගේ. ඒ අය හම්බන්තොටින්, කොළඹින් ගෙනාපු, මැර සේනා ගෙන ගියා. ඩිෆෙන්ඩර් රථ යොදාගෙන කාර්යාල කීයක් කැඩුවාද? ජනතා විමුක්ති පෙරමුණේ විතරක් කාර්යාලය 30 කට අධික ප්‍රමාණයකට පහර දුන්නා. අපේ සාමාජිකයන්ට ගැහුවා. අපේ අපේක්ෂකයන්ට තර්ජනය කළා. අහසට වෙඩි තිබ්බා. ඡන්දදායකයා භය කළා. එහෙම කරලා ගත්ත ප්‍රතිඵලයක් තමයි මේ තියෙන්නේ. ඒ විතරක් නොවෙයි. මැතිවරණය ඇතුළේ දැන් මේ නියං සහනාධාර බෙදන එක ගැන කථා කරනවා නේ? හොඳයි. නියං ආධාර දෙන්න. ගරු සභාපතිතුමනි, අපි කියන්නේ මොණරාගල විතරක් නොවෙයි. රටටම නියං ආධාර දෙන්න. හැම තැනම නියඟයෙන් විනාශයට පත් වුණා නේ? දැන් මෙහේ වෙරළ ඛාදනය වෙලා. සුළඟෙන් ගෙවල් අහිමි වුණු ජනතාවට ආධාර දෙන්න එපැයි. බෙදන්න පුළුවන් ඔක්කෝම බෙදලා ඡන්ද වැඩි කරගෙන තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, එහෙම මැතිවරණයක් කළේ.

(බාධා කිරීම්) අභගෙන ඉන්න කෝ? කවුද ගැහුවේ? කාවද අත්අඩංගුවට ගත්තේ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

Identity Card එකතු කළාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. විනාඩි 03 ක කාලයක් එතුමාට තියෙන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මොකක්ද? ගරු සභාපතිතුමනි, මෙන්න මෙහෙමයි ආණ්ඩුව ඡන්ද කළේ. වැඩිපුරම ඡන්ද ප්‍රතිශතය අහිමි වෙලා තිබෙන්නේ රාජපක්ෂවරයෙක් මූලික වුණු දිස්ත්‍රික්කයේ. ඒ නිසා මේ සංඥා වෙන මොකක්වත් නොවෙයි. විශේෂයෙන් අපි, ජනතා විමුක්ති පෙරමුණ ස්තුතිවන්ත වෙනවා, ආණ්ඩු විරෝධීව ඡන්දය දීපු සකල විධ ඌවේ ජනතාවට. දැන් ආණ්ඩුවට ගෙදර යන්න සංඥාව දීලා තියෙන්නේ. ගෙදර යවන්න. ඒ නිසා අපි කියන්නේ -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඡන්දෙට ඉස්සෙල්ලාත් කිව්වා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔව්. පුළුවන් නම් දැන් නියමිත මැතිවරණය තියන්න කෝ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හීනෙන් වෙන්න ඇති.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ජනාධිපතිවරණය නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒවා තියන්න කෝ? ඒ නිසා මේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට විරුද්ධව රටම පෙළ ගස්වනවා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි සතුටු වෙනවා. අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබපු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ, මේ ජයග්‍රහණය සම්බන්ධව කරුණු කියනකොට ඒ ජයග්‍රහණයට උර දුන්නු විවිධ ජන කණ්ඩායම් අතර රටේ රාජ්‍ය සේවය නියෝජනය කරන ජනතාවගේ ආශිර්වාදයත් විශාල වශයෙන් ලැබුණා. ඒ ආශිර්වාදය ලැබෙන කොට ඒ ආශිර්වාදය පිළිබඳව විවිධ මතිමතාන්තර පසුගිය කාලයේ විපක්ෂයේ අය විවිධ ආයතනවලට යොමු කරමින් තිබුණා. විශේෂයෙන් මම මේ කාරණාව මතක් කරන්නේ, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මාධ්‍ය සාකච්ඡාවකදී මා සම්බන්ධවත් කියමින් සමෘද්ධි නිලධාරීන්ව, දිවි නැගුම නිලධාරීන්ව ඌව පළාත් සභා මැතිවරණයේ ඡන්ද කටයුතු සඳහා අපි බලහත්කාරයෙන් ගෙන යන්න ලැහැස්ති වෙනවා කියලා ප්‍රකාශ කරලා තිබුණා. තවත් සමහර අයගේ ප්‍රකාශ තිබුණා වාගේම කඩුවෙල මහ නගර සභාවේ විපක්ෂ නායකවරයාත් මහ නගර සභාව තුළ අපි බලහත්කාරයෙන් රාජ්‍ය සේවකයන් ගෙන යනවා කියලා මගේ නමත් ඇඳගෙන ප්‍රකාශ කරලා තිබුණා. බොහොම පැහැදිලිව අපි මතක් කරනවා. මේ රටේ සෑම මැතිවරණයක්ම වසර ගණනාවක් තිස්සේ තිබුණා නම්, මේ රටේ සමස්ත රාජ්‍ය සේවය, වෛද්‍යවරු වෙන්න පුළුවන්. හෙදියෝ වෙන්න පුළුවන්. පාසල් ගුරුවරු වෙන්න පුළුවන්. විදුහල්පතිවරු වෙන්න පුළුවන්. විවිධ රාජ්‍ය අංශයේ සේවකයෝ තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරනකොට මේ රටේ ජනතාව දන්නවා - පළමුවෙන්ම ඡන්දය තියන්නේ රාජ්‍ය සේවකයාගේ ඡන්දය. ඒ හැම අවස්ථාවකදීම රාජ්‍ය සේවකයා වැඩියෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිබඳව විශ්වාසය තියලා ඡන්දය ප්‍රකාශ කරලා මේ රජයට, මේ රජයේ වැඩ පිළිවෙළට අශිර්වාද කරලා තිබුණා. එවැනි ආශිර්වාදයක් දිගින් දිගටම රාජ්‍ය සේවකයෝ ලබා දෙද්දී පසුගිය ඌව පළාත් සභා මැතිවරණයේදී විශේෂයෙන් වෘත්තීය සමිතියක් විධියට මම නායකත්වය දරන සමස්ත ලංකා සමෘද්ධි සහ කෘෂි

[ ගරු ජගත් කුමාර ]

පර්යේෂණ නිලධාරී සංගමය විධියට අපි තීරණය කළා, හැමදාම වාගේ මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දුන්නු, මේ රටේ ත්‍රස්තවාදය අවසන් කරපු දශක තුනක ලේ ගංගා මිනී කඳු නැති කරපු, ඒ වාගේම බෝම්බ බිය, ජීවිත අවධානම නැති කරපු රාජ්‍ය නායකයාට, ඒ වාගේම රට හදන නායකයාට ආශිර්වාද කරමින් ශක්තිය දෙන්න, අපට සම්බන්ධ රාජ්‍ය සේවකයන්ගේ ශක්තිය බොහොම පැහැදිලිව ලබා දෙනවා කියලා අපි තීන්දු කළා. ඒ තීන්දුව අරගත්තේ හොරෙන් නොවෙයි. අපි මාධ්‍ය ප්‍රකාශ පවා කරලා අපි අපේ නිලධාරීන්ට කථා කළා, මේ මැතිවරණයේදී ගෙයින් ගෙට ගිහිල්ලා, ගමින් ගමට ගිහිල්ලා ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන, ජනතාවට රජයේ පණිවුඩය ලබා දීලා, ජනතාවගේ ආශිර්වාදය රජයට ලබා දෙන ගමන් ජනතාවට රජයෙන් විය යුතු යුතුකම රජය වෙනුවෙන් මැදිහත්කරුවෙකු විධියට කටයුතු කරලා ඉදිරියේදී ලබා දෙන්න කටයුතු කරන්න. ඒ අනුව අපි ඒ කාර්ය භාරය ඉතා සාර්ථකව සිද්ධ කළා. හැබැයි, අතරමඟදී විපක්ෂයේ අය මානව හිමිකම් කොමිසමට ගියා. මැතිවරණ කොමසාරිස්වරයා ළඟට ගියා, බලහත්කාරයෙන් සමෘද්ධි නිලධාරීන්, ආර්ථික නිලධාරීන්, කෘෂි පර්යේෂණ නිලධාරීන් ඇතුළු රාජ්‍ය සේවකයෝ යනවා කියලා.

ඒ අය විතරක් නොවෙයි. දුම්රිය සේවකයෝ, ගුරුවරු විවිධ අය ගියා. ඒ අය බොහොම කැමැත්තෙන් ගියේ. කැමැත්තෙන් ගිහිල්ලා ජනතාවත් එක්ක කථා බහ කරලා, මිනිස්සුන්ගේ ප්‍රශ්න ටික හඳුනගෙන රජයේ අවධානය යොමු කළා විතරක් නොවෙයි. නැවත ඔවුන්ට මේ ඡන්දයෙන් පස්සේ ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවන් සම්පූර්ණ කරන්න - මොකද, ඌව පළාතේ විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු නිවාසවල මහ විශාල ගැටළු තිබුණා. ඒ මිනිස්සුන්ගේ අවශ්‍යතා නිවාස ප්‍රශ්නය. වැසිකිළි ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කටයුතු කරන්න අපි මැදිහත් වෙලා දැනටමත් ඒ පියවර බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමා හරහා අපි ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා බොරු ගමනක්වත්, බලහත්කාර ගමනක්වත් රාජ්‍ය සේවකයෝ අරගෙන ගියේ නැහැ. විශාල පිරිසක් ගියා. මේ රටේ පළමුවැනි වතාවට එවැනි සංවිධානාත්මකව 20,000 කට ආසන්න පිරිසක් එකවර අනෙක් පළාත්වලින් මේ මැතිවරණයක් තිබෙන ප්‍රදේශයකට ගියේ. හැබැයි අපි බොහොම පැහැදිලිව -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සමෘද්ධි නියාමකයෝ ටික බලෙන් අරන් ගියේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීතුමා බලෙන් ගෙනියන්න, තුවක්කු තියලා, ඒ අයට වෙන බලපෑම් කරලා හිරිහැර කළේ නැහැ. ඔබතුමා UNP එකේ හිටියේ නැහැ. සාමාන්‍ය භාෂාවෙන් කියන අන්තිම කොණකවත් ඔබතුමා හිටියේ නැහැ. ඒ කාලේ UNP එකේ බලේ තිබෙන වෙලාවේ සමෘද්ධි නිලධාරීන්ට ගහලා, හිරිහැර කරලා, බය කරලා, රස්සා නැති කරනවා කියලා සහයෝගය ඉල්ලපු අවස්ථා තිබුණා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ කාලේ සමෘද්ධි තිබුණේ නැහැ. ජනසවිය තිබුණේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ, නැහැ. 2002 – 2004, ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමා දේශපාලනයට ආවේ ඊයේ පෙරේදා. ඔබතුමා මාධ්‍යවල වැඩකාරයෙක් වෙන්න ඇති. හැබැයි මෙතැන වැඩකාරයෙක් වෙන්න බැහැ. නිකම් බොරුවට පුප්පන්න විතරක් එපා. මම දැක්කා, පසුගිය දවස්වල පාළු ගෙවල්වල වළං බිඳන්න ලැහැස්ති වුණා. හැබැයි, තමුන්නාන්සේ තේරුම් ගන්න ඕනෑ ඌව පළාතට මේ නිලධාරීන් ගියේ කැමැත්තෙන්. නිලධාරීන් බලහත්කාරයෙන් ගෙනියන්න බැහැ. ගෙවල්වලට ගිහිල්ලා කථා කරලා රජයේ පණිවුඩයක් බලහත්කාරයෙන් දෙන්න බැහැ. මිනිස්සු කැමැත්තෙන් ඒ සහෝගය දුන්නේ. ඒ සහයෝගය දෙනකොට තමුන්නාන්සේලාගේ කලබලය නිසා, ජනතා විමුක්ති පෙරමුණේ කලබලය නිසා මානව හිමිකම් කොමිෂම තීන්දුවක් දුන්නා. රාජ්‍ය සේවකයන්ට දේශපාලනය කරන්න අයිතියක් තිබෙනවා. හැබැයි, රාජ්‍ය දේපළ පාවිච්චි කරන්නේ නැතුව. ඔව් අපි රාජ්‍ය දේපළ පාවිච්චි නොකර ඒ දේශපාලන අයිතිය එළි පිට කළා. ඒ වාගේම අනෙක් අතට මැතිවරණ කොමසාරිස්තුමා පැහැදිලිව කිව්වා වෘත්තීය සමිතියකට දේශපාලනය කරන්න තිබෙන අයිතිය අපට නවත්වන්න බැහැයි කියලා. තමුන්නාන්සේලා ඒ අයිතිවාසිකම නීතිගත කරලා අවස්ථාව සලසා දුන්නා. අපි මේ වෙලාවේ පැහැදිලි කරන්න ඕනෑ,

ඒ නිලධාරීන් ගියේ රට හදන වැඩ පිළිවෙළ තව ඉස්සරහාට ගෙනියන්න ඕනෑ නිසා. ඒ නිසා සමෘද්ධි, කෘෂි, ආර්ථික සහ අනෙකුත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අපි මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. ඒ සහයෝගය දුන්නා විතරක් නොවෙයි. ඡන්දය ප්‍රකාශ කිරීමේදීත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, සහෝගය දුන්නා. දිගින් දිගට ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඔවුන්ගේ ප්‍රතිශතය වැඩි වෙලා, ඔවුන්ගේ තත්ත්වයන් වැඩි වෙලා කියලා. අපි පැහැදිලිව කියනවා. මේ බස්නාහිර පළාත් සභාවේදී, ඒ වාගේම දකුණු පළාත් සභාවේදී ප්‍රතිඵලයක් විධියට ජනතා විමුක්ති පෙරමුණ ගත්තු ප්‍රතිශතයවත් ඌව පළාත් සභාවේදී ගත්තේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඌව පළාත් සභාවේදී තමුන්නාන්සේලා කිව්වා දුප්පත්ම දිස්ත්‍රික්කය, දුප්පත්ම පළාත් සභාව බවට පත් කළා කියලා. එහෙම නම් මිනිස්සුන්ට වඩා හොඳින් දැනෙන්න ඕනෑ. විශේෂයෙන්ම මොණරාගල දිස්ත්‍රික්කයේ. මොණරාගල දිස්ත්‍රික්කයේ තමුන්නාන්සේලාගේ ප්‍රතිශතය, එදාට වඩා අඩු වෙලා තිබුණා, මේ පළාත්වල ගත්තු ඡන්ද ප්‍රතිශතයත් එක්ක. මේ පළාත් සභාවේ ඡන්ද ප්‍රතිශතයත් එක්ක.

ඒ නිසා තමුන්නාන්සේලා දවල් හීන දැක්කාට මේ සිහින සැබෑ වෙන්නේ නැහැ. රට හදන නායකයා විධියට. මේ රටේ රාජ්‍ය නායකයා විධියට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරනවා කියලා සමස්ත ජාතියම, සමස්ත රටම දන්නවා. ඒ නිසා ජාතියේ උන්නතිය වෙනුවෙන් එතුමාගේ ජයග්‍රහණයට මේ රටේ සමස්ත ජනතාව අත්වැල් බැඳගෙන ඉන්නවා. අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ 20 ලක්ෂයකින් නොවෙයි. ඊටත් වැඩිය විශාල ජයග්‍රහණයකින් ඊළඟ මැතිවරණය ජයග්‍රහණය කරනවා කියලාත් අපි තමුන්නාන්සේලාට වගකීමෙන් කියනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අඩු වුණා කියලා පිළිගන්න. එච්චරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා.* ***11.19*** *ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 11.19 A.m. and then resumed.*

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, *"2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන්, මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2014 සැප්තැම්බර් මස 10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී එළඹුණු එකඟතාවයද, සැලකිල්ලට ගෙන 2014 දෙසැම්බර් මස 02, 03, 04 හා 05 යන දිනයන් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2014 අංක .......... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම
FINANCIAL (AMENDMENT) STATUTE NO……… OF 2014 : SECOND READING

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2014 අංක ........ දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය" දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, ඉහත ප්‍රඥප්තිය මීට පෙර සභාවට ඉදිරිපත් කර පළාත් සභාව විසින් එය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කළ පසු ප්‍රඥප්ති හා නීති කාරක සභාව විසින් ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. එම සංශෝධනයන්ට යටත්ව සභාවේ අනුමැතිය අපේක්ෂා කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

## 2014 අංක .......... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම
FINANCIAL (AMENDMENT) STATUTE NO……… OF 2014 : THIRD READING

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - Minister [On behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2014 අංක ........ දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය" තෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.*

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## ජීවන වියදම අඩු කර ජනතාවට සහන සැලසීම
REDUCING COST OF LIVING BY PROVIDING RELIEF TO PUBLIC

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, *"මධ්‍යම රජය ජනතාව මත බදු බර පටවා ජනතාව අසීරුතාවයට පත් කර ඇති හෙයින් පළාතේ ආදායමෙන් පළාතේ පුරවැසියන්ට ජීවන වියදම අඩු කර අවශ්‍ය සහන ලබා දීමට කටයුතු කිරීම මැනවයි බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[පූ.භා. 11.26]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ජනතාවට බදු ආදායම් ලබා දීම පිළිබඳව අපේ පළාත් සභාව 2014 වසරේදී අපේ මුදල් ප්‍රකාශයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සඳහන් කරලා තිබෙනවා, මිලියන 30,952 ක මුදලක් බදු ආදායම් හැටියට පළාතේ ජනතාවගෙන් එකතු කරලා පළාතේ ජනතාවට සේවාවන් ලබා දෙන්න කටයුතු කරන බවට. අපි දැක්කා, 2013 වසරේ එතුමාගේ මුදල් ප්‍රකාශනයේ තිබෙනවා, පළාතේ ජනතාවගෙන් ආදායම් එකතු කරන්න එතුමා ඉලක්ක කරගෙන තිබුණා, මිලියන 29,617 ක්. ඒ වාගේම 2012 මිලියන 25,378 ක්. පළාතේ ජනතාවගෙන් බදු එකතු කරගෙන ඒ ආදායමෙන් පළාතේ ජනතාවට සහන ලබා දීම පිළිබඳව අපි අධ්‍යයනය කරලා බැලුවාම, මධ්‍යම රජය බදු අය කර ගැනීමයි, පළාත් සභාව බදු අය කර ගැනීමයි, ඒ වාගේම පළාත් පාලන ආයතනවල බදු අය කර ගැනීම පිළිබඳව සලකා බැලුවාම - මම හිතන්නේ, හතළින්

පන් ලක්ෂයකට ආසන්න ජනතාවක් අපේ පළාත තුළ ජීවත් වෙනවා. මේ පළාත තුළ ජීවත් වන ජනතාව මේ පළාත් සභාව පිහිටුවන්න තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරලා අවුරුදු හතරකට පහකට වරක් ඡන්දයක් දීලා මේ පළාත් සභාව ඇති කරලා ජනතාව නියෝජනය සඳහා මන්ත්‍රීවරු 104 දෙනෙක් අපේ පළාතෙන් පළාත් සභාවට එවනවා. පළාත් සභාව එකතු කරන බදු මුදල් දිහා අරගෙන බැලුවාම අපි දකිනවා, වසරෙන් වසර එකතු කරන බදු මුදල වැඩි වෙනවා. එය ජනතාවගේ ජීවන වියදමට විශාල ප්‍රශ්නයක් වෙනවා. ජනතාවට ලැබෙන සහන පිළිබඳව බැලුවාම ඉතාමත් අපහසුතාවයකට මේ පළාතේ ජීවත් වන ජනතාවගේ ජීවන වියදම අද ඉහළ ගිහිල්ලා තිබෙනවා කියන එක අපි මතක් කරන්න කැමැතියි. ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යාංශ පහකින් ඒ වාගේම වැය ශීර්ෂයන් යටතේ එකතු කරන්න යන බදු පිළිබඳව දැවැන්ත විස්තරයක් අපට ලබා දීලා තිබෙනවා. ඒ ලබා දීලා තිබෙන විස්තර දිහා අරගෙන බැලුවාම 2014 වසරේදී 2013 වසර දිහා අරගෙන බැලුවාමත් අපට බදු ආදායම 2013 වසර දිහා අරගෙන බැලුවාමත් අපට බදු ආදායම එකතු කරගන්න පුළුවන් ක්‍රමවේදය පිළිබඳව සටහනක් දීලා තිබෙනවා. කොහොමද මේ බදු ආදායම එකතු කරන්නේ? මේ බදුවලින් ලැබෙන මුදල් ප්‍රමාණය කොපමණද? අපේ පළාතේ ජනතාවගෙන් 2013 දී විෂයයන් 30 ක් යටතේ බදු එකතු කිරීම ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ විෂයයන් 30 මුලින්ම ඇතුළත් වෙන්නේ අරක්කු, තැබෑරුම්, රේන්ද බදු කියලා. ඒක අවසන් කරනවා මුද්දර ගාස්තු කියන බදු එකතු කිරීමේ තැනට. මේ කරුණු දිහා අරගෙන බැලුවාම අපට පේනවා, ඉතාමත්ම ඉහළින් ජනතාව මත බදු බර පටවනකොට මේ ජනතාවට ලැබෙන වාසිය දිහා අරගෙන බැලුවාම, කිසිම සහනයක් මේ පළාතේ ජනතාවට ලැබෙන්නේ නැහැයි කියන එක අද ජනතාව තර්ක කරනවා. මහජන නියෝජිතයින් හැටියට අපෙන් අහනවා, මේ පිළිබඳව සභාවල් දැනුවත් කරලා මේ සහන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවෙන්නේ ඇයි කියලා.

අපි පසුගිය දවස්වල දැක්කා, මධ්‍යම රජයෙන් තීරණ කිහිපයක් ගන්නවා. ජීවන වියදම වැඩිවීම පිළිබඳව. වෙළෙන්දන් ඒ බඩු හංගගෙන, වැඩි මිලට විකුණන ආකාරය පිළිබඳව සොයා බැලුවාම අපේ වෙළඳ කටයුතු අමාත්‍යතුමා පාලන මිලක් යොදවලා, මේ සහල් හිඟය තුළින් වැඩි වන ජීවන වියදමට සරිලන්න ආකාරයේ වැඩ පිළිවෙළක් ඇති කොට පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය යටතේ යම්කිසි මුදලකට බෙදා හරිනවා. නමුත් පරිභෝගික කටයුතු අමාත්‍යාංශයෙන් දෙන නියෝගය පෞද්ගලික ව්‍යාපාර සම්බන්ධයෙන් බැලුවාම මේ බදු අය කිරීම තුළ ජනතාවට කිසිම සහනයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බැහැයි කියන එක පැහැදිලියි. මධ්‍යම ආණ්ඩුවයි, පළාත් ආණ්ඩුවයි අතර ඇති පරස්පරය අනුව මේ සේවාවන් ලබා දීමේදී ජනතාවට දැවැන්ත බදු බරක් පටවලා තියෙනවා. ජනතාව රුපියල් 1000/- ක් උපයනවා නම් එයින් ජනතාවට අයිති වන්නේ රුපියල් 400/- ක, රුපියල් 450/- ක පමණ මුදලක් විතරයි. මේ පිළිබඳව අපි වසරින් වසර විවාදවලදී කථා කරලා මේ පළාතේ ජීවත් වන පුරවැසියන්ට සහන ලබා දීමට උත්සාහ කළා. මට මතකයි, අපි පසුගිය පළාත් සභාවේ රෙජිනෝල්ඩ් කුරේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්න කොට එතුමා මේ පළාතේ වාහන ආදායම් බලපත්‍ර ගාස්තුව වැඩි කළා. එතුමා සභාවේ අමාත්‍ය මණ්ඩලයත් එක්ක කථා කරලා 40% කින්ද කොහෙද වාහන ආදායම් බලපත්‍ර ගාස්තු වැඩි කළා. අපි විපක්ෂයක් හැටියට ජනතාව වෙනුවෙන් ඒ පිළිබඳව සභාව දැනුවත් කරලා, අපේ තිබෙන මූල්‍ය රෙගුලාසි අනුව ඒ කරුණු පැහැදිලි කළාම, විපක්ෂයේ ඒ විවාදය උපයෝගී කරගෙන එතුමාට අවස්ථාවක් උදා වුණා. එතුමා වැඩි කරපු මුදල ආපසු අඩු කරලා ජනතාවට ඒ සහනය ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්කමක් මේ පළාත් සභාවෙන් ඇති වුණා. මම හිතන්නේ, ලංකා ඉතිහාසයේ පළාත් සභාවල්වල වැඩිම - මේ රටේ තිබෙන පළාත් සඳහා ආදායමක් උපයන්න ඉදිරිපත් කරපු යෝජනාවකින් විපක්ෂය මැදිහත් වීමෙන් ජනතාවට ලැබුණු පළමුවැනිම බදු සහනය එයයි කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

එහෙමනම් ගරු සභාපතිතුමනි, අපට කියන්න සිද්ධ වෙනවා මේ පළාත් සභා ක්‍රමය දිහා අරගෙන බැලුවාම අද මධ්‍යම ආණ්ඩුව විශාල වශයෙන් මේ පළාතේ අදායම් එකතු කිරීමේ බලතල මේ පනතෙන් අපට ලබා දීලා තිබුණත් ඒ පළාතේ ජනතාවට ඒවා පරිහරණය කිරීමේදී කටයුතු ක්‍රියාත්මක කරන්න බලය බෙදා හරිනවා කියලා කථා කළාට, අද වර්තමාන රජය ගෙන යන වැඩ පිළිවෙළ දිහා අරගෙන බැලුවාම පළාත් සභාවල්වලට ලැබිය යුතු බලතල මධ්‍යම රජය ලබා දීලා නැහැයි කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එය ලබා දුන්නා නම් අපට පුළුවන්කම ඇති වෙනවා. අපි කියමු කෝ උතුරු පළාත, නැගෙනහිර පළාත, මධ්‍යම පළාත, නොයෙකුත් පළාත්වලින් නිෂ්පාදනය වන එළවළු ටික වෙන්න පුළුවන්.

මාළු ටික වෙන්න පුළුවන්. පොල් ටික වෙන්න පුළුවන්. මිනිස්සුන්ගේ ජීවිතයට එදිනෙදා කෑමට අවශ්‍ය භාණ්ඩ ටික අපට හුවමාරු කරගන්න පුළුවන්කමක් ඇති වෙනවා නම් පළාත් අතර මේ පළාත් සභාවල්වල ඉන්න අමාත්‍යතුමන්ලා, ඒ වාගේම ප්‍රධාන අමාත්‍යතුමන්ලා, ඒ ලේකම්තුමන්ලා, ආණ්ඩුකාරතුමන්ලා එකට එකතු වෙලා සාකච්ඡා කරලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා නම් මම හිතන්නේ අද මම ඉදිරිපත් කරලා තිබෙන මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවෙන් ජනතාවට සහන සලසන්න පුළුවන්. මේ පළාත, වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් නියෝජනය වන පළාත. වැඩිම ආදායමක් බදු වශයෙන් එකතු කරන පළාත. අනෙකුත් පළාත් සභාවල්වලට ආදර්ශයක් ලබා දෙන්න, ජනතාවට සහන ලබා දෙන්න පුළුවන් බලයක් මේ පළාත් සභා පනත යටතේ තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අපි ඊළඟට අරගෙන බැලුවාම මේ බදු අය කරන ආකාරය. පළාත් සභා පනත යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මම හිතන්නේ හතළිස් ගණනක් මේ බස්නාහිර පළාතේ තිබෙනවා. කොළඹ මහ නගර සභාව ගත්තාම අනිකුත් සුළු නගර සභා අරගෙන බැලුවාම, ප්‍රාදේශීය සභා දිහා අරගෙන බැලුවාම ඒ අය කරන වරිපනම් බදු පිළිබඳව අපි කථා කරනකොට ඒ බදුවලින් ඒ ජනතාවට ලබා දෙන සහන සේවාවල්, පහසුකම් දිහා අරගෙන බැලුවාම කිසිම සහනයක් එම ආයතනවලින් ලබා දීමට, ජනතාවට සහනයක් ලබා දෙන්න සැලැස්මක් ඉදිරිපත් කරලා නැහැයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අනික් පැත්තෙන් අපි අරගෙන බැලුවාම මේ පළාතේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවන ආකාරය දිහා අරගෙන බැලුවාම ඔවුන්ටත් ජීවන බර දැනෙන බව හොඳටම පැහැදිලියි. පළාත තුළ නිෂ්පාදනය කරන, අමාත්‍යාංශවලින් පළාත් සභාවේ නිෂ්පාදනය වන ඒ භාණ්ඩ ටික මනා කළමනාකාරීත්වය තුළින් යම්කිසි සේවාවක් ලබා දෙන්න පුළුවන් නම් ඒක මන්ත්‍රීවරුන්ගේ මට්ටමින්, පළාත් රාජ්‍ය සේවකයින්ගේ මට්ටමින් හා පළාතේ ජීවත්වන ජනතාවට ලබා දෙන්න පුළුවන් සහන රාශියක් තිබෙනවා. ඒ පිළිබඳව මම හිතන්නේ මේ විවාදයේදී අදහස් අරගෙන ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය කටයුතු කළොත් ලංකාවේ පළමුවැනි වතාවට පළාතේ පළාත් සභා ආදායමෙන් බදු සහනයක් ලබා දෙන්න පුළුවන් අයවැයක් අපට අද ඔබතුමන්ලා ඉදිරිපත් කළා වෙනවා. එවැනි ප්‍රකාශයක් නිකුත් කරලා පළාතේ ජනතාවට පළාත් සභාවකින් සහනයක් ඇති කර දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියන එක මම මතක් කර දෙන්න කැමැතියි. එහෙමනම් මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. මගේ කාලය අවසන් වුණ නිසා. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.36]

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ සමස්ත හරය සැලකිල්ලට ගනිද්දී අපට පේනවා, මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය විධියට අප අවධාරණය කරන, අපට එකඟ විය හැකි ප්‍රධාන කාරණය වන්නේ, ජීවන වියදම අඩු කර අවශ්‍ය සහන ජනතාවට ලබා දිය යුතුයි කියන මූලික කාරණාවයි. විවාදයකින් තොරව අපි සියලු දෙනා ජනතාවට සහන සැලසිය යුතුයි කියන මතය තුළ එකට බැඳිලා ඉන්නවා. හැබැයි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන පරිදි මධ්‍යම රජය යම් බදු මුදලක් අය කරන්නේ නම්, එය පළාත් සභාවේ ආදායමක් බවට පරිවර්තනය කරගෙන, ඒ පරිවර්තනයෙන් ලැබෙන ප්‍රතිලාභ ජනතාවට සහන සලසන්න ලබා දිය යුතුයි කියන මූලික කාරණය නම් එතුමා තර්ක කරන්නේ, ඒකෙන් පැහැදිලි වන්නේ මධ්‍යම රජය හෝ වේවා, පළාත් සභාව හෝ වේවා, ආදායම් වැඩි කර ගැනීම සඳහා උපාය මාර්ග ජනතාව මත පටවන්න වෙනවා කියන එකයි. ඒ නිසා එය නොවෙයි සිදු විය යුත්තේ. මේ කාරණය, අපි සියලු දෙනා සමස්තයක් වශයෙන් එකඟ වන දේ. මේ යෝජනාවේ ජනතාවට සහන සැලසිය යුතුයි කියන කාරණය සම්බන්ධයෙන් පමණයි අපේ එකඟතාවය පවතින්නේ. ඔබතුමා ඉදිරිපත් කරන යෝජනාවට අපි ඉතාම

ගරු කරනවා. අපි හිතුවා, මීට වඩා විපක්ෂයේ බැඳීමක් මෙවැනි යෝජනාවක් සම්බන්ධයෙන් පවතියි කියලා. මැතිවරණ ජයග්‍රහණයක් හෝ විශාල ජයග්‍රහණයක් ගැන අභිමානයෙන් කථා කරපු මන්ත්‍රීවරු විපක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ ඔබතුමාගේ යෝජනාවට අද නැහැ. ඒ නිසා මේ සභාවේ ගණ පූරණය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය විධියට අපි වාගේම විපක්ෂයේ ඔබ සියලු දෙනාත් ඒ සඳහා බැඳී තිබෙනවා. මේ සභාවේ ගණ පූරණය පවත්වා ගන්න - ඔබතුමා පසුගිය පළාත් සභා රැස්වීම සම්බන්ධයෙන් අභියෝග කරලා තිබුණා ගණ පූරණය නැහැයි කියලා. අවසාන වශයෙන් පෙනී යනවා ඇත්තෙන්ම ගණ පූරණය නැති වුණේ එක්සත් ජාතික පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් මේ සභාවේ නොසිටීම නිසා.

ජනතාවට සහන දිය යුතුයි. අපි රජය විධියට ජනතාවට ඒ සහන සපයමින් සිටින්නේ. අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ජනතාවට මේ වන විටත් සහන සපයමින් ආර්ථික සංවර්ධන ඉලක්ක ජයග්‍රහණය කරා යන මොහොතකයි අපි ඉන්නේ. අපේ සංවර්ධන වේගය 7% ක දළ වේගයක් අඛණ්ඩව පවත්වාගෙන යන්න රටට හැකියාව ලැබිලා තිබෙනවා. මිනිස්සුන්ගේ ආදායම වැඩි කරගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඇමරිකානු ඩොලර් 2000 කට තිබුණු ආදායම අද වන විට 4000 දක්වා වැඩි කරගෙන 2017 දී ඇමරිකානු ඩොලර් 7000 දක්වා ඒක පුද්ගල ආදායම වැඩි කරගන්න විධියට අපේ ආර්ථික ශක්තිය, ඒක පුද්ගල ආදායමෙන් මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ගොඩනඟන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ලෝකයේ ජීවන වියදම් ගැටලුව කියන එක කවදාවක්වත් විසඳෙන්නේ නැති ප්‍රශ්නයක්. ඒ ආර්ථික විද්‍යාවේ මූලික කාරණයත් එක්ක තමයි ඒ කරුණ ගැට ගැහිලා තිබෙන්නේ. සම්පත් සීමිතයි. උවමනා අසීමිතයි . මේ දෙක අතර ගැටුම, පරතරය ලෝකය පුරා පවතිනවා.

අද අපේ පුද්ගලික ජීවන පරිභෝජන සහ සමාජ හැසිරීම් ජාලය විමසා බැලුවොත් පේනවා, අපි අපේ වියදම් ගොඩ වැඩි කරගෙන තිබෙනවා. අතිවිශාල වියදම් ගොඩක් වැඩි කරගෙන තිබෙනවා. ගම්වල බස් එකකවත් යන්න වත්කමක් නැති මිනිස්සු අද මෝටර් බයිසිකලයක, වාහනයක යන්න පෙළඹිලා තිබෙනවා. ඒ නිසා මිනිස්සුන්ගේ වියදම් ගොඩට අලුත් වියදම් ගොඩක් එකට එකතු වෙලා. දුරකථන වියදමත් ඒකට අද එකතු කරගෙන. පාරිභෝජන ක්‍රමය, මිනිස්සු තමුන්ට නොගැළපෙන අසීමාන්තික අශාවන් ඔස්සේ නොගැළපෙන පාරිභෝජන රටාවකට හුරු වෙලා තිබෙනවා. ඒ නිසා දාර්ශනික වශයෙන් විමසුවොත් මේ හිඟකම් පිළිබඳ ප්‍රශ්නය, නැතිකම පිළිබඳ ප්‍රශ්නය ලෝකයේ දියුණු රටවල්වල මිනිස්සුන්ටත් තිබෙන ප්‍රශ්නයක්. ඒක තමුන්ගේ තෘප්තිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ වුණාට මේ රටේ ජනතාවට ප්‍රශ්න තිබෙනවා. ඒක, අපි කිසිසේත්ම අවබෝධ නොකරගත්ත කොටසක් නොවෙයි. අපි දන්නවා, පසුගිය පළාත් සභා මැතිවරණය ගැන ඊයේ පෙරෙයිදා අවසන් වුණු මැතිවරණය ගැන දැන් ටිකකට කලින් මහා සෝරනාඩු දුන්නා. හැබැයි, මම මේක විශේෂයෙන් කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළයි කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කෑ ගැහුවා. මෙන්න මේ අද පත්තරේ තිබෙනවා. ලංකාදීප, මව්බිම, සියලුම ජාතික පුවත්පත්වල වාර්තා කරලා තිබෙනවා. මහත්තයා පණටත් වඩා පක්ෂයට ආදරය කළා. යූ.ඇන්.පී. ය පැරදුණාට සිත් වේදනාවෙන් සිටියේ. වස බී වෙහෙරගල මොණරාගල දිස්ත්‍රික්කයේ මනුෂ්‍යයෙක් මිය යනවා. මේ අද එක්සත් ජාතික පක්ෂයේ පරාජය ගම්වල -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපි පැරදුණා. පැරදුණේ නැහැයි කියන්නේ නැහැ. අපි ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

වැසියන් පිළිගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අවශ්‍ය වෙන්නේ, රටට මැතිවරණ දිනීම පරාජය කිරීම නොවෙයි. රට අලුත් සංවර්ධන මාවතකට ගෙනියන වැඩ පිළිවෙළක්, මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ගොඩනඟන වැඩ පිළිවෙළක් තමයි රටට අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය අද අපේ රටේ ජනයාගේ මූලික වියදම් අඩු කිරීමේ වැඩ සටහන ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන් විදුලිය සහ ඉන්ධන ගාස්තු අඩු කිරීමත්, ඒ වාගේම යටිතල පහසුකම් හැකිතාක් සංවර්ධනය කරලා, සංවර්ධනය අපේ ගම්වලට ගෙනිහිල්ලා තිබෙනවා. ඔවුන්ගේ නිෂ්පාදනය වෙළඳ පොළට ගෙන එන්න පුළුවන් පහසුකම ඇති කරලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගත්ත සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ප්‍රශ්නයට විසඳුම් වන්නේ, නිෂ්පාදනය වැඩි

[ ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ]

කිරීම සහ ආදායම් වැඩි කර ගැනීමයි. නිෂ්පාදනය වැඩි කර ගැනීම සහ ආදායම් වර්ධනය කර ගැනීමෙන් තමයි මේ මිනිස්සුන්ට සහනය සැලසෙන්නේ. ඒ සඳහා වූ සංවර්ධන උපාය මාර්ගය තමයි රට පුරා අද ක්‍රියාත්මක කරමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ක්‍රියාත්මක කරමින් සිටින්නේ. ඒ නිසා අපි කිසිසේත්ම සතුටු වෙන්නේ නැහැ. බදු ව්‍යූහය කවර ආයතනයකින් මෙහෙයුවත් අවසානයේ එක කණ්ඩායමක් පටවන බදු තවත් ආයතනයකට ඒ බදු පටවගෙන එයින් ජනතාවට සහන සැලසිය යුතුයි කියන යෝජනාව සම්බන්ධයෙන් අපි එකඟ වන්නේ නැහැ. හැබැයි, ජනතාවට සහන සැපයිය යුතුයි කියන යෝජනාවට අපි ගරු කරමින් ඒ සඳහා අපේ කැමැත්ත ප්‍රකාශ කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.49]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කියන ආකාරයට අද මේ රටේ ජනතාවට ප්‍රශ්නයක් නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වෙනුවෙන් ඡන්දය දෙන්නේ, මේ රටේ ජනතාව හොඳට තුන් වේලම කාලා, ඇඳලා පැළඳලා, රෝහලට ගියාම ඒ අවශ්‍ය බෙහෙත් ටික ලැබිලා සන්තෝෂයෙන් ජීවත්වන ජනතාවක් ඉන්නවා කියලා තමයි මේ කියන්නේ. ගරු සභාපතිතුමනි අපි කනගාටු වෙනවා. මේ ආණ්ඩු පක්ෂයේ අය ඉන්නේ මොන ලෝකයේද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය. දැන් සමහර අය විග්‍රහ කරන්න හදනවා, ජනතාව තවමත් මේ රජයට කැමැතියි. මේ රටේ ජනතාව මේ ජනාධිපතිතුමාට ආදරෙයි. හැබැයි ඡන්ද ලක්ෂ ගණනක් අඩු වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට බදුල්ල දිස්ත්‍රික්කයෙන් විතරක් ඡන්ද ලක්ෂ ගණනක් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මේ ගොල්ලෝ කියන්නේ තවමත් ඒ යුධ ජයග්‍රහණය නිසා - ඒ කාලයේ තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. අද වෙනස්. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, අද මේ රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා, මහින්ද රාජපක්ෂ යුද්ධයට සහයෝගය දුන්නාට ආර්ථිකය මෙහෙයවන්න කිසිම සුදුසුකමක් නැහැයි කියන එක තමයි අද බදුල්ල, ඒ වාගේම මොණරාගල දිස්ත්‍රික්කවල ජනතාව මේ ඡන්දයේදී කතිරය ගහලා පෙන්නුවේ, අන්න ඒක නිසයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ සුළුතරය. බහුතරය පිළිගන්නේ නැද්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බහුතරය සුළුතරය නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, බහුතරය සුළුතරය කිය කිය හිටියොත් තමුන්නාන්සේලාටත් අපට වුණු ඉරණමම තමයි තව ටික දවසකින් වෙන්න යන්නේ. අපේ පක්ෂයත් එක කාලයක ඔහොම හිතාගෙන සිටියා. තව අවුරුදු 25 කට දෙන්නේ නැහැයි කියලා. අපටත් වුණේ ඔය ටිකම තමයි. මම විශ්වාස කරනවා. ඔබතුමාටත් මොළේ පොඩ්ඩක් පෑදිලා. දැන්වත් ජනතාව ගැන හිතන්න, තේරුම් ගන්න අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. මේ රටේ ජනතාව අද තුන්වේල නොවෙයි දෙවේල කන්නත් බැරි තත්ත්වයක ජීවත් වෙන්නේ. තමුන්නාන්සේලා දන්නවා. තමුන්නාන්සේලා කොච්චර නැහැයි කිව්වත්, අද හාල් මිලට වෙලා තිබෙන දේ බලන්න. 70 වට, 65 ට තිබුණු නාඩු හාල් ටික 85 ට ගියා. රජයේ ඇමතිවරුන්ගේ සහෝදරයෝ හාල් මිල පාලනය කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ නාඩු හාල් ටික හංගගෙන එළියට දාද්දී තම්බපු නාඩු කියලා 85 ට දුන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කාලයේ ගොවියෝ වහ බිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ කාලයේ වහ බිව්වේ නැහැ. තමුන්නාන්සේලාගේ මේ කාලයේත් වහ බොනවා. මේ කාලයේ වහ නොවෙයි, ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආර්ථිකය කොපමණ හොඳයිද කියනවා නම් අම්මලා ළමයින් පිටින් වැව් වලට පනින්නේ. එල්ලිලා මැරෙන්නේ. මේ පත්තරේ තියෙන්නේ. බිරියගේ කුසේ දරු දෙදෙනෙක් බව දැනගත් සැමියා වස බී නසී. ඇයි? ඒ මොකද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒ අනියම් සම්බන්ධතාවයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකද දරුවාට කන්න බොන්න දෙන්න විධියක් නැහැ. අද පවුලක් නඩත්තු කරගන්න බැහැ. ළමයා ඉපදුණා නම් සැමියාට කිරි පිටි දී ගන්න බැහැ. ඕක තමයි තත්ත්වය. තමුන්නාන්සේලා මෙය තේරුම් නොගන්න එක තමයි තිබෙන දේ. අද විශාල සංවර්ධනයක් කියලා කියනවා. ඇත්ත. රටේ යම්කිසි සංවර්ධනයක් වෙනවා. මේ සංවර්ධනය හා සමානව මිනිසුන්ගේ ජීවිතවලට බලපාන විධියට සංවර්ධනයක් වෙලා නැහැ. මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් විධියේ සංවර්ධනයක්, මිනිසුන්ගේ ආර්ථිකයේ සංවර්ධනයක් වෙලා නැහැ. ඒකයි අපි කියන්නේ. පාරවල් හදන එක හොඳයි. කාපට් දාන එක හොඳයි. නමුත් මේ රටේ ජනතාව අවුරුදු 30 ක් පටි බැඳගෙන හිටියා. තමුනාන්සේලා දන්නවා. යුද්ධ කාලයේදී මහින්ද රාජපක්ෂ කිව්වේ පටිය තද කරගන්න. මම මේක ඉවර වුණු ගමන් බුරුල් කරනවා කියලා. හැබැයි, තවම ඒ පටිය බුරුල් කරගන්න බැරි වෙලා තිබෙනවා. බුරුල් කරගන්න බැරි ඇයි කියලා තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ ඇතුළු රජයට ආර්ථිකය කළමනාකරණය කරගන්න දන්නේ නැහැ. ඒකයි වැඩේ. අන්න ඒක තමයි වෙනස. යුද්ධය කළ එක වෙන දෙයක්. ආර්ථිකය හසුරන එක වෙන දෙයක්. අන්න ඒක හොඳට මතක තියා ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නායකත්ව මණ්ඩලයට මොකද වුණේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නායකත්ව මණ්ඩල අරවා මේවා නොවෙයි. ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගෙන එන්නේ නායකත්ව මණ්ඩලය ගැන යෝජනාවක් නොවෙයි. මෙය ඇවිල්ලා තමුන්නාන්සේලාට මේ රටේ ජනතාවගේ දුක දැනගන්න ගෙනාපු යෝජනාවක්. ඒ ජනතාවට අවශ්‍ය සහන ටික සලසලා දෙන්න කියලා ගෙනාපු යෝජනාවක්. වෙන බහු භූත නොවෙයි මේ පෙන්වන්නේ. තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න. තමුන්නාන්සේලාගේ ඡන්ද පදනම එන්න එන්න අඩු වෙන්නේ අන්න ඒක නිසයි. ජනතාව ගැන කථා කරද්දී පෙන්වන්නේ වෙන දෙයක්. ජනතාවගේ දුක කියද්දී තමුන්නාන්සේලා වෙන බහු භූත දොඩවන්නේ. ඕන්න ඕක තමයි තමුන්නාන්සේලාගේ තිබෙන වෙනස. ගරු සභාපතිතුමනි, අපි ඉල්ලා සිටින්නේ මේ රටේ ජනතාවට විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාව -

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා, අලිමංකඩ යනවා කියලා පාමංකඩ යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ කට්ටියක් ඔය පැත්තේ ඉන්නවා. ඒක මම දන්නවා. ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාවට, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාවට පමණක් නොවෙයි. මේ මුළු රටේම ජනතාවට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ආර්ථිකය හරියට කළමනාකරණය කරගන්න බැරි වීම නිසා. ඒක නිසා අපි ඡන්දය කාලයට විතරක් සහන ටිකක් දීලා මදී. අපි දැක්කා, භූමිතෙල් රුපියල් 20/- කින් අඩු කළා. භූමිතෙල් රුපියල් 20/- කින් අඩු කළාට බස්නාහිර පළාතේ ජනතාවට ඒකේ සහනයක් ලැබෙන්නේ නැහැ. අද ආණ්ඩුව කියන විධියට 97% කට විදුලිය දීලා තිබෙනවා නම් භූමි තෙල් රුපියල් 20/- කින් අඩු කළයි කියලා ජනතාවට ඇති සහනයක් ලැබෙන්නේ නැහැ. අන්න ඒක හොඳට මතක තියා ගන්න. ලයිට් බිල 25% කින් අඩු කළේ වෙන මොකටවත් නොවෙයි. ඊළඟ ජනාධිපතිවරණය එනවා. ජනාධිපතිවරණයෙන් පස්සේ ඔය 25% අල්ල ගන්න 50 කින් වැඩි කරනවා, තමුන්නාන්සේලාට බලය ලැබුණොත්. ඒක නිසා අපි කනගාටු වෙනවා. ලයිට් බිල කිය කියා, ලයිට් බිල කිය කියා අද විදුලිබල මණ්ඩලය ඉතාම විශාල පාඩුවක් ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. අපි දන්නවා,ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ, ඒකල ප්‍රදේශයේ රේඩියෝ සිලෝන් එකට අයිති අක්කර ගණනක ඉඩම අද වෙන්දේසි කරන්න පත්තරවල දාලා

තිබෙනවා. ටෙන්ඩර් දාලා. මෙතුමන්ලා බොරුවට බයිලා ගැහුවාට අද මේ රටේ තිබෙන සම්පත් ටික විකුණගෙන, මේ රටේ තිබෙන සියලුම හොඳම ඉඩම් ටික විකුණගෙන මේ රජයේ ස්වල්ප දෙනෙක් අද පෝසතුන් වෙලා තිබෙනවා.

අද ආර්ථිකය ගැන කථා කළාට අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අමතක වෙලා තිබෙනවා 90% ක්. 10% ක් මේ රටේ හොඳ ජීවිතයක් ගත කරනවා. ඒක අපි දන්නවා. ඒ දහය අතරට පාර්ලිමේන්තුවේ, මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලාට කොන්ත්‍රාත් හම්බ වෙනවා. පාරවල් හදන්න හම්බ වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට ප්‍රශ්නයක් නැහැ. අපට තේරනවා ඒක. විපක්ෂයේ ඉන්න අපට තේරෙනවා. ජනතාවගේ දුක. ජනතාවට තුන් වේල කන්න බැරි එක අපට තේරෙනවා. අන්න ඒක නිසා තමයි අපි කියන්නේ මේ රටේ සමස්ත ජනතාවට සහනයක් ලබා දෙන්න මේ රජය ක්‍රියා කළ යුතුයි. එහෙම ක්‍රියා කරන්න තවම හැකියාවක් ලැබිලා නැහැ. තමුන්නාන්සේලා කරන්නේ, මේ ළඟදී කොළඹ මුහුද අක්කර ගණනක් ගොඩ කරලා චීන්නුන්ට ලබා දෙන්න මේ ඊයේ පෙරෙයිදා ගිවිසුමක් ගැහුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ලංකාවට අයිති.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක ලංකාවට ලැබෙන්නේ නැහැ. ඒක චීනයට අයිතියි. තමුන්නාන්සේලා කියවලා බලන්න. හරියට Agreement එක කියවලා බලන්න කාටද අයිතිය තිබෙන්නේ කියලා. වරායවල් හැදුවයි කිව්වා. කොළඹ වරාය අයිති චීනෙට. කොළඹ වරාය විවෘත කරද්දී අඩුම ගණනේ ලංකාවේ කොඩියක්වත් දාන්න දුන්නේ නැහැ. ලංකාවේ කොඩිය ඔසවන්නවත් එතැන දුන්නේ නැහැ. මෙන්න මේක තමයි ඇත්ත තත්ත්වය. මෙහෙන් මුහුද චීනෙට දෙද්දී හම්බන්තොටින් අපේ තිබෙන ගොඩබිම මුහුදට දුන්නා. මොකද වුණේ? මුහුදට කපලා දීලා මුහුදට යා කෙරෙව්වා ගොඩබිම. අද ලංකාවේ සිතියම පවා වෙනස් කරන්න මහින්ද රාජපක්ෂට පුළුවන් වෙලා තිබෙනවා. මේ ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියපු එක දැන් මුතු ඇටයක් නොවෙයි. මුතු ඇටයෙනුත් කෑල්ලක් ගලවලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂගේ ආශ්චර්යය වන්නේ ලංකාව විකෘති කරපු එක විතරයි. ආර්ථිකය විතරක් නොවෙයි ලංකාවේ සිතියමත් විකෘති කරලා තමයි මහින්ද රාජපක්ෂ ගෙදර යන්නේ. ගරු සභාපතිතුමනි, මෙම කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නැවත වරක් මේ රටේ ජනතාවට ඉතාමත් කෙටි කාලීනව මේ සහන ලබා දුන්නේ නැත්නම් මේ රටේ නැවත වරක් අර 89 වාගේ, හැත්තෑ ගණන්වල වාගේ - අපට මතකයි, 71 පොලු යුගය. සීනි පොල්ල. හාල්ල පොල්ල. අපට මතකයි. අන්න එවැනි යුගයකට ඇවිල්ලා මේ රට තුළ නැවතත් ඉතාමත් විශාල භීෂණකාරී තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවට ඉතාමත් ඉක්මණින්ම ඒ අවශ්‍යා සහන ටික ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

[පූ.භා. 11.55]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම කනගාටු වෙනවා. අවුරුදු 10 ක් පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙක් වෙලා ඉඳලා, පළාත් සභා මැතිවරණ ජයග්‍රහණය කරලා බොහොම ගෞරවයෙන් තමයි අපි මේ පළාත් සභාව නියෝජනය කරන්න මේ ස්ථානයට ආවේ. අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපි පොඩි පවුල්වලින් එන මිනිස්සු. මම මේ ඉස්සෙල්ලාම මංගල කථාව පවත්වන්නේ. මට සහාය දෙන්න කියලා ඉල්ලා සිටිනවා. විපක්ෂය එතුමාට ඒ සහෝගය ලබා නොදුන්න එක ගැන මම කනගාටුව දක්වනවා. මොකද, මන්ත්‍රීවරයෙක් මාස ගණනක් ගිහිල්ලා තමන්ගේ මංගල කථාව කරනකොටවත් ඒ කථාව කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. එතුමා කිව්වා වාගේ අපි පොඩි පවුල්වලින් ඇවිල්ලා, මේ පළාත් පාලන දේශපාලනයේ ඉඳලා අපි පළාත් සභාවට ආවේ යමක් කරන්න. අපේ රටට, ප්‍රදේශයට හඬක් නඟන්න ආවේ. සමහර වේලාවට මේ ආවේ වැරදි ගමනක්ද කියලත් වේලාවකට හිතෙනවා. ඒ තරමටම පල්ලෙහා මට්ටමට මේ පළාත් සභාව වැටිලා තිබෙනවා. ඒ වාගේ මිනිස්සු හැසිරෙන්න හොඳ නැහැ. කෙනෙකුගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් තිබෙන්නට ඕනෑ.

ඉතින් මම හිතනවා, මේ විපක්ෂයේ අය කියනවා රටේ බඩු මිල ඉහළ ගිහිල්ලාය. එහෙම නැත්නම් මේ ජීවන බර වැඩි වෙලා කියලා කියනවා. යෝජනාව ගෙනෙන ලද අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් කථා කළා. අපි දන්නවා, පළාත් පාලන ආයතන - අද ඔබ කවුරුත් විමසිලිමත් වෙන්න. අද පළාත් පාලන ආයතනයකට ගිහිල්ලා බලපුවාම පළාත් පාලන ආයතනය ප්‍රදේශයේ වරිපනම් බදු, කඩ කුලී, එහෙම නැත්නම් යම් යම් බදු වලින් මුදල් අය කරලා ඒ ආයතන පවත්වාගෙන යනවා. ඒ යනවා විතරක් නොවෙයි. අද සම්ප්‍රදායෙන් මිදිලා කටයුතු කරනවා. රජය අද අපට, පළාත් පාලන ආයතනවලට ලක්ෂ කෝටි ගණන් දෙනවා සංවර්ධනය කරන්න. ඒ විධියට පාර හදන්න, ප්‍රජා ශාලාව හදන්න සල්ලි ලැබෙන කොට ආයතන ප්‍රධානීන් ඒ ප්‍රදේශයේ දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න, ප්‍රදේශයේ ස්වයං රැකියා පද්ධතිය ගොඩනඟන්න, ඒ ප්‍රදේශයේ යම් යම් ජීවන තත්ත්වයන් ඉහළ දාන්න කටයුතු කරනවා. විශාල වශයෙන් ඒ අය සහන ලබා දෙමින් කටයුතු කරනවා. ඒ වාගේම පළාත් සභා ගත්තත් ආදායම් උත්පාදනය කරන්නට ඕනෑ. ඒ වාගේම මේ ආදායම් උත්පාදනය කරනවා වාගේම මධ්‍යම රජය ගන්නා වූ යම් යම් තීන්දු තීරණවලට මම හිතන්නේ පළාත් සභාවට වගකීමක් ගන්න අපහසුකමක් තිබෙනවා. නමුත් අපි සාධාරණව පිළිගන්නට ඕනෑ. ජීවත්වීමේ ගැටලු, ඔබට, අපට මේ රටේ හැම කෙනාටම තිබෙනවා. අපි ඒ ජීවන බර අඩු කරන්න, ඒ ජනතාවට සහන දෙන්න අපි මොන විධියටද කටයුතු කරන්න ඕනෑ.

ඒ නිසා අපි දන්නවා මේ රට, ශ්‍රී ලංකාව කෘෂිකර්මයට ප්‍රධාන තැනක් දෙන රටක්. මේ රටේ මිනිස්සුන්ට ජීවන බර කියන එක එච්චර ගැටලුවක් වෙලා තිබුණේ නැහැ. මිනිස්සු එදා වේල හම්බ කරගන්න, එහෙම නැත්නම් ගොවිතැන් කරලා, හේන් ගොවිතැන් කරලා, යැපුම් කෘෂිකර්මය කරලා මේ රටේ ස්වයං පෝෂිත ආර්ථිකයක් ගොඩනඟලා තිබුණා. සංදේශ කාව්‍යය කියන්නේ වසු පැටියන්ගේ හඬ පිටතට ඇහෙන කොට, කුකුළන්ගේ හඬ ඇහෙන කොට අපේ ගමේ තිබෙන සරු භාවය අපට හොඳට දැණුනා. කවියෙන් එහෙම කිව්වා. නමුත් ඒ සියල්ල මේ රටෙන් මිදිලා ගිහිල්ලා තිබුණා. 1978 මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පස්සේ හැම කෙනෙක්ම මුහුද දිහා බලාගෙන ඉන්න ආර්ථික ක්‍රමයක් මේ රට තුළ ගොඩනැඟෙනවා. ගොඩනැඟුනාම මිනිස්සුන්ගේ විශ්වාසය මිනිස්සු බිඳ දමා ගන්නවා. කෘෂිකර්මයට මිනිස්සු ආයුබෝවන් කියලා අපේ රටේ කෙත්වතු ටික, අපේ රටේ කෘෂිකර්මයට තිබුණු යම් යම් ප්‍රවණතාවයන් බිඳ වැටීම තුළ මිනිස්සු මේ විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක වෙළඳපොළ ආර්ථිකයට ගිහිල්ලා, මිනිස්සු කඩෙන් බඩු මිලදී ගන්න ක්‍රමයක් මේ රට තුළ බිහි වුණාට පස්සේ තමයි මේ රටේ මිනිස්සුන්ට ජීවන බර දැණුනේ. මිනිස්සු එදා පොළට, කඩයට ගියේ ලුණු ටික, කරෝල ටික, දුම් කොළය ගන්න විතරයි. අද මිනිස්සු හැමදේම ගන්න කඩේට යන ආර්ථික ක්‍රමයක් මේ රට තුළ ක්‍රියාත්මක වන නිසා හැම කෙනාටම ජීවන බර පිළිබඳ ගැටලුවක් තිබෙනවා. අපි මේ ජීවන බර නැති කරන්නට මේ රටේ තිබෙන - මේ මන්ත්‍රීතුමන්ලා කථා කරනවා හාල් මිල ඉහළ ගිහිල්ලාය. වෙළඳ පොළ එළවළු මිල ඉහළ ගිහිල්ලාය. කාලීන වශයෙන් මේ රට තුළ ඇති වන්නා වූ යම් යම් මිල උච්චාවචනයන් උද්ධමනයට ගණනය කරන්න අපට පුළුවන්කමක් නැහැ. නමුත් අපි සමස්තයක් වශයෙන් බලන්නට ඕනෑ. මේ රටේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය වඩා ගොඩනඟන්නට රජයත්, පළාත් සභාවත්, පළාත් පාලන ආයතනත් වශයෙන් අපි මොනවාද කරන්න උත්සාහ කරලා තිබෙන්නේ. අපි දන්නවා, මේ රටේ මිනිස්සු අපි පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වශයෙන් ඉන්න කොට අපි සමහර විට දවසක්, දෙකක් යන්න බැරි වුණොත් සමහර විට ගොඩනැගිලි ඉල්ලුම්පත් ප්‍රමාණය ගොඩ ගැනෙනවා. අපට ඒ දවස්වල හිතා ගන්නවත් අමාරුයි. මේ මිනිස්සු ගෙවල් හදන්නද? තට්ටු දෙකට තුනට විශාල වශයෙන් ගෙවල් දොරවල් හදන්න ප්‍රවණතාවය දුන්නා ගම්බද ඉන්න පුංචි මිනිස්සු. ආර්ථික තත්ත්වය ගොඩනඟාගෙන, තමන්ගේ ජීවන තත්ත්වය ගොඩනඟන්නට නිවහනක් හදන්න, ඒ තත්ත්වයන් ගොඩනඟන්න කටයුතු කළා. මේවා තුළින් අපි එකිනෙක කල්පනා කරලා බලනකොට රටේ ජීවන බර වැඩි වෙලා තිබෙනවා. අපි එය පිළිගන්නට ඕනෑ. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. මෙය පාලනය කරන්න අපි මොනවාද කරලා තිබෙන්නේ?

ඔබ අද ගමකට ගිහිල්ලා බලන්න. සාමාන්‍ය දුප්පත් මට්ටමේ ඉන්න මිනිස්සුන්ට කුකුල් පැටියෙක් බෙදලා දීලා තිබෙනවා. එය පළාත් සභාවෙනුත් කරලා දීලා තිබෙනවා. මධ්‍යම රජයෙනුත් කරලා දීලා තිබෙනවා. අද මිනිස්සුන්ගේ ස්වයං පෝෂිත ගෘහ ආර්ථිකය, යැපුම් කෘෂි කර්මය මේ ගෘහ ඒකකය තුළ ගොඩනඟන්නට රජය අරන් තිබෙන වැඩ පිළිවෙළවල් මොනවාද? ධාන්‍ය ඇට ටික බෙදලා දීලා

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

තිබෙනවා. කිරි හරකා ලබා දීලා තිබෙනවා. එළුවා ලබා දීලා තිබෙනවා. කුකුල් පැටියා ලබා දීලා තිබෙනවා. නිවස හදාගන්න ආධාර උපකාර ලබා දීලා තිබෙනවා. ජීවන තත්ත්වය උසස් කරන්න ඒ අයට දෙන්න පුළුවන් සහයෝගය අපි රජයක් මගින් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. තමන්ගේ දැනට යම්කිසි හැකියාවක්, කුසලතාවයක් තිබෙනවා නම් එය වැඩි දියුණු කරගන්න, වෙල්ඩින් බාස්උන්නැහැ වෙන්න පුළුවන්. මේසන් බාස්උන්නැහැ වෙන්න පුළුවන්. සාරි වැඩ දාන කෙනෙක් වෙන්න පුළුවන්. කොණ්ඩය කපන කෙනෙක් වෙන්න පුළුවන්. මේ කෙනාගේ ස්වයං රැකියා පද්ධතිය වැඩි දියුණු කරගෙන, ඔවුන්ගේ ආදායම් තත්ත්වයන් ඉහළ දාන්නට රජයක් විසින් ජීවනෝපය සංවර්ධනය වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් හා උපදෙස්, උපදේශන ලබා දීලා කටයුතු කරලා තිබෙනවා. මේවා දිහා බලනකොට තමන් ආර්ථික වශයෙන් ගොඩනැඟෙන්නට ඕනෑ. තමන් මේ ස්වයං උත්පාදනය වෙනුවෙන්, ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් ගොඩනැඟෙන්නට ඕනෑ. අද පළාත් සභා මගින් ඉතා අඩු පොළියට ණය ක්‍රම හඳුන්වලා දීලා තිබෙනවා. ඒ වාගේම දිවිනැඟුම බැංකු පිහිටුවලා, ඒ වාගේම රුපියල් 5000/- සිට 50000/- දක්වා වර්ෂයක් මුදල් ගෙවීමෙන් තොරව 4% පොළියට මුදල් ලබා දීලා තිබෙනවා. මිනිහෙකුට ගතක් තිබෙනවා නම්, හිතක් තිබෙනවා නම්, හැකියාවක් තිබෙනවා නම්, උවමනාවක් තිබෙනවා නම් මේ ජීවන බරෙන් මිදෙන්නට, තමන්ගේ ආදායම් තත්ත්වයන් ඉහළ දමන්නට මේ රජය ඕනෑවටත් වඩා කටයුතු යොදලා තිබෙනවා. අපි දන්නවා, උදේ එළි වුණු වේලාවේ ඉඳලා අපි ළඟට නොයෙක් ආකාරයේ මිනිස්සු එනවා. ටකරන් තහඩු ඉල්ලනවා. වැසිකිළි පහසුකම් ඉල්ලනවා. විවිධ වූ දේවල්. ඔබ පක්ෂ භේදයකින් තොරව බලන්න. ඒ ඉල්ලන මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය. එක්කෝ ඒ මිනිස්සු මොනවා හෝ දුරාචාරයකට ගොදුරු වෙලා ඉන්නවා. මොනවා හරි දෙයකට. එක්කෝ බේබදුකම. එක්කෝ වෙනත් මොනවා හරි සූදුවට හරි, මොනවාට හරි යොමු වුණු මිනිහෙක් හැරෙන්න අනික් හැම කෙනෙකුටම ගොඩනැඟෙන්න පුළුවන්කම තිබෙනවා. මිනිස්සුන්ට උත්ථාන වීර්යය තිබෙන්න ඕනෑ. මිනිස්සුන්ට උවමනාව තිබෙන්න ඕනෑ. මේවාත් එක්ක මේ ආර්ථිකයට අපට දෙන්න පුළුවන් ශක්තිය බලන්නට ඕනෑ. අපේ දළ දේශීය නිෂ්පාදනය වැඩි කරන්න පුරවැසියන් වශයෙන් රජය දෙන මේ ශක්තිය තුළින්, අපි ශක්තිය දුන්නොත් ජාතික නිෂ්පාදනය වැඩි වෙනවා. ජාතික ආදායම වැඩි වෙනවා. එතකොට අපේ ඒකපුද්ගල ආදායම වැඩි වෙනවා. එතකොට අපි රටක් වශයෙන් ජීවන බර වැඩි වුණත් අපේ ආදායම් තත්ත්වය වැඩි වනකොට සමතුලිත වූ අපට එදිනෙදා ජීවිතයක් ගත කරන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ විතරක් නොවෙයි. රජය දිහා බලන කොට ඊයේ දවස වන කොට යාපනයට දුම්රියක් යනවා. මේ රටේ මහා මාර්ග පද්ධතිය හොඳින් හැදිලා තිබෙනවා. ගමට යනකොට සමහරවිට අද ගමක හදන්න පාරක් නැති තරමට පාර ගොඩනැඟිලා තිබෙනවා. පාසල්වල අධ්‍යාපනය වෙනුවෙන් වැඩි දියුණු කරන්න කටයුතු කරලා තිබෙනවා. රටක් වශයෙන් ගන්න කොට මේ ප්‍රදේශ සංවර්ධනය වෙලා තිබෙනවා. අපි ඒවා ඊර්ෂ්‍යාවෙන්, කුහකකමෙන් තොරව දකින්නට ඕනෑ. ප්‍රශ්නයක් තිබෙනවා නම්, ජනතාව වෙනුවෙන් එය අපි නැඟී සිටින්නට ඕනෑ. ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු මිනිස්සු වශයෙන් ජනතාවට වග කියන්න අපට අයිතියක් තිබෙනවා. හැබැයි, හැම දෙයක්ම ඉතාමත්ම විරෝධීව බලලා කටයුතු කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා මා දන්න හැටියට මම කියන්නේ, මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දීම නිසා ආර්ථික වශයෙන් මිනිස්සු මහා පල්ලෙහාට වැටුණා. මෙන්න මේ පල්ලෙහාට වැටුණු අපේකම ගොඩනඟන්නට මේ රජය විවිධ වූ උපක්‍රම උඩ කටයුතු කළත් තවමත් අපට අපහසු වෙලා තිබෙනවා. මම හිතන විධියට තව වසරක් දෙකක් යන කොට මේ ගෘහ ආර්ථිකය හා යැපුම් කෘෂිකර්මයත් අපට ගොඩනැඟෙන කොට ගෘහය තුළ යම්කිසි ආදායම් තත්ත්වයක් ගොඩනැඟෙනකොට මිනිස්සුන්ගේ ජීවන බරට උත්තරයක් ලැබෙයි කියන බලාපොරොත්තුව මට තිබෙනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි ආවේ ජනතාව වෙනුවෙන් යමක් කරන්න. ඒ ජනතාව වෙනුවෙන් හඬක් නඟන්න. අපේ ප්‍රදේශයේ මිනිස්සු වෙනුවෙන් යමක් කරන්න. ඒ දේ සඳහා මේ සභාව යම්කිසි ගෞරවනීය තත්ත්වයකට ගොඩනැඟෙයි කියන බලාපොරොත්තුවෙන්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ගෞරවයත් පුද කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.04]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි දේශපාලඥයෝ හැටියට කනගාටු වෙන්න ඕනෑ, අද ජනතාවට සහන ලබා දෙන්න කියලා බස්නාහිර පළාත් සභාවට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට සිදු වීම සම්බන්ධව. මොකද, ජනතාව ඒ තරමම පීඩනයෙන් මිරිකිලා ඉන්නේ. විශේෂයෙන්ම අද කිසියම් හෝ කෙනෙක් උදේ පාන්දර නැඟිට්ටාම කියනවා, කාපට් පාර දිගේ යන්න. කාපට් පාර දිගේ පොළට ගිහිල්ලා බඩු ගන්න ගියාම බඩු ගන්න ප්‍රමාණවත් තරම් මුදල් නැති ආර්ථිකය ජනතාවට මුහුණපාලා තිබෙනවා. ඊළඟට ඒ සියලු වැඩ කටයුතු අවසානයේ ඒ කාපට් පාර දිගේ ගිහිල්ලා කරලා ගෙදර ගියාම අඩුම තරමින් රාත්‍රී ආහාර වේලවත් තමන්ට රිසි සේ ගන්නට බැරි තත්ත්වයකට අද ජනතාව පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 2009 යුධ ජයග්‍රහණයෙන් පස්සේ මේ ආණ්ඩුවට ඒ ලැබුණු ජනවරමත්, ඊට පස්සේ විකෘති කරලා ලබා ගත්ත 2/3 ත් නිසා අද මේ ආණ්ඩුව ඒකාධිපති ගමනක් යන නිසා තමයි මෙවැනි තත්ත්වයක් අද රට පුරා නිර්මාණය වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම විකෘති කරපු 2/3 ලබා ගැනීම නිසා මේ ආණ්ඩුව තමන්ට ඕනෑ ඕනෑ දේවල් කරන්න පුළුවන්, තමන්ට හිතුණු හිතුණු දේ කරන්න පෙළඹෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද ලෝකයේ අපි කන බොන ආහාරපානවලට වැඩි පුරම බදු ගෙවන රට බවට පත් වෙලා තිබෙන්නේ ලංකාවයි. ඇත්ත වශයෙන්ම කිව්වොත් එකම රට ලංකාව. විශේෂයෙන්ම අපි මිලදී ගන්න පරිප්පු, -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සංඛ්‍යා ලේඛන නැතිව බොරු නම් කියන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සීනි, තුනපහ මේ ආකාරයේ සියලු දේවල් සඳහා - ඔබතුමාට අවශ්‍ය නම් සංඛ්‍යා ලේඛන මම පස්සේ දෙන්නම්. මේ සියලු දේවල්වලට බදු ගහන එකම රට ලංකාවයි. විශේෂයෙන්ම ගත්තොත් (බාධා කිරීම්) සංඛ්‍යා ලේඛන දෙන්නම්. දැන් මේ ආණ්ඩුව මෙච්චර බදු ගහන්නේ ඇයි? දැන් ආඩම්බරකාර තාත්තා තමන්ගේ දරුවන් සැප විඳිද්දී අනුන්ගේ දරුවන්ට, අපේ රටේ සාමාන්‍ය දරුවන්ට කිරි පිටි ටික බොන්න බැරි තත්ත්වයට පත් කරලා තිබෙනවා. මේ ආඩම්බරකාර තාත්තාගේ දරුවෝ ලක්ෂ 1 1/2 සපත්තු දාද්දී අනුන්ගේ දරුවන්ට සපත්තුවක් තියා සෙරප්පු දෙකක්වත් දාන්න බැරි ආර්ථිකයක් කරා මේ රට ගෙනිහිල්ලා තිබෙනවා. අනික් පැත්තෙන් තමන්ගේ දරුවෝ මිලියන 900 කට ලැම්බෝගිනි ගෙනැල්ලා කාර් රේස් පදිද්දී අනික් දරුවන්ට පුට් සයිකලයක්වත් ගන්න බැරි ආර්ථිකයක් බවට පත් කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම කනගාටු වෙනවා. අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, ජනතාව තමන්ට කරන්න බැරි දේවල් ආශාවන් වැඩිපුර කරන්න ගිහිල්ලා තමයි මේ තත්ත්වය මතු වෙලා තිබෙන්නේ කියලා. මොබයිල් ෆෝන් එකක් පාවිච්චි කරන්න බැරි ජනතාවක් ඉන්න ඕනෑය කියලා එතුමා විශ්වාස කරනවා වාගේ මට පෙනෙන්නේ. ඒ වාගේම මිනිස්සු හැමදාම යන්න ඕනෑ බයිසිකලයක කියලා එතුමා විශ්වාස කරනවා වාගේ පෙනෙන්නේ. මෙහිදී අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ. සංවර්ධනය කරන්න. පාරවල් හදන්න. කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, ඒ එක්කම ඊට කලින් ජනතාව ජීවත් කරවන්න ඕනෑ. හැබැයි, මේ ආණ්ඩුව සංවර්ධනය මුවාවෙන් කරන්නේ පාරවල් හදනවා, හදනවා, හදනවා. ඉවරයක් නැහැ. මොකද කරන්නේ? ලොකු තැන සිට පොඩි තැන දක්වා සාක්කු පුරවා ගන්න තමයි මේ සංවර්ධනය සිද්ධ කරන්නේ. අඩුම තරමින් මේ හදන පාරවල්වල අපේ රටේ තරුණ තරුණියන්ට රැකියා අවස්ථා කීයක් ලැබිලා තිබෙනවාද කියලා මම ප්‍රශ්න කරන්න කැමැතියි. ඒ වෙනුවට චීනෙන් ලබා ගන්නා ගිනි පොලී ණයත්, ඒ ශ්‍රමයත් - චීනයේ හිරකාරයෝ අරගෙන නැවත චීනයට ලබා දීමේ වැඩ කටයුත්ත මේ ආණ්ඩුව සිද්ධ කරන්නේ.

මේ ආණ්ඩුව මේ යුද්ධයෙන් පස්සේ තමන්ට කරන්න පුළුවන් කියලා අද එක දෙයක් ඔප්පු කරලා තිබෙනවා. ඒ තමයි හොරකමේ කප් එක ගහන්න තමන්ට පුළුවන් කියලා ඔප්පු කරලා පෙන්නලා තිබෙනවා. යටි මඩි ගහන්න කප් එක තමන්ට ගන්න පුළුවන් කියලා ඔප්පු කරලා තිබෙනවා. විශේෂයෙන්ම (බාධා කිරීම්) 2009 යුද්ධයෙන් පස්සේ අවුරුදු 05 ක් යනකොට ජනතාව මේ යථාර්ථය තේරුම් අරගෙන තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි ඌව පළාත් සභාවේදී මේ ඉරණම අත් වුණේ. විශේෂයෙන්ම

[ ගරු එස්.එම්. මරික්කාර් ]

1970 දී පත් වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව මෙන්න මේ ආකාරයෙන් හාල් පොලු, මිරිස් පොලු තියාගෙන සිටිය යුගයක තමයි එදා ජේ.ආර්. ජයවර්ධන විපක්ෂ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස්වෙලා ජනතාවට සහන ලබා දීමේ සටන ජනතාවත් එක්ක එදා දකුණු කොළඹින් පටන් ගත්තේ. 1975 ඒ ජයග්‍රහණය අරගෙන අවුරුදු දෙකක් යන්න කලින් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා. අන්න ඒ වාගේ තමයි අද හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ජනතාව පීඩනයකට පත් වෙලා ඉන්න වේලාවක විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට තම පාර්ලිමේන්තු අසුන කැප කරලා එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් ලාංකීය ජවනතාවගේ ආර්ථික ජයග්‍රහණ උදෙසා වාගේම අධ්‍යාපන ජයග්‍රහණ, සංස්කෘතික ජයග්‍රහණ ලබා ගැනීම උදෙසා එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීමේ ගමන ආරම්භ කරන්න උත්සාහ කරනු ලැබුයේ.

විශේෂයෙන්ම අද මේ රටේ එක්සත් ජාතික පක්ෂයට නැහැයි කියපු සිංහල බෞද්ධ ග්‍රාමීය ඡන්ද පදනම මෙවර ඌව පළාත් සභාවේදී අපට ලබා ගන්න පුළුවන්කම තිබුණා. ඒකට හේතුව මොකක්ද? දැන් මේ ආඩම්බරකාර තාත්තා, යුද්ධය ඉවර කරපු දේශප්‍රේමියාට දුන්න ජනවරම අද අරගෙන මොකද කරලා තිබෙන්නේ කියලා ජනතාව දන්නවා. ඡන්දයට දවස් දෙකකට කලින්න චීනයේ ජනාධිපතිවරයා ගෙනැල්ලා ඉන්ධන මිල අඩු කරනවා, විදුලි බිල අඩු කරනවා කියලා මානසික අල්ලස් ජනතාවට ලබා දුන්නා. අනික් පැත්තෙන් මොකක්ද කළේ? ඒ අස්සේ හොර ගිවිසුමක් ගැහුවා. අක්කර 500 කට පෝට් සිටි කියලා දූපතක් ගහන්න. මේ හෙක්ටයාර් 233 - අපේ පළාත් සභාවේ ගරු අමාත්‍ය උදය ප්‍රභාත් ගම්මන්පිල ඇමැතිතුමාගෙන් මම රූපවාහිනී විවාදයකදී ඇහුවා, එතුමා එක උත්තරයක්වත් දුන්නේ නැහැ. මේ ගිවිසුම, මම ඉතාම වගකීමෙන් කියනවා. මේ සමාගම ලෝක බැංකු අසාදු ලේඛනයකට ගත කරලා තිබෙන CCC කියන සමාගමට ලබා දීලා මේ හෙක්ටයාර් 233 න්, විශේෂයෙන්ම 125 යි ලංකාවට අයිතියි. ඉතිරි හෙක්ටයාර 108 න් 88 ක් 99 අවුරුද්දක් යන තුරු චීනයට අයිතියි. ඉතිරි හෙක්ටයාර 20, ඒ කියන්නේ අක්කර 42 ක් පමණ සාදාකාලිකව චීනයට අයිතියි. ශ්‍රී ලංකා කොඩියවත් උස්සන්න හම්බ වෙන්නේ නැහැ. දේශප්‍රේමියා මෙන්න මේ විධියට තමයි අපේ රට චීනයට පවා දීලා තිබෙන්නේ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. අන්න ඒ නිසා අද මේ රට මේ දේශප්‍රේමීන් චීනයට අපේ රට පවා දෙන විධිය, ජනතාව බදු බරෙන් මිරිකන විධිය, දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන විධිය, ආසියාවේ ආශ්චර්යය බවට මේ රට පත් කරනවා කියපු මේ රාජපක්ෂ පාලනය ආසියාවේ කුඩු කේන්ද්‍රස්ථානය බවට, ආසියාවේ කැසිනෝ කේන්ද්‍රස්ථානයක් බවට, ආසියාවේ ගණිකා කේන්ද්‍රස්ථානයක් බවට පත් කරගෙන යන බව අද මේ රටේ ජනතාව දන්නවා. මෙතුමාට බලා ගන්න පුළුවන් මැතිවරණය ආවාම. (බාධා කිරීම්) අන්න ඒ නිසා අද මේ යථාර්ථය ජනතාව තේරුම් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නිතරම සභා රීති කඩ කරනවා. මම ඉතාම ගෞරවයෙන් යුතුව කියනවා. එහෙම කරන්න එපා. මූලාසනයත් කථා කරන කථිකයාත් මැදින් ගමන් කිරීමෙන් වළකින්න. අනික් කාරණාව මම දැක්කා, උදේ මම මේ සභාවෙන් බැහැරව තේ විවේකයට යන කොට ඔබතුමා පුටුවෙන් නැඟිට්ටේ නැහැ. ඔබතුමා පුටුවේ වාඩි වෙලාම සිටියා. මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම ඒ ගැන සමාව ඉල්ලනවා. මොකද, මම ඒ අවස්ථාවේ වෙනත් වැඩක යෙදී සිටියා. ඊට පස්සේ ඔබතුමා යනකොට-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනයට ගරු කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න. ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, අන්න ඒ නිසා අද මේ ආණ්ඩුව විකෘති කරපු 2/3 අරගෙන මේ රටේ ජනතාව, ඒ විතරක් නොවෙයි මේ රටේ අනාගත දරු පරපුරත්, උපදින්න ඉන්න දරු පරපුරත් ණයකාරයෝ බවට පත් කරලා තිබෙන වගත්, ජනතාවට අද තුන්වේල වෙනුවට දෙවේලවත් කන්න බැරි ආර්ථිකයක් නිර්මාණය කරලා තිබෙන බවත් අද මුළු රටේම ජනතාව තේරුම් අරන් තිබෙනවා. අන්න ඒ නිසා තමයි ආණ්ඩුව ඡන්ද කඩ කඩ තියලා, සැරින් සැරේ තියලා ඒ අයට ජනමතය බලා ගන්න පුළුවන් කියලා අන්තිමට ඇවිල්ලා කොට්ටෝරුවා කෙහෙල් ගහේ පැටලුනා වාගේ ඌව පළාතේදී පැටලුනා. මේ ආණ්ඩුව හිතුවේ ඌවේ ඉන්නේ බයියෝ කියලා. හේන් ගොවිතැන විනාශ වෙලා, වී ගොවිතැන විනාශ වෙලා. ඒ විතරක් නොවෙයි. අද හාල් කිලෝව රුපියල් 85/- ට ගියේ කොහොමද? වී ගොවිතැනින් එන අස්වැන්න එතනෝල් හදන්න - අපි කියන්න කැමැතියි. ආණ්ඩුවේ ප්‍රබලයින්ගේ බිරින්දෑවරුන් අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉන්න සමාගම්වලට වී ගොවිතැන ලබා දීලා තමයි, එතනෝල් හදන්න දීලා තමයි හාල් කිලෝව රුපියල් 85/- ට දෙන්නේ. අවසාන වශයෙන් කියන්න ඕනෑ, ඌව පළාතෙන් ඉගෙන ගත්තු පාඩම. ඌව පළාතෙන් ලැබෙන පණිවිඩය මොකක්ද? ජනතාව ප්‍රශ්න ගොඩක මිරිකිලා ඉන්නේ. ඒ ප්‍රශ්නවලට ජනතාවට ඉතාම ඉක්මණින් විසඳුම් අවශ්‍යයි. අන්න ඒ නිසා තමයි පසුගිය අවුරුදු 20 තුළ පැවැති මැතිවරණවලදී තනි පක්ෂයක් හැටියට වැඩිම ඡන්ද ප්‍රතිශතය ගත්තේ එක්සත් ජාතික පක්ෂයය. ඒ කියන්නේ මොකක්ද? ඕන්න බබෝ අලි එනවා කියන එක තමයි මේ පෙන්වන්නේ. ඒ නිසා ලබන අවුරුද්දේ එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා යටතේ මේ සියලු සහන අපි ලබා දෙනවා කියන එක පැහැදිලිව අපි කියන්න ඕනෑ. බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මුලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 06 කාලයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මම මේ අහන්නේ. අපේ මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවල නිලධාරීන්ගේ සේවක අර්ථක සාධක අරමුදල් සඳහා කපා ගත්ත මුදල් පිළිබඳව. මේ පිළිබඳව අපි ලේකම්තුමා හරහාත් කම්කරු කොමසාරිස්වරයා සමඟත් සාකච්ඡාවක් කළා. කණ්ඩායමකට ලියුම් ඇවිල්ලා තිබෙනවා. තවත් කණ්ඩායමකට එහෙම ඇවිල්ලා නැහැයි කියලා ගරු මන්ත්‍රීවරු ගණනාවක් මාව දැනුවත් කළා. මේ පිළිබඳව සොයා බලලා එහෙම කොටස් වශයෙන් එනවා නම් ඒක නිවැරැදි කරලා, ඒ කාර්ය මණ්ඩලවල සියලුම සාමාජිකයන්ට අවශ්‍ය මුදල් ගෙවීම සඳහා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා හැටියට එය අපි සාකච්ඡා කරලා විසඳන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණාව සම්බන්ධයෙන් මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ කාරණාවේදී පසුගිය දිනක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජෙනරාල් කාර්යාලයට මේ සම්බන්ධයෙන් කථා කළා. එතැන ප්‍රධාන ලිපිකරු මහත්මා කිව්වේ කාර්ය මණ්ඩලයේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඊට පස්සේ Accountant ට කථා කළාම Accountant කිවේ එහෙමයි. පස්සේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල් කිව්වේ, නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ. සල්ලිත් තිබෙනවා. මොකද

[ ගරු ජගත් කුමාර ]

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මාත් එක්ක Channel එකක විවාදයකදී කිව්වා, මේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් කියලා. ආණ්ඩුවේ නොවෙයි. ඒ ආයතනය ඇතුළේ ප්‍රශ්නයක්. හැබැයි, අපේ මැදිහත්වීමත් අපේ පැත්තෙන් හරියට වෙලා නැහැ. මම කථා කළාම මට දැනුන දේ තමයි, ඉක්මණට කරගන්න පුළුවන්. ඒ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජෙනරාල්තුමා කිව්වා, එවන්න ඒ තොරතුරු ටික. අපි ඉක්මණින් කරලා දෙන්නම් කියලා. ඒ නිසා අපේ මැදිහත්වීම ඉක්මණින් කළොත් අපේ කාර්ය මණ්ඩලවල ගෙවීම් ඉක්මණට කරගන්න පුළුවන් වෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මේක ආණ්ඩු පක්ෂයේ විතරක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ දෙපැත්තේම යම් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඉතිරි ටික ලබා ගන්න අපි හැකි ඉක්මණින් ක්‍රියා කරනවා කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.15]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත් වැදගත් යෝජනාවක් අපේ හිටපු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තටම එතුමා මෙවැනි වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා සාකච්ඡා කරන අවස්ථාවේදී එතුමාගේම පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු මේ විෂයයට අනුව කථා නොකර එතුමා කරපු යෝජනාවත් නිකන් හැල්ලුවට ලක් කරලා තිබෙනවා. ඉතින් ඇත්තටම එතුමා මේ යෝජනාව මඟින් ඉල්ලා සිටින්නේ මේ පළාත් සභාව මැදිහත් වෙලා මේ ජීවන බර අඩු කරන්න කටයුතු කරන්නය කියලා. ඇත්තටම දැන් මේ දවස්වල අපේ එක්සත් ජාතික පක්ෂයේ සහෝදරවරු අවුරුදු 20 කට ආසන්න කාලයක් නිදාගෙන ඉඳලා, දැන් නැඟිටලා බොහොම ප්‍රමෝදයෙන් පුබුදලා ඉන්නේ. ඒ නිසා තමයි කොළඹ චිකාගෝ එකේ අලුත් සංවිධායක හැටියට පත් වුණු අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමා බොහොම වේගයෙන්ම කථාවක් කරන්න යෙදුණේ, ඒ උද්දාමයේ ප්‍රතිඵලයක් හැටියට කියලා මම කියන්න කැමැතියි.

මම හිතන්නේ මෙහෙමයි. දැන් අපි කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මේ සභාවට ඇවිල්ලා ජීවන වියදම ගැන කථා කරන්න කිසිම ශුද්ධ වූ අයිතියක් නැහැ. මොකද, අපට මතකයි, පසුගිය 17 අවුරුදු පාලන කාලය තුළදී මේ රටේ තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ඉල්ලලා පාරට බැහැපු රජයේ සේවකයන්ට සලකපු ආකාරය ඒක. මේ රටේ ජනතාවට තවම අමතක වෙලා නැහැ. පාතාලය දාලා බයිසිකල් චේන්වලින් මේ රටේ ජනතාව මර්දනය කරපු එක්සත් ජාතික පක්ෂය අද මේ සභාවේ ඇවිල්ලා කිඹුල් කඳුළු හලලා මේ රජය විවේචනය කරලා ජනාධිපතිතුමා විවේචනය කරලා මේ රටේ ජනතාවගේ මතය වෙනස් කරන්න උත්සාහ කෙරුවාට මේ රටේ ජනතාව ඒ තත්ත්වයට පත් වෙන්නවත් එක්සත් ජාතික පක්ෂයට මේ රටේ පාලනය ලබා දෙන්නවත් කොහෙත්ම සූදානම් වෙන්නේ නැහැ.

අපට මතකයි. ඔය කථා කරන, කිඹුල් කඳුළු හෙළන විපක්ෂ නායකතුමා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පසුගිය කාලයේ, භීෂණ කාලයේ මේ රටේ මොනවාද කළේ කියන එක. ඒ දවස්වල බටලන්ද වධකාගාරය හදලා, මේ රටේ තරුණ පරම්පරාව සමූල ඝාතනය කරලා, මිනිස් සංහාරයක් කරපු බව මේ රටේ ජනතාවට තවම අමතක වෙලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද මෙතුමන්ලා රජයේ සේවකයන් ගැන කථා කරනවා. අද රජයේ සේවකයන් සම්මුඛ පරීක්ෂණ තියලා, සුදුස්සන්ට සුදුසු තැන ලබා දෙන්න අද මේ රජය කටයුතු කරලා තිබෙනවා. අද ග්‍රාම නිලධාරි කෙනෙක් එන්න ඕනෑත් තරග විභාගයකට ගිහිල්ලා. එදා මොකක්ද කළේ? අර විශේෂ නිලධාරී දාලා වගා නිලධාරීවරුන් ග්‍රාම නිලධාරීන් බවට පත් කරලා එක්සත් ජාතික පක්ෂයට කඩේ ගිය හෙංචයියලාට ග්‍රාම සේවක තනතුරු ලබා දුන්න එක්සත් ජාතික පාක්ෂිකයන්ට මේ සභාවේ ඉඳගෙන මහින්ද රාජපක්ෂ රජය විවේචනය කරන්න අයිතියක් නැහැයි කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක අමතක කරන්න එපා. මේ රටේ ගෝනි බිල්ලෝ එවලා අහිංසක, උගත් දරුවන් ඝාතනය කරලා අර රුසියාවේ මැක්සිම් ගෝර්කිගේ අම්මා කියන කෘතිය ගෙදර තියා ගත්තා කියලා අහිංසක දරුවන් අරගෙන ගිහිල්ලා, ගමේ ග්‍රාමසේවකගේ එක්සත් ජාතික පක්ෂ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමා ඕක කියන්නේ 12 වැනි වතාවට.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

පොලිසියත් එක්ක ඇවිල්ලා, ගමේ අහිංසක දරුවන් පැහැරගෙන ගිහිල්ලා පාරේ අයිනේ තියලා බෙලි කපලා, වෙඩි තියලා මැරුව එක්සත් ජාතික පක්ෂ පාලනය මේ රටේ ජනතාවට අමතක නැහැයි කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඒ දඩයමට ලැහැස්ති වෙන්නේ. කොන්ද කැඩිච්ච එක්සත් ජාතික පක්ෂය හරීන්ව දාලා - හරීන්ව දාන්නේ නැතිව සජිත්ව දාන්න තිබුණා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා නැඟිටලා කථා කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මළල ක්‍රීඩකයෙක්. මම ඉස්කෝලේ යන කාලයේ මීටර් 100 දුවපු කෙනෙක්. අපි දන්නවා, මීටර් 100 දුවන කොට, දුවන අනෙක් ක්‍රීඩකයත් එක්ක ඇවිල්ලා Neck එක දැම්මා නම් එයා පළමුවැනියා. එතැන කියන්නේ නැහැ, මෙච්චර ප්‍රතිශතයක් ඇවිල්ලා තිබෙනවා. මෙච්චර ධාවන වේගයක් තිබෙනවා කියලා එතැන කථා කරන්නේ නැහැ. බෙල්ල දාලා හරි පළමුවැනියා වුණු කෙනා තමයි පළමුවැනියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපි සෑම මැතිවරණයක්ම ජයග්‍රහණය කරලා තිබෙනවා. අපි අනික් පළාත් සභා දින්නා. නැගෙනහිර පළාතත් අපි දින්නා. ඌව පළාතත් අපි ජයග්‍රහණය කළා. ඒ නිසා අර එස්.බී. දිසානායක ගරු ඇමැතිතුමා කියනවා වාගේ එක්සත් ජාතික පක්ෂය පසුගිය මැතිවරණයට වඩා මේ මැතිවරණයෙන් 20% ක් අරගෙන අපට ළඟට ඇවිල්ලා තිබෙනවා. හැබැයි මේ ළඟට ආවාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව අවුරුදු 20 ක් ගියත් අපව Overtake කරන්න මේ එක්සත් ජාතික පක්ෂයට හැකියාවක් නැහැයි කියන එක අපි මතක් කරනවා. පළාත් සභා ක්‍රමය පිළිබඳව, මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන කොටම මේ එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවේ -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

හිතේ දුකට කවි කියැවෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

අගමැති ධූරය දරපු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව එදා අපිත් එක්ක පාර්ලිමේන්තු පාරේ අත්වැල් බැඳගත්තා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව අපේ රටේ ජනතාව තුළ පැහැදීමක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒ නිසා ඌව පළාත් සභාවේ ප්‍රතිඵලය මේ රටේ ජාතික මැතිවරණවල ප්‍රතිඵලයට සමාන කරන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා සභාව විහිළුවට ගන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපහාස කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරලා දාන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපහාස කිරීම නවත්වන්න. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම කථා කරන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව ඉක්මන් කරන්න. කාලය සීමිතයි.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අහලා තිබෙන විධියට, මම දැකලා තිබෙන විධියට ලෝකයේ ඉතාමත්ම බුද්ධිමත් දේශපාලනය වේවා, වෙනත් වෘත්තීය වේවා, කොටම මිනිස්සු තමයි වැඩකාරයෝ. ජේ.ආර්. ජයවර්ධන මොනවා කළත්, රණසිංහ ප්‍රේමදාසගේ පෙට්ට්‍රල්වලින් තමයි අදත් එක්සත් ජාතික පක්ෂය දුවන්නේ. ඒ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා උස එක්කෙනෙක්ද? නැහැ. අපි ඒකට ලැජ්ජා වෙන්නේ නැහැ. මේ මාගේ කොට කමින් මට කරන්න පුළුවන් දේවල්, මගේ දේශපාලන ජීවිතයේ මම කරපු දේවල්වලින් එක මයිල් ගහක් මෙතුමා කරලා නැහැ. මම තමුන්නාන්සේට අභියෝග කරනවා. අද ඌව පළාතේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය අතුගාලා දාලා තිබෙන්නේ. ලබන සැරේ මෙතුමාට පක්ෂයක් මාරු කරන්නේ නැතිව, මගේ අර හමුදා සහෝදරයා මට සමාවෙන්න. මම ඔබතුමාට ගරු කරනවා. මම අභියෝග කරනවා ලබන සැරේ පළාත් සභා මැතිවරණයෙන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉසුර ගරු මන්ත්‍රීතුමා 07 ක් ගන්නවා කිව්වා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමා නියෝජනය කරන ආසනයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා හැටියට පත් වෙන්න කියලා මම එතුමාට අභියෝග කරලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනාධිපතිරවණයට තිබෙන හයට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

අද ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මේ රටේ ජනතාව පිළිගන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

ඌව පළාතේ ප්‍රතිඵලයට මගේ කොටෙන් වන්දි ගෙවන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඌව පළාතේ එතුමන්ලාට වුණු වැරැද්දට මගේ උසෙන් වන්දි ගෙවන්න බැහැ.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාට අපේ ආණ්ඩු පක්ෂයේ වේලාවෙන් විනාඩි 03 ක් වැඩිපුර ලබා දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පුළුවන් තරම් මාතෘකාවට අනුව කථා කරන්න ඔබතුමා උත්සාහ කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාවට බාධා කරන්න එපා. ඔබතුමා මාතෘකාවට අනුව කථා කරන්න පුළුවන්තරම් උත්සාහ කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා රීතිවල තිබෙනවා, කිසිම මන්ත්‍රීවරයෙකුට බාධා කරන්න බැරි සභාවේ මාතෘකාවට අදාළව කථා කරනවා නම් විතරයි. මෙහි සඳහන් වෙනවා,

*"අදාළ විෂයෙන් පිටස්තරව කථා නොකරන්නේ නම් ඔහුට බාධා නොකළ යුතුයි."*

මාතෘකාවට පිටින් කථා කරනවා නම් බාධා කිරීමේ හැකියාව තිබෙනවා. මාතෘකාවෙන් පිට කථා කරනවා නම් බාධා කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ජාතියට ආදරය කරන මේ රටේ පුරවැසියෙක් හැටියට එදා පශ්චාත් යුධ සමයේදී අපේ යුධ හමුදාපතිවරයා හැටියට ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා කරපු සේවය මම අගය කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඊට පස්සේ හිරේ දැම්මා නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

පක්ෂ දේශපාලනයෙන් තොරව. හැබැයි මම කියන්න ඕනෑ. එහෙම කියන ගමන්ම එදා කොන්ද පණ තිබෙන, එයාට ආරක්ෂාව සපයන අර රණවිරුවා, අර ලස්සන, ද්‍රවිඩ ස්ත්‍රීය ඇවිල්ලා මේ හමුදාපතිතුමාට ලං වෙන කොට දැකලා, ඒ ආරක්ෂාවට හිටපු රණවිරුවා දැකලා පයින් නොගහන්න අද සරත් ෆොන්සේකා කෙනෙක් ජීවත් වෙන්නේ නැහැ. හැබැයි, ඒ ආරක්ෂාවට හිටපු අපේ හමුදා සොල්දාදුවා නොදැක, ඒ සුරුපිනී ද්‍රවිඩ ස්ත්‍රියව ඔය කියන මෙතුමාගේ නායකයා, හමුදාපතිවරයා දැක්කා නම් එහෙම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඒක නැහැයි කියලා කාටවත් කියන්න පුළුවන්කමක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණාකර ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

මේ අපේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අනුව ජීවන බර අඩු කරන්න, කටයුතු කරන්න පුළුවන් නම් ඒක කරන්න අපේ සහයෝගය අපි දක්වනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හොර වැඩ නවත්වන්න කියන්න. අඩු කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

තමන්ගේ දේශපාලන ස්ථාවරය විනාශ වන කොට -

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒක විකෘති කරලා

[සභාවේ ඝෝෂා]

අපි පැහැදිලිව කියනවා. අතිගරු ජනාධිතිතුමාගේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ඉල්ලා අස් කරගන්න කියන්න. ඒක සාධාරණ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා රීතිවල සඳහන් වෙනවා, සභාවේ නැති කිසි කෙනෙක් ගැන සඳහන් කරලා කාරණා කියන්න බැහැයි කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතින් යම්කිසි පක්ෂ නායකයෙකුට. යමක් එල්ල වුණා නම්, වැරැද්දක් වුණා නම් එය ඉල්ලා අස් කරගන්න කියලා දැනුවත් කරනවා. ඔබතුමා ඒ ආකාරයෙන් ප්‍රකාශයක් කළා නම්. මම හිතන්නේ වැරැදි චේතනාවෙන් කළේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම වැරැදි ප්‍රකාශ කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, පක්ෂග්‍රාහී වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරුන්ටද කාර්යාලයේ කාමරය මාරු වුණේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාව මම හිතන්නේ කාටවක්වත් මඩ ගහන චේතනාවෙන් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාවා නොවෙයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආපු වේලාවේ ඉඳන් හැසිරෙන්නේ, පිස්සෙක් වාගේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමානේ පිස්සා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම මේ සභාවේ ඉල්ලා අස් කරගන්න වචන කියන මනුස්සයෙක් නොවෙයි. මම වැරැදි වචනයක් පාවිච්චි කළේ නැහැ. එය මේ රටේ ඕනෑ පොඩි එකෙක් පවා දන්නවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා,

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

සරත් ෆොන්සේකා දැක්කා නම් එහෙම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව පොඩ්ඩක් නවත්වන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමාට ගරු කරලා නවත්වන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවේ රටේ ජනතාවගේ යහපත සඳහා හොඳ චේතනාවකින් යම්කිසි තීන්දු තීරණ ගැනීම සඳහා. එහෙම ගෙනාපු යෝජනාව වෙන පැත්තකට හරවලා, දෙපැත්තෙන්ම මඩ ගහලා අවසන් කරන තත්ත්වයට නැතිව මේ යෝජනාවේ යම්කිසි හොඳ පැත්තක් තිබිලා සංශෝධනය කරලා ඒක ජනතා සුභවාදී ආකාරයේ පැත්තට හරවන්න කියන ඉල්ලීමයි අපි ඉල්ලන්නේ. ඒක නිසා එතුමාගේ යෝජනාවට ගරු කරලා යෝජනාවට අනුව කථා කරන්නය කියලා මම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉල්ලා අස් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එතකොට අර කොටා කියපු කෑල්ලත් ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඒ කොටස ඉල්ලා අස් කර ගත්තා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොටා විතරයි කිව්වේ. ඉසුර මන්ත්‍රීතුමා කොටා කිව්වේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්නේ මොකක් සම්බන්ධයෙන්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම හිතන්නේ මේ ප්‍රස්තුථ කාරණයට අදාළවමයි. මම හිතන්නේ අපි යම්කිසි පුද්ගලයෙක් පිළිබඳව කථා කරනකොට මම අහගෙන සිටියා. සුරූපී කාන්තාව සිප වැළඳ ගන්නවා කිව්වා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

දේශන පැවැත්වීම තහනම්. අපේ රීතිවල දේශන පවත්වන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා. ඒක දැන් හෝද හෝද මඩේ ගහන්න ඕනෑ නැහැ. ඒ කථාව අපි හැන්සාඩ් එකෙන් අයින් කළා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

හැන්සාඩ් එකෙන් අයින් කරලා තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පොඩ්ඩක් ඉන්න කෝ කියන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

කියන්නේ මොන රීතියෙන්ද? රීතිවල නැහැ, ඔහොම කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හොඳ නරක කියන්න රීති ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඉතාමත් කෙටියෙන් ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉසුර ගරු මන්ත්‍රීතුමා බොහොම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මේ වාගේ සභාවේ අදහස් ප්‍රකාශ කරන කොට ඒ වාගේ වචන පාවිච්චි නොකිරීම තමයි ඉන්න ආධුනිකයන්ටත් වඩා ගෞරවයට පාත්‍ර වන්නේ. ඒ නිසා මම හිතන්නේ මෙවැනි දේවල්, එහෙම වචන පාවිච්චි කිරීමෙන් වැළකෙනවා නම් කවුරුත් හොඳයි. එතුමාට විතරක් නොවෙයි. ඔක්කෝටම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 12.30]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර ගිලී මලෙත් ඇත දත සුද්දෝ වාගේ හොඳ මිනිසුන් අතර නරක මිනිසුනුත් ඉන්නවා. අපි කණිෂ්ඨයෝ. අපි හැම වේලාවේම යම් යම් - අපේ හිටපු සභාපතිතුමා කියපු ආකාරයට අපි යම් යම් දේවල් උකහා ගන්නේ මේ අය කරන්නා වූ ක්‍රියාදාමයන් තුළින්. ඒ නිසා මම දැඩි ලෙස මගේ මිත්‍ර, මගේ ඇතින් ඥාති ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා ඇත්තටම මේ රටේ වසර 30 ක යුද්ධයක් කරපු, වසර 30 කට වඩා වැඩි කාලයක් තිබුණු යුද්ධය නිමා කරපු, තුන් වතාවක් මියැදෙන්නට ගිය, බඩ බොකු බිම වැටිලා, ඒවා අතින් අරගෙන රෝහලට යන්න තරම් හැකියාවක් තිබුණු අභීත නායකයෙක් එසේ තුච්ච අසික්කිත ආකාරයට විවේචනයට ලක් කිරීම මම හිතනවා අපි මේ රටේ අද -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එතුමාව විවෙච්නය කළේ නැහැ. ඒකට කොහෙත්ම එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. මම එහෙම එතුමාව විවේචනය කළේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මම එතුමාගේ සේවය අගය කළා. සේවය අගය කරලා කථා කළේ. සම්පූර්ණ වැරදි කථාවක් ඒක.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා අර ආකාරයට ගිහින් ඒ ද්‍රවිඩ කාන්තාව වැළඳගන්නට තරම් ඉතාමත් පහත් තත්ත්වයේ ඉන්න තැනැත්තෙක් හැටියට එතුමා හඳුන්වා දුන්නා. ඒ නිසා ඇත්තටම, අපි මේ නිවහල් දේශයක ජීවත් වන මිනිස්සු හැටියට අතිගරු ජනාධිපතිතුමා දුන්න කාර්ය භාරයට වඩා වැඩි කාර්ය භාරයක් කරපු ජනරාල් සරත් ෆොන්සේකාට ඒ කරපු ඔය නිග්‍රහය වෙනුවෙන් සමස්ත පළාත් සභාවම සමාව ගත යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ආ, ඒ හරි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරලා තිබෙන්නේ. ඒ සම්බන්ධව නැවත කථා කරන්න එපා. ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ කාරණය සම්බන්ධයෙන්. ඉතාමත් ගෞරවයෙන් කියන්නේ. මේ කරපු ප්‍රකාශය වැරදියි. දැන් ඒ ප්‍රකාශය කළේ නැහැයි කියනවා. ඒ නිසා අපි සභාවෙන් එළියට යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක හැන්සාඩ් එකෙන් අයින් කරලා තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ කාරණයට විරෝධය පළ කරලා අපි සභාවෙන් එළියට යනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අර මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා. එතුමාට අවස්ථාව ලබා දෙන්න. කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලය යන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඌව පළාත් සභාව පැරදිලා යනවා වාගේ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ෆොන්සේකාගේ මොන්ටිසෝරියේ කට්ටිය යනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ නාට්‍යයක් නොවෙයි. මේ පිස්සන් කොටුව නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වැඩේ වරද්දා ගත්තේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපිටත් කියන්න පුළුවන් ඕනෑ තරම්. අපටත් කියන්න පුළුවන් කරපුවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

හරි ඊළඟ සැරේ එනවා කෝ බලන්න. හරි හරි බලා ගනිමු. කොටා කියලා කථා කරන්නේ. මේ සභාවේ මන්ත්‍රීවරයකුට කොටා කියලා කථා කරන්නේ. ඒක ඡන්දෙන් බලාගනිමු.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. දැන් මම මෙම සභාව විනාඩි 05 ක කාලයකට කල් තබනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. **12.44** ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 12.44 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම ගෞරවයෙන් තත්පරයක් ඉල්ලන්නේ. මේ සභාවේ අපි ආධුනිකයන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම කථා කරන්න බැහැ. එහෙම කොහොමද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මේ කථාව ඉල්ලා අස් කර ගන්න කියන්න. අපි කියන්නේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ඊළඟට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ කථාවට නොවෙයි නේ දෙන්නේ? එතුමා කිව්ව කථාවට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. ඒ කථාවට කථාවක් කරන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ කරපු ප්‍රකාශයට?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරු පිළිගන්න. මම එක සැරයකුත් කිව්වා. මෙවැනි චේතනාවකින් නොවෙයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවේ. අපි ඒක බැලුවා. ඒ නිසා ඒ මාතෘකාවට අදාළව කථා කරලා මේ යෝජනාවේ ප්‍රතිඵලයක් ලබා ගන්නය කියලා මම ඉල්ලනවා. ඒ නිසා රොඩ්නි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් මේ යෝජනාවට ගැලපෙන ආකාරයෙන් තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නය කියලා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලනවා.

[අ.භා. 12.45]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 30 අවුරුදු යුද්ධයක් තිබිලා - මම ඒ පිළිබඳව නොවෙයි කථා කරන්න යන්නේ. මිනිස්සු විශාල වශයෙන් කැප කිරීම් කළා වත්මන් රජය ජනතාවට විශාල සේවාවක් කරයි කියලා. නමුත් ඒ වසර ගණනාවක් පුරා තිබුණු යුද්ධය නිමා කරලා, සොල්දාදුවන් 40,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් වෙලා, මේ හැම කැප කිරීමක්ම කළේ, මිනිස්සු යම් ආකාරයක ඉදිරි අනාගතයේදී ආර්ථිකමය වශයෙන් තමන්ගේ දරුවන්ටත්, තමන්ටත් ඉතාමත් සුඛිත මුදිත ජීවිතයක් ගත කරන්න යුද්ධයෙන් පසුව අවස්ථාවක් ලැබෙයි කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2009 මැයි 18 වැනිදා නන්දිකඩාල්වලින් ප්‍රභාකරන් මිය යන කොට ඒ මිය ගිය අවස්ථාවේදී ඒ සතුට දරා ගැනීම සඳහා අපිත් - මමත් ඇත්තටම ජාතික කොඩියක් අරගෙන ගෝල්ෆේස් එක වටේ දුවපු එක්කෙනෙක්. ඒ වෙලාවේ මගේ හිතේ ඇති වුණු එක්තරා දෙයක් තමයි මේ රට මහින්ද රාජපක්ෂ ගරු ජනාධිපතිතුමා ඇතුළුව ජනරාල් සරත් ෆොන්සේකාත් මේ රටේ යුද්ධය නිමා කරලා ඉදිරියේදී විශාල ආර්ථික සහනදායී තත්ත්වයක් ඇති කරලා දෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වෙලාවේ මගේ හිතේ ඇති වුණා, ඇත්තටම මම එක්සත් ජාතික පක්ෂයේ කැපුවත් කොළ යැයි කියන සම්ප්‍රදායේ ඉන්නවාට වඩා ඒ වෙලාවේ යම් ආකාරයකින්, මට ඒ වෙලාවේ ඇති වුණු දෙයක් තමයි ජනාධිපතිවරයාත් එක්ක අත්වැල් අල්ලාගෙන හිටියා නම් එදා හොඳයි කියලා යටි සිතේ යම්කිසි ආකාරයක, යම්කිසි දෙයක් මට වද දුන්නා. ඒ එදා. මේ එදා. මහරගම නගර සභාවේ මගෙත් එක්ක හිටපු ගරු මන්ත්‍රීවරු දෙන්නෙක්ම කිරුළපන එක්තරා පොදු පෙරමුණේ තිබුණු වේදිකාවකට නැග්ගා. ඒ අරමුණු ගොඩාක් තියාගෙන. ඉදිරි කාලයේදී යම් විධියක ආර්ථික සහනදායී, එහෙම නැත්නම් රටට යම් සුඛිත මුදිත භාවයක් ඇති වෙයි කියන බලාපොරොත්තුවෙන්. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ බලපොරොත්තු වුණු ඒ සියල්ලම සුන් වෙලා ගිහිල්ලා. අපි ඔක්කොම හීන ලෝකයක මුලා කරලා තිබෙන්නේ. අද අපි ඔක්කොම රාජ්‍ය ත්‍රස්තවාදයේ සිරකාරයෝ බවට පත් වෙලා. අද රටේ ආර්ථිකය පවුල් කිහිපයක පමණක් පුද්ගලික දේපළක් බවට පත් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින්ම හකුලා දැමීමක් කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තවමත් යෝජනාව ගැන නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, යෝජනාවට සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ජනතාවට නියම සහනදායී තත්ත්වයක් අද ඇති වෙලා නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ ඇස් පනාපිටම රටේ ආර්ථිකය අපේ ආර්ථිකය විශාල හානිදායක තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ විදේශ ණය බැඳියාව රුපියල් බිලියන 7000 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. (බාධා කිරීමක්) රුපියල් බිලියන 7000 ඉක්මවා ගිහිල්ලා. මේ රජය අපි හැමෝම රුපියල් ලක්ෂ හතරක පමණ ණයකාරයන් බවට පත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජය විසින් ප්‍රකාශ කරනු ලබන්නේ, මේ ලබා ගන්නා වූ සම්පූර්ණ විදේශ ණය ප්‍රමාණයම සංවර්ධන යෝජනා කටයුතු සඳහා ආයෝජනය කරනවාය කියලා. අපේ පාලක පක්ෂයේ සංවිධායකතුමා වාගේම මමත් එකම ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්න දෙන්නෙක්. එතුමා ලොජික් කරනවා. මම ව්‍යාපාර අධ්‍යයනය සහ ඉංග්‍රීසි විෂය උගන්වනවා. අපි දෙන්නාම එකම ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්නේ. එතුමා ආර්ථික විද්‍යාව හා සම්බන්ධව යම් යම් කරුණු ආදේශ කරලා එහෙම කථා කරන්න උත්සාහ කළා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මොනවාද මේ ආයෝජනවලින් කරලා තිබෙන්නේ. දැන් අපට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ විදේශ ණයවලින් අපි මොනවාද ආයෝජනය කරලා තිබෙන්නේ? ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටුපලවල්. නැව් නැති වරායවල්. ක්‍රිකට් ගහන්නේ නැති ක්‍රිකට් පිට්ටනි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - (බාධා කිරීම්)

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

වාහන යන්නේ නැති highway.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිවේගී මාර්ග කියලා කියන්නේ - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම ගරු මන්ත්‍රීතුමිය අධිවේගී මාර්ග පිළිබඳව කථා කරනවා. මේක තමයි විදේශ ණය ලබා දීමේදී ඒ අයගේ තිබෙන විශේෂ උපක්‍රමය. ඒ සියල්ලම වසර 20 ක් යන තෙක් අපට අයත් නොවන, අපේ මුදල් සියල්ලම එහෙට ගලා යන තත්ත්වයක් චීන්නුන් විසින් ඇති කරලා තිබෙන්නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

චීන්නු හරි හදපු එක ලොකු දෙයක්.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක වසර 20 ක් යන කොට - මේ වන විටත් බැමි කඩා වැටෙන තත්ත්වයක් නම් තිබෙන්නේ. ඔබතුමන්ලා හිතන්න කෝ වසර 20 ක් යන කොට මේවා කවර තත්ත්වයකින් තියෙයිද කියලා. ඒ නිසා මේ ආයෝජනය තමන් වෙනුවෙන් තමයි තමන් යොදා ගෙන තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටෙන්ඩර් කැඳවීමක් නැහැ. ටෙන්ඩර් සියල්ලම අයිති වෙන්නේ චීන සමාගම්වලට. (බාධා කිරීම්) මට පොඩි අවස්ථාවක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මාතෘකාව කෝ? ජීවන බර -

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අපනයනයන්ගෙන් ගත්තාම - (බාධා කිරීම්)

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

මල් වට්ටියට අත ගැහුවාට කමක් නැහැ. කර තියාගෙන යන්න එපා කිව්වා.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අපනයනයන්ගෙන් චීනයට අපි මොනවාද යවන්නේ? අපි මොනවාද චීනයට යවන්නේ? ඒ නිසා ගරු සභාපතිතුමනි, මම හිතන්නේ නැහැ. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සංවර්ධනය ගැන අහගන්න. තව කියන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මාතෘකාව ආනයනය සහ අපනයනය.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමදෙයකින්ම බදුවලින් මිරිකෙන ජනතාවක් බවට පත් වෙලා තිබෙන්නේ. අද අපි කොත්තමල්ලි ඇටේ ඉඳන් සෑම පාරිභෝගික භාණ්ඩයකටම බදු අය කිරීමක් කරනවා. අපි ජීවත් වන හුස්ම ටිකට පමණයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි බදු අය කිරීමක් කරන්නේ නැත්තේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කොයි කාලෙත් බදු අය කළා. ඒ කාලේ අය කළේ නැද්ද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

යූ.එන්.පී. ආණ්ඩුව කාලේ බදු තිබුණේ නැද්ද?

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලන්න මේ බිල් දිහා. මේ සාමාන්‍ය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕක බලන්න වෙලාවක් නැහැ. අවසන් කරන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමා වාචාල විධියට කථා කරනවා. මම කනගාටු වෙන්නේ, ඔබතුමා මීට පෙරත් හිටපු මන්ත්‍රීවරයෙක්ලු.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. ඔබතුමා හොඳ ගුරුවරයෙක්. හැබැයි, මෙතැනට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සැම එකකම කියාපාන්නේ බදු අය කිරීම්. මේ බලන්න. මේ ගත්තොත් එහෙම - (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕගොල්ලන්ගේ කාලේ බදු ගත්තේ නැද්ද?

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බදු අය කරන්නේ නැතිව රටක් පවත්වාගෙන යන්න බැහැ. ඒක අපි අනිවාර්යයෙන්ම දන්නවා. නමුත් බදු අය කරනවා කිව්වාම එක්තරා සීමිත ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ. මේ ආකාරයෙන් ගන්න බැහැ ගරු සභාපතිතුමනි.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමා නොමිලයේද ටියුෂන් කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විෂයට අනුව කථා කරන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

දැන් කථා කළා වහ බීම පිළිබඳව. මේ වතුරත් නැහැ. ණය ගෙවන්නත් බැහැ. ගොවියෝ වස බොති.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒ යූ.එන්.පී. ආණ්ඩුව කාලයේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

තිස්ස අත්තනායක වහ බොන්න යන්නේ.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඉල්ලුවේ වැව හදන්න. දුන්නේ ඇවිදින්න මං තීරුවක්. මේ බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දකුණු පළාත් ධීවර හා පරිසර ඇමති. ටී.වී. උපුල් දකුණු පළාත් අමාත්‍යවරයා ප්‍රකාශ කරනවා. මේ බලන්න. වැවට වෙන් කරන්නේ ලක්ෂ 100 යි. ලක්ෂ 50 ක් ම යන්නේ සංදර්ශනවලට. (බාධා කිරීම්) මේ වැවට වෙන් කරන්නේ ලක්ෂ 100 යි. ලක්ෂ 50 ක් ම යන්නේ සංදර්ශනවලට. මේ ප්‍රකාශ කරන්නේ කවුද? මේ රටේ - (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්. අවසන් කරලා වාඩි වෙන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩි වෙලාවක් දෙන්න. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන හරහා මේ යම් යම් ආයතන විසින්

[ ගරු රොඩ්නි රුඩෝල්ෆ් ප්‍රේසර් ]

අය කරනු ලබන යම් යම් බදු මුදල් ඉතාමත් ඉහළ තත්ත්වයක තිබෙන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම මහරගම නගර සභාව මෙවර කඩ හිමියන් සඳහා සියයට පන්සියයක බදු වැඩි කිරීමක් කළා. (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ වරප්‍රසාද උල්ලංඝනය වෙනවා කාලය මෙහෙම කන කොට. එතුමාට අදාළ නැති කාලයක්. එහෙම කාලය ගන්න පුළුවන්ද? විපක්ෂයෙන් කාලය ගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට මම උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 12.55]

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම සතුටු වෙනවා අපේ කිත්සිරි කහටපිටිය මැතිතුමා කාලෝචිත යෝජනාවක් ගෙනාවා. මොකද හේතුව, අයවැය තිබෙන්නේ තව මාස දෙකකින්. ජනාධිපතිතුමාගේ, අපේ 10 වැනි අයවැය එනවා. දැන් ඒක ගැන මෙතුමාට බොහොම දුර දක්නා ඥානයක් තිබිලා තිබෙනවා. මේ අයවැයෙන් දෙන සහන මෙතුමාට කවුරුහරි, මට පේන්නේ මුදල් අමාත්‍යාංශයේ කවුරුහරි නියෝජිතයෙක් මෙතුමාට පොඩි ඉඟියක් දීලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද මෙයා?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මොකක්ද මේ ඉඟිය? දැන් පළාත් නවයම පසුගිය අවුරුදු කාලයේ මැතිවරණයට ඉදිරිපත් වෙලා ලොකු උද්දාමයකින් ඉන්නවා. අපේ විපක්ෂය ලොකු උද්දමනයකින් ඉන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද ඔයා මෙයා කියන්නේ?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමා අහගෙන ඉන්න කෝ. ඔක්කොම එකතු වෙලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා මයික්‍රොෆෝන භාවිතා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් බලන්න 2005 ජනාධිපතිවරණය බදුල්ල දිස්ත්‍රික්කය. මහින්ද රාජපක්ෂ මැතිතුමා එක් ලක්ෂ අනූ දෙදහස් හත්සිය තිස් හතරයි. 45% යි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා (බාධා කිරීම්) දෙලක්ෂ විසි හය දහස් පන්සිය අසූ හයයි. 54% යි එදා. කවුද? ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ (බාධා කිරීම්) තරඟ කරපු අපේ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ. අද බලන්න 2005 ඒ ප්‍රතිශතයවත් මෙවර ඌවේදී ලබා ගෙන නැහැ. (බාධා කිරීම්) 2005 දී රනිල් වික්‍රමසිංහ තරඟ කරපු මැතිවරණය. මේ තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අහගෙන ඉන්න කෝ කෑ ගහන්නේ නැතිව. 2005 ජනාධිපතිවරණය. බදුල්ල දිස්ත්‍රික්කය. මහින්ද රාජපක්ෂ - (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙදහස් කීයේද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම මේ කියන්නේ 2005 ජනාධිපතිවරණය ගැන. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, එහෙට කථා කරන්න එපා. ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එදා විපක්ෂය බදුල්ලෙන් 54% ක් අරන් තිබෙනවා. (බාධා කිරීම්) අපේ ජනාධිපතිතුමා 45% යි බදුල්ල දිස්ත්‍රික්කයෙන්. මෙන්න අහගෙන ඉන්න. (බාධා කිරීම්) කථා කරන්න දෙන්නේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා ඔබතුමා මූලාසනය අමතන්න. ඒවාට උත්තර දෙන්න යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියාගෙන යන්නේ ඒගොල්ලෝ සතුටින් ඉන්න වෙලාවක එදා තිබුණු ප්‍රතිශතයයි, අද තිබෙන ප්‍රතිශතයයි අතර වෙනස ගැනයි - (බාධා කිරීම්) අපේ කිත්සිරි කටහටපිටිය හිටපු ගරු විපක්ෂ නායකතුමා අද මේ යෝජනාව ගෙනැල්ලා - දැන් අපේ අයවැයක් එනවා. අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අවුරුදු 30 ක යුද්ධය කරලා, ජනතා විමුක්ති පෙරමුණ අවුරුදු 14 ක් මේ රටේ බස්, ට්‍රාන්ස්ෆෝමර්, එතකොට මොනවාද ඉස්කෝල, එතකොට තිබෙන කෘෂිකර්ම මධ්‍යස්ථාන මේවා ඔක්කොම ගිනි තියලා විනාශ කරලා අවුරුදු 14 යි. එක්සත් ජාතික පක්ෂය උතුරු නැගෙනහිර යුද්ධයක් කරන්න අවුරුදු 30 ක් දීලා, අද යුද්ධය අවසන් කරලා අවුරුදු පහක් ගත වෙලා මේ මොහොත වන කොට මැතිවරණ පහක් අපේ රටේ තිබිලා පහෙන්ම අපි ජයග්‍රහණය කරලා මේ 29 සැරයත් එක්සත් ජාතික පක්ෂය පරාජය කරලා තිබෙන්නේ. 29 සැරයක්.

දැන් මේ යෝජනාව ගන්න කෝ? මේ යෝජනාවේ ඉල්ලන්නේ මොකක්ද? මධ්‍යම ආණ්ඩුවට කියන්නලු - අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාවෙන් කියනවා, මධ්‍යම ආණ්ඩුවට කියන්න මිනිස්සුන්ගේ කෑම බීම මිල වැඩියි. ඒ නිසා ආර්ථිකය අමාරුයි. මේවාට විකල්පයක් දෙන්න කියලා. හරි. ඒක හොඳ යෝජනාවක්. නමුත් දැන් මොකක්ද කරන්නේ අපේ ආණ්ඩුව? ආණ්ඩුවට දැන් බැන්නා පාරවල් හදනවා කියලා. පාරවල් හදන කොට මොකක්ද වෙන්නේ? පාරවල් හදන කොට ඉන්ධන පිච්චීම අඩු වෙනවා. කාලය ඉතිරි වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොනවාද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තමන්ගේ කාලය ඉතිරි වෙනවා. ඉන්ධන පිච්චෙන ප්‍රමාණය අඩු වෙනවා. අහගෙන ඉන්නේ නැහැ නේ? පිස්සෙක් වුණාම මොනවා කරන්නද? අහගෙන ඉන්න පුරුදු වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට පිස්සෙක් කියන්න එපා. ඔබතුමා -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එතකොට අපි විදේශ රටවල්වලින් ගෙන්වන ස්පෙයාර් පාර්ට්ස් මිල, වාහනවලට ගෙන්වන කැලි, භාණ්ඩවල ඒ මිල අඩු වෙනවා. අපේ කාලය ඉතිරි වෙනවා. එතකොට දැන් විදුලි බලාගාර හදන්න එපා කියලා මෙතැන කවුරුවත් කියනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එපා. එපා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් ජනාධිපතිතුමා චීන ආධාර යටතේ විදුලි බලාගාර හදනවා. දැන් ඒක එපා කියනවාද? දැන් කිව්වා මේ වරායට නැව් එන්නේ නැහැයි කියලා. ඒක එපැයි කිව්වා. දැන් බලන්න. දැන් වරායට නැව් ටික ඇවිල්ලා, ඒ වරායට එන නැව්වලට අපේ ගොවියාගේ පළතුරු ටික, ගස්ලබු ටික, අන්නාසි ටික, කෙසෙල් ටික පවා අපේ රටේ තිබෙන වතුර ටික අර සුද්දාගේ නැව්වලට දීලා අපි සල්ලි ගන්න කොට

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

එපා කියනවාද? ඒවාට එපා කියනවාද? නැහැ නේ? ඉතින් අපේ මන්ත්‍රීවරු බොහොම ඊර්ෂ්‍යාවයි. මේ ක්‍රෝධය අත් හැරලා මේක තේරුම් කර ගන්න. තව අවුරුදු හතලිහක් යන්නේ ජනාධිපති රාජපක්ෂ පරම්පරාව කියන එක ඉස්සෙල්ලාම තේරුම් ගන්න. (බාධා කිරීම්) ඒක හොඳට තේරුම් ගන්න. ඒක හොල්ලන්න ශක්‍රයෙකුටවත් බැහැ.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

සභාපතිතුමා ඉන්නේ අර පැත්තේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට ඔබතුමා කවුද ඒකේ?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපි පළාතක් හැටියට ගත්තාම මේ පළාතේ තිබෙන ආදායම ගන්නා විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් (බාධා කිරීම්) අපට තිබෙන බලතල මොනවාද? දැන් මේ යෝජනාව ගෙනාවාට අපට බලයක් නැහැ නේ? අපට ආහාර බෙදා හරින්න බලයක් තිබෙනවාද? අපට ආහාර import කරන්න බලයක් තිබෙනවාද? අපට නැහැ. අපට බලයක් නැහැ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එවැනි බලයක් නැහැ. එතකොට පළාත් සභාවේ අපේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මේ පළාත් සභාවට කරන්න පුළුවන් මොකක්ද? මේ පළාත් සභාවේ ඉන්න සමහර මහත්වරු මීට වඩා හොඳට උදේ පාන්දරින් උසාවියට ගිහිල්ලා නඩුවලට කථා කරනවා. මෙහෙට එන්නේ නැතිව. වෙලාවට ඇවිල්ලා ජනතාව ඡන්ද දුන්න නිසා ඒ වරප්‍රසාද ගැනත් කථා කරනවා. මේ වරප්‍රසාද ගන්න දේවල් ඉතිරි කරලා මහජනයාට වැඩ කරනවා. හරිද? මහජනයාට වැඩ කරනවා. මේක තමයි තිබෙන්නේ. එතකොට දැන් අපි මේ යෝජනාව -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අල්ලස් ගන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර මයික්‍රෆෝන භාවිතා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපේ ආණ්ඩුවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ ගේන්න යන -

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ජනක මන්ත්‍රීතුමාට එහෙම කියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ නොවැම්බර් මාසයේ ගෙනෙන අයවැය, මහජනයාට දෙන සම්පූර්ණ සහනදායී අයවැයක් තමයි ගේන්නේ කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඒක තමයි කරන්නේ. එදාට ඇවිල්ලා කියන්න එපා අරක නැහැ. මේක නැහැ. අනික නැහැ කියලා. එදාට දෙන්නේ අද ඉපදෙන්න ඉන්න දරුවාගේ ඉඳලා මහළු වන ආච්චි, සීයා දක්වා සියලු දෙනාටම වරප්‍රසාද තිබෙන අයවැයක් අපි හදන්නේ. ඒ අයවැය යටතේ පොඩි දරුවාටද? කිරි බොන දරුවාටද? බබා හම්බ වෙන්න ඉන්න අම්මාටද? ගෙයක් දොරක් නැති අම්මා තාත්තාටද? එහෙම නැත්නම් කසාදයක් බඳින්න ඉන්න කෙල්ල, කොල්ලාටද? (බාධා කිරීම්) සියලුම අයට ගැලපෙන අයවැයක් තමයි මෙදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගේන්නේ. ඊළඟ මාසය වෙන කොට. ඒ නිසා තමුන්නාන්සේලා උද්දාමයට පත් වෙලා කථා කරන්න යන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මම කාටවත් මඩ ගැහුවේ නැහැ. මම විවේචනය කළේ නැහැ. මේක තමයි ඇත්ත. මේ ඇත්ත පිළිගන්න. මේ රටට එන ආදායම් මාර්ග ටික ඉතිරි කර ගන්න තමයි - 2015 වර්ෂය වන කොට තමුන්නාන්සේලාගේ පොකට් එකේ නොදැනුවත්වම සල්ලි පිරෙයි. තමුන්නාන්සේලා නොදැනුවත්ව වෙනවා මේක. එතකොට තමුන්නාන්සේලා සතුටින්, තමුන්නාන්සේලාගේ පවුල් එක්ක, තමුන්නාන්සේලාගේ ඥාතීන් එක්ක, තමුන්නාන්සේලාගේ ඡන්ද දායකයොත් එක්ක ජීවත් වෙන්න කියලා ආරාධනා කරමින් මේ අවස්ථාව ලබා දීම

ගැන ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 01.04]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මා පළමුවෙන්ම කිව යුතුයි සත්‍යයට මුහුණ නොදී පදනමක් නැති සාවද්‍ය කරුණු පදනම් කර ගෙන විවාද කිරීම මම හිතන්නේ යහපත් ක්‍රියාවක් නොවෙයි. ඒ වාගේම ඔබතුමා සිහිපත් කළ පරිදිම සති ගණනක් තිස්සේ අපි අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගැන කථා කරන්න බලාගෙන හිටියා. මම හිතන්නේ විද්වත් සහ තර්කානුකූල සාධාරණ කාරණා මත අපි තර්කයක නියැලුනා නම් මේ පළාතේ ජනතාවට යම්කිසි ප්‍රතිලාභයක් ලබා දිය හැකි මාර්ග අඩුම වශයෙන් අපට මේ සභාවේදී යෝජනා කරන්න තිබුණා. එහෙම නැතිව පුද්ගල බද්දව කථා කරලා මඩ ගහලා, චරිත ඝාතනය කරලා හිතනවා නම්, රටේ පළාතේ පවතින තත්ත්වය වසා ගන්න පුළුවන් කියලා, මම හිතන්නේ නැහැ ඒක කළ හැකියි කියලා. මොකද, අපි ඒක ඌව පළාත් සභාවේදී දැක්කා. ආණ්ඩුවේ ප්‍රතිඵලය 20% කින් අඩු වන විධිය. විපක්ෂයේ ප්‍රතිඵලය 20% කින් වැඩි වන විධිය. ඒ වාගේම (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කෝ ඕගොල්ලන්ට නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කරුණාකරලා වෙන පැත්තකට යොමු කරන්න එපා. මම කාටවත් මඩ ගහන්න කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ පවතින තත්ත්වය මත අපටත් පුළුවන් රටේ ඉන්න නායකයන්ගේ පෞද්ගලික චරිත ඇදගෙන ඒගොල්ලෝ කරපු දේවල්, කියපු දේවල් ඇද ගෙන කථා කරන්න. පක්ෂයක් හැටියට අපි කිසි වෙලාවක - අඩුම ගණනේ අපි දේශපාලන වේදිකාවේදීවත් රටේ නායක කාරකාදීන්ට මඩ ගහන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මම කියනවා, අපේ පක්ෂයේ නායකයා සම්බන්ධයෙන් කළ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න තරම්වත් යුතුකමක් නැති, රටට ජාතියට ආදරෙයි කියන මේ බොරු දේශප්‍රේමීන් ගැන අපි කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා කියලා කියන්නේ, අපි මේ රටේ කවුරු කොහොම කිව්වත් රට බේරා ගත්ත නායකයා. එදා අපට මතකයි. යුද්ධය අවසන් වුණු දවසේ කේක් ගෙඩියක් ගෙනැල්ලා ගරු ජනාධිපතිතුමා - අපි ජනාධිපතිතුමාට ගරු ජනාධිපතිතුමා කියන්න ලැජ්ජා වෙන්නේ නැහැ. මොකද, එතුමා කවර හේතුවක් නිසා හෝ මේ රටේ නායකයා. ගරු ජනාධිපතිතුමා ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට පිහියක් දික් කරනවා කේක් ගෙඩිය කපන්න කියලා. එදා ජනාධිපතිතුමා පිළිගත්තා ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා තමයි මේ යුද්ධය අවසන් කළේ කියලා. ඒ නිසා ඒ වාගේ නායකයෙකුට, ජාතිය වෙනුවෙන් මෙතරම් කැප කිරීම් කරපු නායකයෙකුට ඉතාමත් පහත් අන්දමින් එහෙම ප්‍රකාශයක් කරලා, එතුමා සම්බන්ධයෙන් එහෙම මඩ ප්‍රචාරයක් කරලා, ඒක ඉල්ලා අස් කර ගන්න තරම්වත් කටයුතු නොකරපු ඒ මන්ත්‍රීවරයා ගැන ඇත්තටම මම කනගාටු වෙනවා. ඉතාමත්ම ලැජ්ජා සහගතයි. අපි ලැජ්ජාවට පත් වෙනවා මේ සභාවේදී ශ්‍රී කිකයෝ හැටියට අපේ රට කොහේටද යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කැමැතියි මේ මාතෘකාවට අදාළව යම් කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ආර්ථික විද්‍යාවේ යම් මූලිකාංග කරුණු ටිකක් ගෙනහැර දැක්වුවා. නමුත් මම දැක්කා, එතුමාගේ කථාවේදී මේ රටේ පවතින ප්‍රශ්නයේ ගැඹුර විනිවිද දකින්න ඒ දැනුම එතුමා පාවිච්චි කළේ නැහැයි කියලා. එතුමා එක අවස්ථාවකදී කිව්වා, රටේ ආදායම වැඩි කර ගන්න ක්‍රමයක් සොයන්න ඕනෑය කියලා. උපාය මාර්ග සොයන්න ඕනෑය කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙනියන්න අපේ රටේ ආණ්ඩුවට උපාය මාර්ග නැහැ. උපාය මාර්ග තිබුණා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිෂ්පාදන කර්මාන්ත වැඩි කරන්න ඕනෑකම තිබුණා නම්, සේවා ප්‍රමාණය වැඩි කරන්න ඕනෑකම තිබුණා නම්, අපේ රට කැසිනෝ වාගේ ඉතාම පටු ආර්ථික උපාය මාර්ගවලට යන්නේ නැහැ. රට විනාශ වන උපාය මාර්ගවලට යන්නේ නැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, 2017 දී ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 7000 ක් දක්වා වැඩි කර ගන්න කටයුතු කරනවා. වැඩි කර ගෙන යනවා කියලා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

රට විනාශ වෙනවාය කියන උපාය මාර්ග මොනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

රට විනාශ වන උපාය මාර්ග නොවන්නේ මොනවාද? මට ඔබතුමා කියන්න නොවන උපාය මාර්ග මොනවාද කියලා. ආර්ථික උපාය මාර්ග. ඔබතුමාටයි මටයි ආර්ථික උපාය මාර්ග ගැන කථා කරන්න බැරි බව මම ස්ථිර වශයෙන්ම දන්නවා. මේ සභාවෙන් පිටදී මම කැමැතියි ඔබතුමාත් එක්ක ආර්ථික උපාය මාර්ග ගැන කථා කරන්න. ඔබතුමා ඉස්සෙල්ලා හැරිලා බලන්න ඔබතුමා කථා කළේ මොනවාද කියලා. ඔබතුමා කථා කරපු කරුණු ටික ගැන ඉස්සෙල්ලා හැරිලා බලන්න. මම ඔබතුමා කථා කරපුවා ගැන කථා කළේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න. මූලාසනය අමතන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ 2017 වන කොට අපේ රටේ ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 7000 දක්වා වැඩි කර ගන්න කථා කරන්නේ, මේ ආසියානු කලාපයේම රටවල් ඒක පුද්ගල ආදායම අද වන කොටත් ඩොලර් 30,000 කට 40,000 කට වැඩි කරලා තිබෙන වකවානුවක් තුළ. එවැනි ඉලක්කයක් ළඟා කර ගෙන තිබෙන වකවානුවක් තුළ. අවුරුදු 20 ක්, 1994 ඉඳලා මේ රට පාලනය කරපු ඒ ආණ්ඩුවේ ජනාධිපතිවරයෙක් යටතේ මේ රට පාලනය වුණු පරිසරයක් තුළ 2017 දී ඩොලර් 7000 දක්වා වැඩි කර ගන්නයි කථා කරන්නේ. ඉතින් අපි ලැජ්ජාවට පත් වෙන්න ඕනෑ. මොකක්ද මේ අපේ ආර්ථික වැඩ පිළිවෙළ කියලා. ඒ නිසා කරුණාකරලා - (බාධා කිරීමක්) මොකක්ද ඔබතුමියට දැන ගන්න ඕනෑ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඉන්දියාවේ ඒක පුද්ගල ආදායම -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෝඩ ප්‍රශ්නවලට ගිහිල්ලා අපේ කාලය - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒක මෝඩ ප්‍රශ්නයක් වෙන්නේ කොහොමද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමියට ඕනෑ නම් ඊළඟ දවසේ මම ඒ වාර්තා ටික අරගෙන එන්නම්. අද මම ඒ වාර්තා ටික ගෙනාවේ නැහැ. ඔබතුමිය මට කියන්න. කරුණාකරලා ඔබතුමිය මට කියන්න. අපි එය පරීක්ෂා කරලා බලමු. ඔබතුමිය කියන්න පකිස්ථානයේයි ඉන්දියාවේයි ඒක පුද්ගලක ආදායම කියන්න. ඔබතුමිය කියන්න. අද ඒ දත්ත මගේ ළඟ නැහැ. ඔබතුමියන්ලා වාගේ මේ සභාවේ බොරු කියන්න ඕනෑ නැහැ. බොරු ඉලක්කම් කියලා රවට්ටන්න ඕනෑ නැහැ. ඕගොල්ලන්ගේ ඇමතිවරු, මන්ත්‍රීවරු බොරු ඉලක්කම් කියලා රවට්ටනවා. (බාධා කිරීම්) දැන් මේ ආර්ථිකයේ වර්ධන වේගය 7% යි කියනවා. හෙට දවසේ අංක දෙකට ගෙනියයි. තව අවුරුද්දක් යන කොට අංක තුනෙන් තියෙයි මේ රටේ ආර්ථික වර්ධනය. එහෙම බොරු ඉලක්කම් මත -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඉන්දියාවේ ඒක පුද්ගල ආදායම ඔබතුමා කියන්න. දැන් ඔබතුමා කිව්වානේ ආසියාවේ අනික් රටවල ඒක පුද්ගල ආදායම 30,000 ට වැඩි වෙලා කියලා. කියන්න එතකොට ඉන්දියාවේ. මම දන්නේ නැති නිසා අහන්නේ මන්ත්‍රීවරියක් හැටියට. මම ආසයි දැන ගන්න. මොකද, ඔබතුමා මේ අධ්‍යයනයක් කිව්වේ කරලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පට්ටපල් බොරු කථා කිය කියා මේ රට අපායට - ආශ්චර්යයට නොවෙයි ගෙනියන්නේ අපායට. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අපායට ගෙනියපු හැටි අපි දැක්කා. ෆොන්සේකා මහත්තයා අපායට ගෙනියන හැටි අපි දැක්කා ඌව ප්‍රතිඵලය. (බාධා කිරීම්) වෙඩි වැදුණු කාර් එක ගෙනිහිල්ලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපේ පළාතේ දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න. ඔබතුමාට තව විනාඩියක් දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මාතෘකාවට අදාළව තමයි කථා කර ගෙන යන්නේ. ඒ නිසා අපේ පක්ෂයට මෙපමණ මඩ ගහලා තිබේද්දීත් මම කාලය වැය කළේ නැහැ ඒ වෙනුවෙන්. මම කථා කළේ මාතෘකාවට අදාළව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - (බාධා කිරීම්)

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පක්ෂය මොකක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පක්ෂය දන්නවා. අර මහරගම නගරාධිපතිතුමියගෙන් ඇහුවා නම් දන්නවා පක්ෂය මොකක්ද කියලා. මහරගම නගරාධිපතිතුමියගෙන් අහන්න. එතුමිය දන්නවා පක්ෂය මොකක්ද කියලා. අපි එතුමියට හොඳට කියලා දුන්නා පක්ෂය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ ඒකපුද්ගල ආදායම, කොළඹ දිස්ත්‍රික්කයේ මාසික ආදායම එක පවුලකට අවශ්‍යයයි වියදම හැටියට රුපියල් 47,291 ක්. කොළඹට. ගම්පහ දිස්ත්‍රික්කයේ 41,062 යි. කළුතර දිස්ත්‍රික්කයේ 35,549 යි. හතර දෙනෙක් ඉන්න එක පවුලකට මාසයක් ජීවත් වෙන්න මෙතරම් මුදලක් වැය වෙනවා. ශ්‍රී ලංකාවේ මෙතරම් මුදලක් වැය වන පළාත. වැඩිම දිස්ත්‍රික්ක තුන තමයි කොළඹ, ගම්පහ, කළුතර. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, මේ බදු තමයි ආණ්ඩුව කියන ආයතනය පවත්වාගෙන යන්න තිබෙන එකම ආදායම් මාර්ගය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා. බදු වර්ග දෙකක් අපි අය කර ගන්නවා. වක්‍ර බදුත්, සෘජු බදුත්. නමුත් අපි මේ දේපළ මත හෝ වරිපනම් මත අය කර ගන්නා සෘජු බදු හැටියට අපේ රටේ අය කර ගන්නේ 20% යි. ඉතිරි 80% ම වැය කර ගන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වක්‍ර බදු හැටියට. ඒ වක්‍ර බදු ලබා ගන්නේ කොහොමද? මේ වක්‍ර බදුවලින් බලපෑම් එල්ල වෙන්නේ කාටද කියලා අපි සලකා බලන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ වක්‍ර බදු සියල්ල අය වෙන්නේ දුප්පත් අසරණ මිනිස්සුන්ගෙන්. ඔවුන් මිලදී ගන්නා භාණ්ඩවලින්. ඔවුන් ලබා ගන්නා සේවාවලින් තමයි මේ වක්‍ර බදු අය වෙන්නේ. අඩුම වශයෙන් අපේ රටේ ඒ වක්‍ර බදු තුලනය කර ගන්න -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ආර්ථික විද්‍යා පාඩමක් ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ආර්ථික විද්‍යාව ඉගෙන ගෙන නැහැ ගරු මන්ත්‍රීතුමිය.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒක තමයි. ඒ නිසා වෙන්න ඇති කියන්නේ. මොකද, අපි ඉගෙන ගෙන තියෙනවා, පොඩි කාලේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ඒ ගැන අධ්‍යයනය කරලා තිබෙනවා. ඔබතුමියට ඒ අධ්‍යයනය කිරීම ගැන අමාරුවක් තිබෙන බව මට තේරෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මම පොඩි කාලේ ඉගෙන ගත්තා ඔය කියන ටික.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පළාත් සභාවේ (බාධා කිරීම්) කරන එක ගැන ඔබතුමියට හරි දුකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. මයික් දාලා කථා කරන්න පුළුවන් පුටු තිබෙනවාද? බැරි පුටු තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාත් මයික් එක ඕෆ් කර ගන්න.

**අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

අපි දන්නේ නැති නිසා ඇහුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික් පාවිච්චි කරන්න එපා. කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේත් කාලය අවසන් කරන්න සිදු වෙනවා. ඒ නිසා මාතෘකාවට අදාළව ඉක්මණින් කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ත්‍රීවිල් එක එළවන පුද්ගලයාත්, ඒ වාගේම ප්‍රාඩෝ රථයේ, මොන්ටෙරෝ රථයේ යන පුද්ගලයාත් මේ රටේ භාණ්ඩ සඳහා ගෙවන්නේ එකම බදු මුදලක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා බදු අය කිරීමේදී මේ විෂමතාවයන් ඇති කරන්න ආණ්ඩුවක් හැටියට කටයුතු කරන්න ඕනෑ. මේ රටේ එහෙම වැඩ පිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා මේ වත්මන් ආණ්ඩුව මේ එකතු කර ගන්නා බදු අඩුම වශයෙන් මහජනතාවගේ සුභසාධනයට වැය කරනවාද කියන ප්‍රශ්නයත් අද මතු වෙලා තිබෙනවා. අද බලන්න මේ රටේ බදු නොගෙවන්නේ මොකටද කියලා. අපි පෙට්‍රල් පිටරටින් ගෙනෙන කොට පෙට්‍රල් ලීටරයක් වරායෙන් බාන්න වැය වෙන්නේ, රුපියල් 98 යි. නමුත් ඒ සඳහා අති විශාල බදු මුදලක් අය කරනවා. එහි අසාධාරණය මේ රටේ මිනිස්සු දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා වැඩි වෙන්නේ ජනතාවගේ එදිනෙදා ජීවත් වෙන්න ගන්න බඩුවලින්. ජීවන වියදමින්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීමක්) දැන් බලන්න අපි ළඟ තිබෙනවා - මේ හොරකම් කරන ඒවා ගැන අහන්න එපා. බදු මුදල්. මෙන්න තිබෙනවා කෝප් වාර්තාව. මේ කෝප් වාර්තාවේ තිබෙනවා හොරකම් කරපුවා ගැන. ජනතාවගේ බදු මුදල් මේ. ආණ්ඩුව හොරකම් කරන්නේ ජනතාවගේ බදු මුදල. මේ වෙනුවට ජනතාවට ප්‍රතිලාභ ලැබෙන වැඩ පිළිවෙළක් මේ ආර්ථිකය තුළ ක්‍රියාත්මක වෙලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි දිගින් දිගටම මතු කරන කාරණය තමයි, මේ ආර්ථිකය ඇතුළේ මේ දුප්පත් ජනතාවට, බදු ගෙවන ජනතාවට බදු මත බදු පටවලා, ජනතාවට ජීවත් වෙන්න මාර්ගයක් නැති කරලා තිබෙන අවස්ථාවක අඩුම වශයෙන් මේ පළාත් සභාව තුළ, මේ පළාත් සභා ප්‍රදේශවල - මම ඔබතුමාට කරුණු දැක්වුවා වාගේ මේ පළාතේ දිස්ත්‍රික්ක තුන තමයි වැඩියෙන්ම මිනිස්සු මුදලක් වැය කරන්නේ, ජීවත් වෙන්න. ඔවුන්ගේ ගෘහ ජීවිතයට විශාල මුදලක් වැය කරන්න වෙලා තිබෙනවා. ඒක දළ වශයෙන් ගත්තාම ලංකාවේ ඉහළ අගයක්. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේ පළාත් සභා ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවට තමන්ට - (බාධා කිරීම්)

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඌව ගැනත් කථා කරන්නලු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඌව ගැනත් ඕනෑ නම් කථා කරන්න පුළුවන්. තමන්ට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න උත්සාහ වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තමන්ට ජීවත් විය හැකි පරිසරයක් - අඩුම ගණනේ තමන් ලබා ගන්නා ආදායමට ගැලපෙන විධියට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදන්න. බදු ප්‍රතිපත්තියක් හදන්න. එහෙම නැත්නම් ඔවුන් මිලදී ගන්නා භාණ්ඩ මත පැටවෙන බදු පිළිබඳව සලකා බලා ඔවුන්ට ජීවත් විය හැකි ක්‍රමවේදයක් සකස් කරන්න යමක් කරනවා නම් මම හිතන්නේ ඒක තමයි අපට දවසේ කළ හැකි විශාලම කාර්යභාරය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මට එක කාරණයක් කියන්න ඉඩ දෙන්න. මේ එක එක කතන්දර කියනවා. අපට මෙපමණ බලය තිබෙනවා. ඊළඟ අවුරුදු 40 ත් දිනනවා කියනවා. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. පාලකයෝ තුන් දෙනෙක් හිටියා. හොස්නි මුබාරක්, මුහම්මර් ගඩාෆි, සදාම් හුසේන් කියලා. ඒ පාලකයෝ තුන් දෙනාම ඉදිරිපත් වුණු අවසන් මැතිවරණ තුනේදීත් 75% කට වැඩිය ඡන්ද ප්‍රතිශතයක් අරන් තිබුණා. නමුත් ඔවුන් අවුරුද්දක් ඇතුළත බිඳ වැටිලා, සොයා ගන්නත් නැති වුණා. ඒ නිසා මේ බලය බිඳ වැටීම ගැන කථා කරන්න එපා. (බාධා කිරීම්) බොහොම ස්තූතියි.

[අ.භා. 01.16]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා අද මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම අපි ආධුනික මන්ත්‍රීවරු වශයෙන් ඉතාමත්ම කනගාටු වෙනවා අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙන එන මේ කාලෝචිත යෝජනාව පිළිබඳව අපි සියලු දෙනා යම් යම් කරුණු පිළිබඳව එකඟතාවයෙන් කථා කළා. මේ යෝජනාව පිළිබඳව අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳව මේ අවස්ථාවේ අපි ඉතාමත්ම කනගාටු වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂයේ අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව පිළිබඳව කථා කරන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියලා අපි ඉස්සෙල්ලාම ප්‍රශ්න කරනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙන් අපි අහන්නේ. තමුන්නාන්සේලාට මතකයි. 1980 ජූලි වැඩ වර්ජනය. ජීවන වියදම අඩු කරන්න කියලා රුපියල් 10 ක් පඩිපතට එකතු කරන්නය කියපු ඒ අහිංසක සේවකයෝ ලක්ෂ 1 ½ ක් එළියට දාලා ඔවුන්ව මහ පාරට බැස්සුවේ එක්සත් ජාතික පක්ෂ රජය. ඊළඟට මේ රටේ ජීවනාලිය, තරුණ පරපුර හැට දහසක් තරුණයෝ මේ රටේ ටයර් සෑයවල්වල යවලා තුරන් කළේ එක්සත් ජාතික පක්ෂ රජය. අන්න ජීවන වියදම අඩු කරපු හැටි. තමුන්නාන්සේලා ජීවත් වෙන්නවත් අයිතියක් ඔවුන්ට දුන්නේ නැහැ. ඒ වාගේම අපට මතකයි රිගේනින් ශ්‍රී ලංකා වැඩ සටහනේ. අද කෝ අපි හදපු - අපි හැදුවේ ආයි ඇවිල්ලා. වී අලෙවි මණ්ඩලය කෝ? සතොස කෝ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද හාල් ටික කෝ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒවා සියල්ලම තමුන්නාන්සේලා පෞද්ගලිකකරණය කරලා. ඒ අහිංසක ගොවි ජනතාවගේ නිෂ්පාදන මිලයට ගන්න තිබුණු ඒ ආයතන තමුන්නාන්සේලා වහලා දාලා කාබාසිනියා කරලා දැම්මේ එක්සත් ජාතික පක්ෂ රජය. අද තමුන්නාන්සේලා ජීවන වියදම අඩු කරන්න කථා කරනවා. මේ පිළිබඳව Regaining Sri Lanka වැඩ සටහන - රාජ්‍ය සේවයේ ලක්ෂ දහයේ ඉඳලා ලක්ෂ හය දක්වා අඩු කරන්න තමුන්නාන්සේලා යෝජනා කරලා තිබුණා අපට මතකයි. 2004 වර්ෂයේ මේ රට සුනාමියකට මුහුණ දුන්නා. හතළිස් දහසක් අපේ ජනතාව නැති වුණා. අපේ දේපළ විනාශ වුණා. ඒ වාගේම අවුරුදු 30 ක කුරිරු යුද්ධය. එල්.ටී.ටී.ඊ. සංවිධානය මේ රට විනාශ කළා. අවුරුදු 30 ක කුරිරු යුද්ධය නැති කරන්න බැරි වුණා කිසිම ජනාධිපතිවරයෙකුට. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට බේරා ගත්තා. අද අපි නිදහස් ශ්‍රී ලංකාවේ එකම ජාතියක් ලෙස ජීවත් වෙනවා. මේ රටේ අද අපි ආර්ථික වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, අපේ රජය විසින් මේ ජීවන වියදම අඩු කරන්න.

විශේෂයෙන් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. විශේෂයෙන් දිවි නැගුම වැඩ සටහන. අද ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයේ සිට විසි පන් ලක්ෂය දක්වා ගෙනියලා ඒ ජනතාව සමෘද්ධිමත් කරන්න විශේෂ වැඩ සටහන්, කෘෂිකාර්මික වශයෙන්, ධීවර වශයෙන්, පශු සම්පත් වශයෙන්, ඒ වාගේම සුළු අපනයන භෝග ප්‍රවර්ධන ආදී

[ ගරු නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු ]

කටයුතු අද කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන් විදේශ ආයෝජන අද වැඩි වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා තිබෙනවා. සංචාරක හෝටල් ඇති වෙලා තිබෙනවා. ඒවායෙන් සෘජු හා වක්‍ර රැකියා ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද සමෘද්ධිමත් වැඩ පිළිවෙළකට අතිගරු ජනාධිපතිතුමා මේ රට ගෙනියනවා. ඒ ගෙනියන වැඩ පිළිවෙළට අපි තමුන්නාන්සේලා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න ඕනෑ.

මම අවසාන වශයෙන් කියනවා, මේ රටේ ජනාධිපතිවරු පස් දෙනෙක් පත් වුණා. පස් වැනි ජනාධිපතිවරයා අපේ අතිගරු ජනාධිපතිතුමා. එතුමා තමයි මේ රට නිදහස් කර ගත් ජනාධිපතිතුමා. ලබන වර්ෂයේ තිබෙන ජනාධිපතිවරණයෙන් ඒකාන්ත වශයෙන්ම මේ රටේ නැවතත් ජනාධිපති වෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.20]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිත්සිරි කටහපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ආණ්ඩු පක්ෂය වශයෙන් සංශෝධනයක් එක් කරනවා. විශේෂයෙන්ම ජීවන වියදම අඩු කිරීම සඳහා වත්මන් රජය ගෙන යන වැඩ පිළිවෙළ ශක්තිමත් කරලා, ඒ වැඩ පිළිවෙළ තුළින් ජනතාවට සහන ලබා දිය යුතුයි කියන යෝජනාව සභාවට එක් කරනවා. මේ අවස්ථාවේදී මේ වැඩ පිළිවෙළ. මොකද, අපි දන්නවා අතීතයේ ඉඳන්ම මේ දක්වා ආපු හැම රජයක්ම මුහුණ දීපු ප්‍රධානතම ගැටළුව තමයි ජීවන වියදම් ප්‍රශ්නය. ඒ ජීවන වියදම් ප්‍රශ්නය විසඳීම සඳහා ඒ තිබුණු රජයන් විසින් පැහැදිලි වැඩ පිළිවෙළක් නොගැනීම තුළ තමයි අදත් විපක්ෂය ආණ්ඩු පක්ෂයට එරෙහිව චෝදනා එල්ල කරන්න සුපුරුදු මාතෘකාවක් කර ගෙන තිබෙන්නේ, මේ ජීවන වියදම කියන එක. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය තුළ මේ ජීවන වියදම අඩු කරලා මේ රටේ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළට ගෙනැල්ලා ඒ තුළින් මේ රටේ ජනතාව ශක්තිමත් ආර්ථිකයක් පිරි ජනතාවක් බවට පත් කරන්න වැඩ පිළිවෙළක් ගෙනැල්ලා තිබෙනවා. ගෙවුණු අවුරුදු කිහිපයේදී ආපස්සට හැරිලා 10 වන අයවැය එන කොට අපට පෙනෙනවා, එහි ප්‍රතිඵල ජනතාවට එකින් එක භුක්ති විඳින්න පුළුවන් අවස්ථාවක් අපට ලැබිලා තිබෙනවා කියලා. අද මේ රටේ තත්ත්වය පිළිබඳව පැහැදිලිව අපි කථා කළොත්, එදා අතිගරු ජනාධිපතිතුමා මේ රට භාර ගන්න කොට මේ රටේ තිබුණේ එකම යුද්ධයක්. මේ රටේ ආර්ථිකය පිළිබඳව කිසිදු බලාපොරොත්තුවක් රටේ ජනතාවට තිබුණේ නැහැ. අපට හෙට දවසේ අපේ දරුවෙකුට මේ රටේ පැහැදිලිව ජීවත් වෙන්න පුළුවන් රටක් ද දෙන්නේ කියන බලාපොරොත්තුවක් එදා අතිගරු ජනාධිපතිතුමාට මේ රට භාර දෙන කොට අපට තිබුණේ නැහැ. ඒ ගෙවුණු අවුරුදු කිහිපය දිහා බලලා අද මේ වන කොට මේ රට කොපමණ දුර ගමනක් ඇවිල්ලා තිබෙනවාද කියන එක පිළිබඳව තමයි මේ රටේ ජනතාව අපි තීරණය කරන්න ඕනෑ. මේ රටේ පාරක තොටක යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ රටේ ආයෝජකයෙකුට ඇවිල්ලා තමන්ගේ කර්මාන්තයක් ආරම්භ කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ රටේ නිදහසක් තිබුණේ නැහැ. ඒ වාගේම මාර්ග තිබුණේ නැහැ. ඒ අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරලා තිබුණේ නැහැ.

මේ රටේ ප්‍රධානම ප්‍රශ්නය වුණු යුද්ධය අවසන් කරලා, ඉන් පස්සේ ආර්ථික සංවර්ධනය ඇති කරන්න දැවැන්ත සටනක නියැලිලා තිබුණේ. ඒ තුළ අපට මතකයි දවසේ පැය 24, පැය 12, පැය 08 විදුලිය කපලා දැම්මා. අද මේ රට විදුලියෙන් ශක්තිමත් රටක් බවට පත් කරලා තිබෙනවා. නොරොච්චෝලේ තාප බලාගාරය ආරම්භ කරන්න, ඉහළ කොත්මලේ ව්‍යාපාරය ආරම්භ කරන්න කිසිදු දේශපාලන පක්ෂයකට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ අභියෝගවලට මුහුණ දීලා ඡන්දය නොවෙයි මේ රටේ අනාගතය ගැන හිතලා ඒ ව්‍යාපාර ආරම්භ කරපු නිසා අද මේ රට විදුලි ව්‍යාපෘති තුළින් ශක්තියක් ලබා දෙන්න පුළුවන් වුණා. එහි ප්‍රතිඵල ජනතාවට ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. අද විපක්ෂය මොන චෝදනා එල්ල කළත් ජනතාවගේ විදුලි බිල 25% ක් අඩු කරන්න පුළුවන්කම ලැබුණේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළ ගෙනාපු වැඩ පිළිවෙළ නිසා තමයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ජනතාවගේ ආර්ථිකය නගා සිටුවන්න අද - රජයක් ගෙනියන්න බදු අවශ්‍ය වෙනවා. ඒ බදු ගෙවන්න ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න වෙනවා. අද සෘජු බදු හා වක්‍ර බදු කියලා දෙයාකාරයෙන් බදු

අය කරද්දී සෘජු බදු ගෙවන ජනතාවගේ ආදායම් තත්ත්වය ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් රජය ගෙනියනවා වාගේම අනෙක් ජනතාව ශක්තිමත් කරන්නත් වැඩ පිළිවෙළක් ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම දිවි නැගුම හරහා ආර්ථික කටයුතු අමාත්‍යාංශය තුළින් ගමේ ජනතාවගේ ආර්ථිකය නගා සිටුවන්න, හැම කෙනෙකුටම අවශ්‍ය ශක්තිය ලබා දෙන්න රජය කටයුතු කරලා තිබෙනවා. ඒ තුළ ගමේ ඉන්න ස්වයං රැකියාවක් කරන්න කැමැති දුප්පත්ම ජනතාවටත් ගම් මට්ටමෙන් අවශ්‍ය පහසුකම අද ලබා දෙන්න රජය කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ආර්ථික සංවර්ධන නිලධාරීන් ගම්වල පත් කරලා, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීලා මේ සියල්ල තුළින් කරන්නේ ගමේ ජනතාවගේ අවශ්‍ය පහසුකම ගමට ලබා දීමයි.

ඒ වාගේම මාර්ග පද්ධතිය අද මුළු රට තුළම සංවර්ධනය කරලා තිබෙනවා. එදා කොළඹට පමණක් සීමා වුණු සංවර්ධනය අද හැම ගමකටම ගිහිල්ලා තිබෙන්නේ ගමේ ඇති වන හැම නිෂ්පාදනයක්ම පහසුවෙන් වෙළඳපොලට ඇවිල්ලා, ඒ තුළ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ගේන්න. ඒ වාගේම අද අලුත් ව්‍යාපෘති වශයෙන් හම්බන්තොට වරාය ව්‍යාපෘතිය ඇති කරලා තිබෙනවා. අද මෙතුමන්ලා මෙතැන ඉඳගෙන හම්බන්තොට ගැන කථා කරනවා. නමුත් ඒ ප්‍රදේශවල ඇති වෙලා තිබෙන වෙනස, විපර්යාසය ඇති වෙමින් පවතිනවා. එදා මහවැලි ව්‍යාපාරය ඇති වෙන කොට, එහෙම නැත්නම් වලවේ ව්‍යාපෘතිය ඇති වෙන කොට එදා කියන්න ඇති ජනතාව මේක සාර්ථක වෙන්නේ නැහැයි කියලා. නමුත් අද අවුරුදු 20 ක්, 25 ක්, 30 ක් යන කොට ඒවායේ සාර්ථක ප්‍රතිඵල ජනතාව භුක්ති විඳිනවා. ඒ නිසා අද මේ ඇති කරන මහා ව්‍යාපෘති තුළ වරාය හෝ වේවා, එහෙම නැත්නම් ගුවන් තොටුපල හෝ වේවා මේවායේ ශක්තිය තව අවුරුදු කිහිපයකින් මේ රටේ ජනතාවට ලැබෙනවා. ඒ නිසා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මේ ගෙනියන වැඩ පිළිවෙළ තුළ ඒ වැඩ පිළිවෙළ ශක්තිමත් කරලා, ජීවන වියදම අඩු කරන්න රජයට ඒ තුළින් ජනතාවට ඉක්මන් සහන ලබා දෙන්න කටයුතු කරන්න කියන දේ ඉල්ලා සිටිමින්, මේ යෝජනාවට සංශෝධනයක් වශයෙන්

"*ජීවන වියදම අඩු කිරීම සඳහා රජය ගෙන යන වැඩ පිළිවෙළ ශක්තිමත් කර ජනතාවට ඉක්මණින් සහන ලබා දිය යුතු යැයි" කියන* සංශෝධිත යෝජනාව මේ සභාවට යෝජනා කරනවා.

අතිගරු ජනාධිපතිතුමා ගෙන යන මේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න ඔබ සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින්, පසුගිය මැතිවරණ හැම එකකදීම අපි දැක්කා මේ රටේ ජනතාව ඒ වැඩ පිළිවෙළ පිළිගන්නවා. විපක්ෂය පසුගිය ඌව පළාත් සභා මැතිවරණය වන කොට මේ රටේ ජනතාවගේ මතය අනික් පැත්ත පෙරළන්න නොයෙකුත් බොරු ප්‍රචාර ගෙන යමින්, ජනතාවට නොයෙකුත් දේවල් දීලා විශාල දෙයක් බලාපොරොත්තු වෙලා ඌව ජයග්‍රහණය කරන්න ගියේ. නමුත් ඌවේ ජනතාව ඒකේ ප්‍රතිඵලය අනික් පැත්තට හරවලා ආණ්ඩුවට පළාත් සභාව ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා. මේ ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක රජය ඉන්නවා. මේ වැඩ පිළිවෙළ අද හෙට කඩාකප්පල් කළොත් මේ ගෙනාපු වැඩ පිළිවෙළේ ප්‍රතිඵල ජනතාවට ලබා ගන්න නොහැකි වෙනවා.

ඒ නිසා මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ තුළ, ආර්ථිකය ශක්තිමත් කරන්න ගෙන යන වැඩ පිළිවෙළ තුළින්, ජනතාවගේ ආදායම වැඩි කරන්න ශක්තිය ලබා දීලා, ඒ තුළින් ජනතාවට සහන ලබා දෙන්නය කියන එක තමයි අපි යෝජනා කරන්නේ. මොකද, අපි කවුරු හරි කියනවා නම් බදු අඩු කරන්න කියලා. බදු අඩු කරලා මේ සංවර්ධන ව්‍යාපෘති නැවත මග නැවැත්තුවොත් මේ බදු ලබා ගත යුතුයි. බදු ලබා ගන්න ජනතාවට තව තවත් ඒ සඳහා ආදායම වැඩි වෙන ව්‍යාපෘති ඇති කරන්න ඕනෑ. ඒ ව්‍යාපෘති ගෙනියනවා මිසක් බඩු අඩු කරන්න නොවෙයි.

මොකද, අපට මතකයි. මේ රටේ ආණ්ඩු කළා. සමහර අවස්ථාවල පිටරටවලින් ණය අරගෙන බදු දුන්නා. ඒවායෙන් කළේ සීනිවලට, පරිප්පුවලට, පෙට්‍රල්වලට සහනාධාර දීපු එක. ඒ තුළ මේ රටේ ණය වැඩි වුණා මිසක් මේ රටේ සංවර්ධනයක් වුණේ නැහැ. අද මේ රජය ලබා ගන්නා හැම ණය මුදලක්ම මේ රටේ අනාගත ආයෝජනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවා ශක්තිමත් කරලා, මේ ගෙන යන වැඩ පිළිවෙළ තුළින් ජනතාවගේ ආර්ථිකය තුළ ඉදන්ම මහා පරිමාණයෙන් ගෙන යන වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්නය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.26]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙන එන මේ යෝජනාව ප්‍රායෝගිකව බැලුවොත් බස්නාහිර පළාතට මෙවැනි තත්ත්වයක් හදා ගන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්. ඇත්තටම ඒක යථාර්ථයක් වෙන්නේ නැහැ. නමුත් මා විශ්වාස කරන්නේ මේ යෝජනාව හරහා මේ මොහොත වන කොට මේ බස්නාහිර පළාතේත්, ඒ වාගේම මුළු මහත් රටේත් ජනතාව පත් වෙලා තිබෙන තත්ත්වයන් සාකච්ඡා කර ගැනීමට මේ යෝජනාව ඉවහල් වෙනවාය කියන විශ්වාසයයි තිබෙන්නේ. ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ගත කරන මේ සමාජ ජීවිතය ඇතුළේ සතුටින් ඉන්න මිනිස්සු හම්බ වෙන්නේ නැහැ. අති බහුතරයක්, ජීවත් වෙන්න තිබෙන අමාරුකමෙන්, ජීවත් වෙන්න තිබෙන ඒ බැරිකමෙන් අමාරු තත්ත්වයකට පත් වෙලා ඉන්න ජනතාවක් තමයි රටේ ඉන්නේ. ඒ නිසා කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන පරිදි බස්නාහිර පළාතට මෙහෙම දෙයක් සම්මත කර ගන්න අපට පුළුවන් නම් මා විශ්වාස කරන්නේ සබරගමුව පළාතේ ඇහැළියගොඩ ජීවත් වෙන මනුස්සයාත් ඇවිල්ලා අවිස්සාවෙල්ලේ පැල් කොටයක් ගහ ගනියි. මොකද, තමන්ගේ ජීවිතයට බස්නාහිර පළාතෙන් මේ සහනය ලැබෙනවාය කියලා. ඉතින් ඒ නිසා තමයි කියන්නේ, අද මේක යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැයි කියලා. අද මධ්‍යම ආණ්ඩුව මේ පළාත් සභාවේ විතරක් නොවෙයි ප්‍රාදේශීය සභාවට, නගර සභාවට අයිති ආදායම් මාර්ගත් මධ්‍යම ආණ්ඩුවට එකතු කර ගනිමින් ඉන්නේ. විශේෂයෙන් මධ්‍යම ආණ්ඩුව පාර්ලිමේන්තුවේ සම්මත කර ගත් අයවැය යෝජනා හරහා ප්‍රාදේශීය සභාවට, නගර සභාවට තිබුණු මූල්‍ය සම්පත් ගණනාවක්ම පාර්ලිමේන්තුවට නතු කර ගත්තා. දිවි නැගුම පනත හරහා ඒක සිද්ධ වුණා. ඉතින් ඒ නිසා මේ තත්ත්වයන් අපට සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි, යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ තත්ත්වය විශේෂයෙන්ම - අවසාන වශයෙන් මේ ධනේශ්වර පාලකයින්ට තමන්ගේ ගැලවුම්කාරයන් බවට පත් වෙන්නේත්, මේ තිබෙන තත්ත්වය ඇතුළේ පීඩාවට පත් වෙන මිනිස්සුම තමයි. ඒ නිසා තමයි පසුගිය ඌව පළාත් සභා මැතිවරණයේදී ඇත්තටම නියං සහනාධාරවලට මුවා වෙලා ජනතාවට රුපියල් දෙදහස් පන්සීය ගණනේ බෙදුවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ඒකට විරුද්ධ වෙන්න බැරි වුණා. මොකද, මේ බලා ගෙන ඉන්න අපට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මොහොතක් ඉන්න. සභාවේ කාලය දීර්ඝ කිරීමට ගරු අමාත්‍යතුමාට අවස්ථාව.

# රීති අංක 09 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO: 09

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"න්‍යාය පත්‍රයේ අංක XI සහ රීති අංක 30 හා 31 යටතේ ඉදිරිපත් වූ විෂයයන් පිළිබඳ වැඩ කටයුතු අංක 8(5) හා 8(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා තමයි රූපවාහිනී නාලිකාවල ගිය ප්‍රවෘත්ති හරහා එක තැනක ජනාධිපතිතුමාම සහභාගී වෙලා කියනවා, නියං සහනාධාර ඒ ලබන්න ඕනෑ අයට විතරක් නොවෙයි. මම නියෝග කළා අද ඉඳන් හැම එකාටම දෙන්න කියලා. මම හිතන්නේ ජනාධිපතිතුමා එහෙම නොවෙයි ඒක කියන්න බලාපොරොත්තු වුණේ. නමුත් ඇත්ත ජනාධිපතිතුමාගේ කටින් පිට වුණේ අන්න ඒ ටික. ඒ තමයි ඇත්ත ජනාධිපතිතුමා. ඒ නිසා ඒ ගැලවුම්කාරයන් බවට පත් වෙන්නෙත් මේ අහිංසක මිනිස්සු. ඒ නිසා බඩු මිල අඩු කරන්න පුළුවන්, බඩු මිල වැඩි වුණොත්. විදුලි බිල වැඩි කළොත් තමයි අවශ්‍ය තැනදී අඩු කරන්න පුළුවන් වෙන්නේ. ඇත්තටම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා මම විශ්වාස කරන්නේ මෙතැන - අපි දන්නවා අයවැයේ

මුදල් ඇමතිතුමා හැටියට එතුමාගේ තිබෙන පුංචි හෝ රහසක් දන්නේ උපාලි කොඩිකාර ඇමතිතුමා. එතුමාගෙන් බොහොම අපැහැදිලි විධියට මෙතැනට ඒක වැක් කෙරුණත් ඇත්තටම එතුමා කියන කාරණය ඇතුළේ තිබෙනවා ඊළඟට සහන අයවැයක් එනවා කියලා. ඒක එතුමා දන්නේ ඒ රාජපක්ෂ පවුලත් එක්ක සහසම්බන්ධයක් එතුමාට තිබෙන නිසා. ඒ නිසා ඒ එතුමා කියන දේවල් හරි වැදගත් මේ සභාවට. හරිම වැදගත් මේ සභාවට.

ඒ නිසා මේ තත්ත්වය ඇතුළේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද උසාවි කියන්නේ මේ සමාජය ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක වෙලා කටයුතු කරන්න තිබෙන ආයතනයක් නොවෙයි. උසාවිය කියලා කියන්නේ අද ආණ්ඩුවේ ගැලවුම්කාරයා බවට පත් වෙලා තිබෙන, මහා භාණ්ඩාගාරයට මුදල් එකතු කරන තැන. උසාවියකට ගිහිල්ලා බැලුවොත්, ටිකක් වෙලා හිටියොත්, පැයක් එකහමාරක් හිටියොත් අපි ගණන් හදලා බැලුවොත් අපට පේනවා එක උසාවියකින් කොපමණ මුදලක්, ආදායමක් ආණ්ඩුවට එකතු කරලා දෙනවාද කියලා. ඉතින් ඒවාට මත්පැන් තිබෙන්න ඕනෑ. ගංජා තිබෙන්න ඕනෑ. කුඩු තිබෙන්න ඕනෑ. ඒවායින් තමයි ආණ්ඩුවට මුදල් ටික එකතු කරලා දෙන්නේ. ඉතින් ඒ නිසා එහෙම තත්ත්වයකට පත් වුණු සමාජයක, රටක අපට හැකියාවක් නැහැ බස්නාහිර පළාත් සභාව ඒකෙන් ගලවා ගන්න. ඒ නිසා මම කියන්නේ, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙන එන යෝජනාව හොඳයි. හැබැයි, ඒක ප්‍රායෝගික නැහැ. ඒක වෙන්නේ නැහැ. අපට මේ සම්බන්ධව සාකච්ඡා කරන්න පුළුවන්.

මේ පසුගිය කාලයේ උසස් පෙළ කරන ආර්ථික විද්‍යා විෂය හදාරන එක්තරා දරුවෙක් අපට කිව්වේ. ඒ දරුවාගේ පන්තියේ ළමයෙක් ප්‍රශ්නයකට උත්තර දීලා තිබෙන හැටි. ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ තිබෙන ඒ ප්‍රශ්නය තමයි, රටක බඩු මිල හෝ උද්ධමනය අඩු කිරීමට ගත හැකි ක්ෂණික ක්‍රියාමාර්ග මොනවාද? අපිත් සොයන්නේ ක්ෂණික ක්‍රියාමාර්ග. ප්‍රශ්න පත්‍රයේ අහන්නෙත් ඒකයි. රටක බඩු මිල හෝ උද්ධමනය අඩු කිරීමට ගත හැකි ක්ෂණික ක්‍රියාමාර්ග මොනවාද? මම දන්නේ නැහැ මේ ළමයා ඒ උත්තරේ විභාගයට ලිව්වාද? එහෙම නැත්නම් සමහර ප්‍රශ්න තිබෙනවා න්‍යායාත්මක උත්තරේ නැති වුණාට, ඒකට මොනවා හරි ගහලා දාන්න. දන්න ප්‍රායෝගික අත්දැකීමෙන් ගහලා දාන්න. ඒ නිසා එහෙම දීපු උත්තරයක් ද දන්නේ නැහැ. මේ ප්‍රශ්නයට ඒ ළමයා දීලා තිබෙන උත්තරය තමයි, විදුලි බලාගාරයක් හෝ එහි කොටසක් විවෘත කිරීමට චීන ජනාධිපතිවරයා ගෙන්වා ගැනීම කියලා. ක්ෂණිකව මුදල් උපයන්න පුළුවන්. ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍රයක තිබෙන්නේ. පොඩ්ඩක් සොයලා බලන්න. අපි නම් ඕවා සොයනවා. ඔබතුමන්ලා සොයන්නේ නැති එකයි ප්‍රශ්නය ඕවා. අපි නම් ඒවා සොයනවා. ඉතින් ඒ නිසා ඒක තමයි (බාධා කිරීම්)

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
**Hon . Neel Sunethra Lal Fernando**

පිළිතුරු පත්‍රය කොහොමද සොයා ගත්තේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

මට පුංචි කාලයයි හම්බ වුණේ. ඒ නිසා මම මගේ කථාව අවසන් කරනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
**Hon . Neel Sunethra Lal Fernando**

මම හිතන්නේ, අනුර කුමාර දිසානායක මහත්තයා විභාග කොමසාරිස්වරයා වෙලා ඉඳලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

ඒ වාගේම අද මෙතැන ඉඳන් ඉන්න කොට මම මේ කල්පනා කළේ අපේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
**An hon. Member**

බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගෙන් ඉල්ලා ගන්න ඇති.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

එතුමාගෙන් වුණත් මම ගන්නවා, ගන්න දෙයක් තිබෙනවා නම්. එතුමන්ලා දෙනවා අනික් එක අපට. එතකොට ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාට තමයි ඉල්ලා ගන්න අමාරු. ඔබතුමා අද උදේ මෙතැන පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී කිව්වා, ඔබතුමාගේ කථාව අවසන් කළේ ඊළඟ ජනාධිපතිවරණයේදී ජනාධිපතිතුමා, දැනට ඉන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඊළඟ ජනාධිපතිවරණය දිනන්නේ වැඩි ඡන්ද ලක්ෂ 20 කින්

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

කියලා. මම මෙතැන ඉඳන් කල්පනා කළේ රාජපක්ෂ මහත්තයා වීනෙන්ද ඡන්දය ඉල්ලන්නේ කියලා. බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව දීර්ඝ වශයෙන් මේ සභාවේ කථා කළා. නමුත් යම් යම් කරුණු ආවේගශීලීව දෙපැත්තෙන්ම ඉදිරිපත් කළා. කෙසේ වෙතත් එතුමා ගෙනාපු යෝජනාවට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා සංශෝධනයක් ගෙනාවා. නමුත් ඒ යෝජනාව ඇතුළේත් එකම අදහසක් ගැබ් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ සංශෝධනයට එකඟ ද කියලත් බලන්න ඕනෑ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව වශයෙන් මම විනාඩි දෙකක කාල සීමාවක් ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අද ඉතාමත් සතුටු වෙනවා බස්නාහිර පළාතේ ජනතාවට සහන ලබා දීම සඳහා යෝජනාව ඉදිරිපත් කරපු අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයේ තවත් පක්ෂ ගණනාවක නොයෙකුත් වාද විවාද මැද්දේ මේ ලබා දෙන සහනය කොයි ආකාරයෙන්ද ලබා දෙන්න පුළුවන් කියන තර්කය මේ හැමෝගේම කථාවල තිබුණා. නමුත් මේ පළාත් සභා පනතයි මධ්‍යම ආණ්ඩුවේ මුදල්, බදු එකතු කරන ක්‍රමයයි බැලුවාම අපට පැහැදිලිවම කියන්න පුළුවන් මේ පළාත් සභාවට මේ යෝජනාව යටතේ අපි හරියාකාරව අධ්‍යයනය කරලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් මේ පළාතේ ජනතාවට ඊළඟ පළාත් සභා අයවැයෙන් මේ සහන දෙන්න පුළුවන් කියන එක මම මතක් කරන්න කැමැතියි. ඊළඟට මේ විවාදයේදී ඉතාමත්ම තර්කානුකූලව වාද විවාද වුණා පක්ෂ දේශපාලනය. අන්න එතැන තමයි වැරදුණු තැන. ශ්‍රී ලංකාවේ පක්ෂ දේශපාලනය නිසා නැති වුණු ආර්ථිකයයි, නැති වුණු ජීවිතයි, නැති වුණු අපේ අපකීර්තිය අති විශාලයි. අපට මෙය උදා වුණේ මෙන්න මේ ක්‍රමවේදය අපේ රටේ පුරවැසියන්ගේ ඡන්දය ගත් දේශපාලඥයින් ඉස්සරහාට දාලා කථා කරපු නිසාය කියන එකත් මම අනික් කාරණය හැටියට මතක් කරනවා.

ඊළඟට රාජ්‍ය සේවාව පිළිබඳව අපි කථා කරන කොට රාජ්‍ය සේවාව දේශපාලනයට ගිය තැන කවදාවත් රටක් සංවර්ධනය වුණේ නැහැ. අපට මතකයි, 1977 දී මේ රටේ ආර්ථිකය කඩා වැටීම ජනතාවගේ අසරණභාවයට පත් වීම, පෝලිම් යුගයේ ඉඳගෙන භාණ්ඩ ලබා ගැනීමට ජනතාව විඳපු දුක. කිරිපිටි පැකට් එක ගන්න ගියාම තිබෙන අඳෝනාව දිහා බැලුවාම අපට මතකයි 1977 දී අපේ රජය බලයට පත් වුණාට පස්සේ ආර්ථිකය විවෘත කළාම මේ රටේ දුප්පත් ජනතාවගේ දරුවන්ට නොයෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට යන්න පුළුවන්කම ඇති වුණා. ගමේ තිබුණු කරත්තය, විල් බැරැක්ක අත් හැරලා අද තිබෙන නවීන පන්නයේ යාන වාහන ගම්වලට ලබා ගන්න විවෘත ආර්ථිකයෙන් මේ රටේ පුළුවන්කමක් ඇති වුණා. ඒ විවෘත ආර්ථිකය තුළ මේ පළාත් සභා ක්‍රමය හදලා මේ ගොඩනැගිලි ගෙනැල්ලා ජනතාවගේ පළාත් නවයක් කියන තැනක ඉඳගෙන රාජ්‍ය සේවාව, පළාත් සභා ක්‍රමය තුළ ජනතාවගේ මුදල් වියදම් කරන්න බලතල හැදුවේ, ඒ 1977 න් පස්සේ අපි ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන ඇතිවයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඊළඟට මට මතකයි, ඔබතුමන්ලා 1994 දී පාලනය ගන්න කාලයේ මේ රටේ අපි භාර දීපු ආර්ථික රටාවයි, ජනතාවගේ ඒක පුද්ගල ආදායමයි දිහා අරගෙන බැලුවාම අද තිබෙන තත්ත්වය දිහා බැලුවාම එදා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ජනාධිපතිවරයෙක් නොවී මේ රටේ අග්‍රාමාත්‍ය ධූරය ලබා ගත්තා. එසේ ලබා ගන්න විට විදුලිය පැය හත, අට කපාපු රටේ එතුමාගේ පරිපාලනයේ තිබුණු ශක්තිය නිසා විදුලි කප්පාදුව නැති කළා. යුද්ධය කොළඹට ඇවිල්ලා, බස්නාහිර පළාතේ මිනිස්සුන්ව මරලා, තෙල් සංස්ථාවට ගහලා, ඒ වාගේම දළදා මාළිගාවට ගහගෙන යන කොට යුද්ධය ගමට ආවාය කියලා කෑ ගහපු මිනිස්සුන්ට සහනයක් ලබා දෙන්න එතුමා සාම ගිවිසුම අත්සන් කිරීම තුළ මේ රටේ සෘණ ආර්ථිකයක් තිබුණු රට ධන ආර්ථිකයකට පත් කරන්න පුළුවන් බුද්ධිමත් තීරණ අරගෙන පක්ෂ විපක්ෂ සියලු දෙනාම ඒකරාශී කරලා ඒ සේවාව ඒ සහනය රටේ ජනතාවට ලබා දුන්නා. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය අවසන් නිසා කොපමණ කරුණු කියන්න තිබුණත් ඒ සඳහා අවස්ථාව නැති නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ සභාවේ අද මේ පිළිබඳව කථා කරපු මන්ත්‍රීතුමන්ලා පිළිබඳව මම දැඩි කනගාටුවකට පත් වෙනවා. සමහර මන්ත්‍රීවරු විෂය අධ්‍යයනය කරලා, වර්ෂයට ලැබෙන

ආදායම, බදු මුදල පිළිබඳව විවේචනයක් ඇති කරවමින් යෝජනා ඉදිරිපත් කළා. මේක ජනතාවට ලබා දෙන්න පුළුවන් ක්‍රමය පිළිබඳව කටයුතු කරන්නය කියලා. එහෙම නම් මේ සියලු කාරණා අපි බුද්ධිය තිබෙන අය හැටියට, පළාත් සභා පනතේ තිබෙන බලය අධ්‍යයනය කරලා අවබෝධය ඇති මිනිස්සු හැටියට අපි එකතු වෙලා ඊළඟ අයවැය මේ සභාවට එන කොට යම්කිසි සහන රාශියක් මේ පළාත් සභාවේ මහජන නියෝජිතයන් වන අපට ඡන්දය ලබා දීපු ජනතාවට සහන ලබා දෙන්න ශක්තිය, ධෛර්යය මේ පළාත් සභාවට ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ යෝජනාවට සහයෝගය දක්වපු සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් ඉදිරිපත් කළ සංශෝධනය අපි භාර ගනිමින්, එයට යටත්ව මෙය සම්මත කර ගන්නය කියලා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් මම හිතන්නේ සංශෝධනයට යෝජක ගරු මන්ත්‍රීතුමා එකඟ වුණා. ඒ නිසා සංශෝධිත යෝජනාව පිළිබඳව එකඟතාවය විමසනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙවැනි පෞද්ගලික මන්ත්‍රී යෝජනාව විවාදයට ගන්න ප්‍රමාණවත් කාලසීමාවක් නැහැ. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ යෝජනාව ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. ඊළඟට කල් තබන අවස්ථාවේ ඉදිරිපත් වූ ප්‍රශ්න හා යෝජනාවට අවස්ථාව.

## කල් තබන අවස්ථාවේ අසන පළමු ප්‍රශ්නය
## FIRST QUESTION ASKED AT THE TIME OF ADJOURNMENT

**01.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් රීති අංක 30 යටතේ අසන ලද ප්‍රශ්නය :**

අ. ඔබ අමාත්‍යාංශය යටතේ "ජන දිරිය" නමින් වැඩ සටහනක් ක්‍රියාත්මක වේද?

ආ. එහි අරමුණ කුමක්ද?

ඇ. මෙමගින් සහන ලබන පිරිස කොපමණද?

ඈ. එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

ඉ. ලබන පහසුකම්(සපයන)වල සීමාව කුමක්ද?

ඊ. අදාළ වැඩ සටහනට මුදල් ලැබෙන්නේ කෙසේද?

උ. කොපමණ මුදලක් වැය කිරීමට බලාපොරොත්තු වන්නේද?

ඌ. මෙම මුදල් තැන්පතුවකින් ලබා ගන්නේද? එසේ නම් වැය කරන මුදල තැන්පතුවේ කවර ප්‍රතිශතයක්ද?

එ. තැන්පත්කරුවන් හදිසියේ යළි තම තැන්පතු ඉල්ලා සිටියහොත් ඊට යොදා ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

ඒ. නිමල් ලාන්සා පදනම හා "ජන දිරිය" අතර සබඳතාව කුමක්ද?

ඔ. පළාතේ සෙසු මන්ත්‍රීවරුන් මෙම වැඩ සටහනට සම්බන්ධ වන්නේ නම් ඒ කෙසේද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා තමන්ගේ ස්ථානයට ගියා නම් තමයි ගැලපෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කාටවත් බාධාවක් කළේ නැහැ නේ? අනික් කට්ටිය එක එක තැන්වල ඉඳගෙන ඉන්නවා. ඔබතුමාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා උත්තර දෙන්න ලැහැස්ති වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට ඕනෑ තැනක ඉඳගෙන ඉන්න අයිතියක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා පුටුවට යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම මෙතැන ඉඳගෙන ඉන්න එක ගැන පොඩි හයක් තිබෙනවා වාගේ. නිමල් ලාන්සා ඇමතිතුමා නියෝගයක් දුන්නාද දන්නෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

***පිළිතුර :***
*Reply:*

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අ. ඔව්.

ආ. ගෘහ ආර්ථිකය නැංවීම සඳහා පවුල් ඒකක සාමාජිකයන් ආදායම් උත්පාදන මාර්ග වෙත යොමු කිරීම.

ඇ. බස්නාහිර පළාතේ කුඩා ව්‍යවසායකයින් 10,000 ක් පමණ.

ඈ. මූලිකව බස්නාහිර පළාතේ කුඩා ව්‍යවසායකයින් සඳහා හඳුනා ගන්නා අතර, ඔවුන් අතරින් තාක්ෂණික පුහුණුව අවශ්‍ය අය සඳහා පුහුණුව ලබා දීමත්, කාරක ප්‍රාග්ධන අවශ්‍ය අය සඳහා ණය ලබා දීමටත් කටයුතු කෙරේ.

ඉ. ණය වැඩ සටහන සඳහා වයස් සීමාව 57 ක් වන අතර, විශේෂිත හැකියාවන් හා ව්‍යාපෘතවල නිරත වන්නන් සඳහා එකී ණය සීමාව නොලසකා ණය ලබා දීමට කටයුතු කෙරේ.

ඊ. අදාළ ණය වැඩ සටහන සඳහා දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගම්වල ආයෝජන මුදල් යොදවා ඇත.

උ. රුපියල් මිලියන 500 ක් පමණ. (කොළඹ 200 යි. ගම්පහ මිලියන 300 යි.)

ඌ. තැන්පතුවලින් දළ වශයෙන් 4% ක් පමණ මේ සඳහා වැය කෙරේ.

එ. තැන්පත්කරුවන්ගේ මුදල් 96% ක්ම තැන්පතුවල ඇත. එබැවින් ගැටළුවක් ඇති නොවේ.

ඒ. නිමල් ලාන්සා පදනම හා ජන දිරිය අතර නෛතික සබඳතාවයක් නොමැත. ණය වැඩ සටහන මෙහෙයවනු ලබන්නේ අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ජන දිරිය ව්‍යාපෘති කාර්යාලයෙනි.

ඔ. පළාත් මන්ත්‍රීවරුන්ට අදාළ ණය වැඩ සටහන සඳහා ප්‍රතිලාභීන් යොමු කිරීමට සියලු ඉඩකඩ විවෘතව ඇත.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට මාව පෙනුනාට අපේ සහන් ප්‍රදීප් මන්ත්‍රීතුමා ඉන්නේ වෙන පුටුවක කියලා පේන්නේ නැතිව ඇති නේද? ඉසුර දේවප්‍රිය මන්ත්‍රීතුමා. ඔබතුමා පක්ෂ පාට දිහා බලලාද මම ඉන්න පුටුව දිහා බලන්නේ. ඔබතුමා පක්ෂ පාටවලට වඩා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවේ එතුමාට බාධකයක් ලෙස ඔබතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිසිම බාධාවක් කළේ නැහැ. මගේ පාඩුවේ මම වැඩක් බලා ගෙන හිටියේ. බයිලා කියන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වාඩි වෙන්නම්. ඔබතුමා අනික් අයවත් ඉන්දවන්න හරි පුටුවේ. අනික් අයටත් හරි පුටුවට ඇවිල්ලා ඉඳගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමාගේ පුටුවේ ගරුත්වය රැක ගන්න නම්, ඔබතුමා අනික් අයටත් හරි පුටුවට ගිහිල්ලා ඉඳගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මේ මන්ත්‍රීතුමාගේ කථාවට පොඩ්ඩක් ඉඩ දෙන්න. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. ඒ කථාව නොවෙයි. මගේ කථාව ඉස්සෙල්ලා අහලා ඉන්න කෝ. ඔබතුමා මට කිව්වා ගිහිල්ලා පුටුවේ වාඩි වෙන්න කියලා. දැන් අනික් අයටත් කියන්න ගිහිල්ලා හරි පුටුවේ ඉඳගන්න කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බර බරේ වැඩියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තමන්ට පුටුවක් වෙන් කරලා තිබෙන්නේ. ඒ පුටුවේ වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි මමත් කියන්නේ. ඉසුර ගරු මන්ත්‍රීතුමා ඉන්නේ තමන්ගේ පුටුවේ නොවෙයි. සහන් මන්ත්‍රීතුමා ඉන්නේ තමන්ගේ පුටුවේ නොවෙයි. ඒකත් කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර මන්ත්‍රීතුමාගේ ගැටළුවක් නම් මම එතුමාව යවන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකත් කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාව නම් කරලා මම කරන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එළියට දාන්න නම් කරලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුන්නම් දාන්න එළියට. පුළුවන් නම් දාන්න. අනේ මේ බයිලා කියන්නේ නැතිව ඉන්න. මෙතුමා කොහොමද මාව එළියට දාන්න කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුවන් නම් දාන්න. මට ඉස්සෙල්ලා තමුන්නාන්සේව එළියට දානවා. පුළුවන් නම් දාන්න එළියට. (බාධා කිරීම්) නිකම් බයිලා කියන්න එපා. ඔබතුමාත් නිකම් බයිලාකාරයෙක් විතරයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

චණ්ඩි පාට් දාන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

චණ්ඩි පාට් දාන්න ඕනෑ. චණ්ඩි පාට් ඕනෑ නම් -

[සභාවේ ඝෝෂා]

මේ කවුද? ආත්මයක් නැති පක්ෂයක් -

[සභාවේ ඝෝෂා]

ආත්මයකුත් නැහැ. පක්ෂයකුත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුවන් නම් එළියට දාන්න. චණ්ඩි නම් දාන්න කෝ එළියට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නා තරමින් -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතුමාගේ කථාවට අවස්ථාව ලබා දෙන්න. මයික් එක ඕෆ් කරලා ගරු මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා පුටුවේ ඉන්නවා නම් පුටුවේ ගරුත්වය රැක ගන්න ඔක්කොටම ඉස්සෙල්ලා. මේ වාගේ අයව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වෙන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය සභාපතිතුමා එතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කිව්වාම එතුමා ඔබතුමා එක්ක කථා කරමින් සිටියා. එතකොට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමා කිව්වේ යන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. මම කථා කරමින් හිටියේ නැහැ. එතුමාගෙන් අහන්න. එතුමා සාක්ෂි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා ග්‍රාමීය බැංකු සාමාජිකයන්ට විතරයි සාමාන්‍යයෙන් ග්‍රාමීය බැංකුවලින් ණය ලබා දෙන්නේ. ඉතින් මම දැන ගන්න කැමැතියි ග්‍රාමීය බැංකු ව්‍යවස්ථාවේ මෙහෙම පිටස්තර අයට ණය ලබා දෙන්න නෛතික ප්‍රතිපාදන තිබෙනවාද කියලා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මේ ණය වැඩ සටහන ක්‍රියාත්මක කරන්නේ ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකුව සහ කොළඹ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය. මේ යටතේ ඕනෑම කෙනෙකුට පුළුවන් සාමාජිකත්වය ලබා ගෙන ණය ලබා ගන්න. ඒක මීට පෙරත් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ කියන්නේ මේ පුහුණුව ලබා දෙන සියලු දෙනා සාමාජිකත්වය ගත යුතුයි.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

නැහැ. පුහුණුව නැතිවත් ණය ගන්න පුළුවන්. පුහුණුව අවශ්‍ය නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒගොල්ලෝ සාමාජිකත්වය ලබා ගෙන තිබෙන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ණයක් ගනිද්දී සාමාජිකත්වය ගන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතකොට ග්‍රාමීය බැංකු සංගම්වල අනුමැතිය ඊට ලැබිලා තිබෙනවාද මේ වන කොට.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔව්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ වාගේ ණය ගත්තාම අපි බොහෝ වෙලාවට දැකලා තිබෙනවා ණය ආපසු ගෙවන්නේ නැහැයි කියලා. එහෙම යම් ප්‍රශ්නයක් මතු වුණොත් එහි වගකීම ගන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයද, එහෙම නැත්නම් -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙතුමාට ටිකක් දීර්ඝ උත්තරයක් දෙන්නම්. තමුන්නාන්සේලා ජනතාව වෙනුවෙන් කථා කරනවා නම්, ජනතාවගේ මුදල් ගැන කථා කරනවා නම් මම දීර්ඝ උත්තරයක් දෙන්නම්. මොකද, අද වන කොට මේ ග්‍රාමීය බැංකුවලින් ගන්න සල්ලි ගම්පහ දිස්ත්‍රික් බැංකු සංගමය ගත්තාම ආයෝජනය කරලා තිබෙන්නේ කොහේද කියලා ඔබතුමා දන්නවාද? කොහේද? සොෆ්ට්ලොජික් කියන මූල්‍ය ආයතනයේ. U.D.Finance කියන මූල්‍ය ආයතනයේ. කොමර්ෂල් ක්‍රෙඩිට් කියන මූල්‍ය ආයතනයේ. මේ වාගේ මූල්‍ය ආයතන 12 ක මුදල් ආයෝජනය කරලා තිබෙනවා. එතකොට මම ඇවිල්ලා ඇමතිවරයා විධියට මොකක්ද කළේ. මේ ජනතාවගේ සල්ලි - සමුපකාර ප්‍රඥප්තියේ, සමුපකාර නීතියේ තිබෙනවා 80% ක් ජනතාවට දෙන්න ඕනෑය කියන එක. වෙනත් මූල්‍ය ආයතනවලට දීලා තිබෙන සල්ලිවලින් 5% ක් අරගෙන මේ දුප්පත් ජනයාට, ව්‍යවසායකයාට රැකියාව කරන්න දෙන්න ගියාමත් තමුන්නාන්සේට තිබෙන අමාරුව මොකක්ද කියන එක මට විශාල ප්‍රශ්නයක්. මේ දුප්පත් මිනිස්සුන්ට උදව් කරන එක නැති කරන්න හදනවා තමුන්නාන්සේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ඔබතුමා මේ වාගේ ව්‍යාපෘතියක් කරන විට ජනතා නියෝජිතයෝ හැටියට අපට වගකීමක් තිබෙනවා, ඒ ගැන ඔබතුමාගෙන් අහන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා,මට තේරෙන්නේ නැහැ, ජනතාව වෙනුවෙන් පෙනී සිටින ඔබතුමන්ලා මූල්‍ය ආයතන වෙනුවෙන් පෙනී සිටින්නේ මොකටද කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූල්‍ය ආයතන වෙනුවෙන් පෙනී සිටින එක නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි ඇහුවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිසිම ආයතනයක් වෙනුවෙන් පෙනී සිටින්න නොවෙයි මෙහෙම ඇහුවේ. එතුමා වැරදියට වටහාගෙන. මේ මුදල් තැන්පතුකරුවන් නැවත ඉල්ලා සිටියහොත් ඒකේ වගකීම ගන්නේ කවුද කියලා ඇහුවේ. මූල්‍ය සමගම් මේකට සම්බන්ධ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒකට සෑහීමකට පත් වෙන්න පුළුවන් උත්තරයක් ඔබතුමාට ගරු ඇමතිතුමා දුන්නා කියලා මම හිතනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූල්‍ය ආයතනවල තිබෙනවා කියලා ඔබතුමා දැනුයි කියන්නේ. අපි ඒවා පස්සේ ගියේ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා මගෙන් අහනවා, මේ මුදල් ගෙව්වේ නැත්නම් කවුද වගකියන්නේ කියලා. එතුමා ඉතාම මෝඩ ප්‍රශ්නයක් අහන්නේ. සමුපකාර ප්‍රඥප්තිය අනුව ණය ලබා දීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි තිබෙනවා. නීති. සමුපකාර ප්‍රඥප්තිය තමයි මේ රටේ මුදල් ගෙවන්නේ නැත්නම් තිබෙන දරුණුම නීතිය ක්‍රියාත්මක වන ආයතනය. මේ යටතේ තමයි මුදල් ලබා දෙන්නේ. ලබා දෙන්නේ කාටද? බිලියන එ කක්

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

සොෆ්ට්ලොජික් ආයතනයේ තිබෙනවා. ඒකෙන් 2% ක්, 1% ක් අරගෙන මේ දුප්පත් ගමේ ඉන්න ව්‍යවසායකයාට දුන්නාම ඒක ගැන තමුන්නාන්සේ අද ප්‍රශ්න අහනවා. තමුන්නාන්සේ ප්‍රශ්න අහන්න ඕනෑ ඒක ගැන නොවෙයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද ඒ සල්ලි සොෆ්ට්ලොජික් එකේ දැම්මේ? ඒ සල්ලි කවුද දුන්නේ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක දිගින් දිගටම වෙලා තිබෙනවා. දිගින් දිගටම.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක කවුද දුන්නේ කියලා එහෙම නම් ඔබතුමා අපට කියන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒ නිසා ඉතාමත් පැහැදිලිව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සෑහීමකට පත් වෙනවා ඇති.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එදත් කිව්වා. මේ සමූපකාර ක්‍රියාත්මක වෙන්නේ ස්වාධීන ආයතනයක් විධියට. සමිතියේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් තමයි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වෙන්නේ. ඒකෙන් තමයි සභාපති පත් වෙන්නේ. එතකොට මේගොල්ලෝ ස්වාධීනව පත් වන අය තමයි තීන්දු තීරණ ගන්නේ. ඒක ඇමතිවරයාට සම්බන්ධයක් නැහැ. හැබැයි, මම ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ මම කල්පනා කළා, මේ සමූපකාර සේවාව තුළින් ගමේ දුප්පත් මිනිහාට උදව් කරන්නේ කොහොමද කියන එක. ඒ අනුව මම තීන්දු කරනවා, මෙතෙක් කල් කර ගෙන ආපු ඒ වැඩේ පොඩ්ඩක් ආපස්සට හරවලා - මොකද, අපට උදාහරණ තිබෙනවා ප්‍රමුඛ බැංකුවේ සල්ලි දාලා සල්ලි නැති වුණා. වණික් බැංකුවේ සල්ලි දාලා සල්ලි නැති වුණා. ගෝල්ඩන් කී එකට සල්ලි දාලා සල්ලි නැති වුණා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද දැම්මේ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඉතින් මම මේ දුප්පත් මිනිහා ගැන හිතලා, දුප්පත් මනුස්සයා ගැන හිතලා, මේ රටේ ව්‍යවසායකයින්ට පොඩ්ඩක් නැගී සිටින්න - මම තමුන්නාල්සේලාට උදාහරණයක් හැටියට කියන්නම් මම මේ තීන්දුව ගත්තේ ඇයි කියලා. මම කටාන ආසනය තුළ මළ ගෙදරකට ගියා. ගියාම මට පුද්ගලයෝ දෙන්නෙක් හම්බ වෙලා කියනවා, අපි අර පල්ලියට ගියාම ඉඳගන්න තිබෙන පුටුව හදනවා. ඒ පුටුව හදලා ආර්පිකෝ එකට දැම්මාට අපට දවස් 45 ක් යනවා මුදල් ලැබෙන්න. අපට කාරක ප්‍රාග්ධනය නැහැ. ඒ නිසා ඇමතිතුමා, අපට ණයක් දුන්නොත් - අපි මේ වෘත්තිය දන්නවා. අපට වෙළඳපොළ තිබෙනවා. ඒ නිසා ඒකට අවස්ථාවක් දෙන්න කියලා. ඒ වාගේම තවත් කෙනෙක් හම්බ වෙනවා DSI එකට සපත්තු අඩිය මහලා දාන දුප්පත් පවුලක්. DSI එකට දැම්මාම දවස් 25 ක් යනවා මුදල් ලැබෙන්න. මේගොල්ලෝ කියනවා කාරක ප්‍රාග්ධනය නැහැ. අපට මොනවා හරි සමූපකාර ක්ෂේත්‍රය තුළ - ඉතින් මේක තමයි ගත්ත තීන්දුව. තමුන්නාන්සේලා මේ තීන්දුව වැරදියි කියනවා නම් - දේශපාලඥයෝ පත් කරන්නේ ජනතාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු අමැතිතුමනි, ඔබතුමාගේ තීන්දුව වැරදියි කියන එක නොවෙයි ප්‍රකාශ කළේ. මේ පිළිබඳව -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම උත්තර දෙන්නේ ඒක තමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි. ඔබතුමාගේ තීන්දුව වැරදියි කියලා ප්‍රකාශ කළේ නැහැ. මේක වුණේ කොහොමද කියලයි අහන්නේ.

අවසාන වශයෙන් ඔබතුමා ඒ මුදල් ආයෝජනය කරලා තිබුණු තැන්වලින් සියලු මුදල් ආපසු ගන්නය කියලා එහෙම නම් ලිඛිත උපදෙස් දීලා තිබෙනවාද?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

නැහැ. එකපාර ගන්න බැහැ. මොකද, ග්‍රාමීය බැංකුවලින් දැනට මිනිස්සුන්ගෙන් සල්ලි අරන් තිබෙනවා විවිධ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමා හොඳින් උත්තර දුන්නා. සමුපකාර ප්‍රඥප්තියට අනුව ඒක කළාය කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවසාන වශයෙන් ඇහුවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. අතුරු ප්‍රශ්න ඕහොම අහන්න දෙන්න බැහැ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

අවසාන එකටත් උත්තරේ දෙන්නම්. මොකද, ග්‍රාමීය බැංකුවලින් ජනතාවගේ මුදල් තැන්පත් ලබා ගැනීමේදී විවිධ පොරොන්දු, විවිධ වරප්‍රසාද ලබා දීලා තිබෙනවා, ලිඛිතව. එතකොට මේක අරන් තිබෙන්නේ සමහර වෙලාවට 10% ට. 11% ට. 12% ට. එතකොට මේවා දාලා තිබෙන්නේ 13% ට හෝ 14% ට. එක ප්‍රතිශතයක් හෝ වැඩිපුර තියාගෙන. මේක මට එකපාර ආපස්සට හරවන්න බැහැ. ඒ නිසා මම ලිඛිතව කොමසාරිස්තුමා හරහා දැනුම් දීලා තිබෙනවා, ක්‍රමිකව මේ මුදල් නැවත ස්ථාවර බැංකුවල තැන්පත් කරන්නය කියන එක. ඒක ජනතාව ගැන හිතලා ගත්ත ප්‍රධාන තීන්දුවක්. මම හිතන්නේ නැහැ, මම ඒ ගත්ත තීන්දුව වෙන කවුරුත් ගනියි කියන එක. ඒක ඉතාමත් පැහැදිලි තීන්දුවක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කලින් ඇමතිතුමාගෙන් නිදහසට කරුණු ඇහුවේ නැද්ද ඒ ගැන.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඒක ඇමතිතුමා නොවෙයි. ඒකට පත් වෙලා තිබෙන්නේ මණ්ඩලයක්. මණ්ඩලයෙන් තමයි තීන්දු ගන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ඇමතිතුමා අවසාන වශයෙන්. ගරු ඇමතිතුමා, කොළඹ දිස්ත්‍රික්කයේත්, කළුතර දිස්ත්‍රික්කයේත් මෙම කටයුත්ත ක්‍රියාත්මක වෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ප්‍රශ්න ඇහුවා ඇති. ඊළඟට කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර ඇති දෙවන ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබා දෙනවා.

# කල්තබන අවස්ථාවේ අසන දෙවන ප්‍රශ්නය
## SECOND QUESTION ASKED AT THE TIME OF ADJOURNMENT

**02.**

**ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් රීති අංක 30 යටතේ අසන ලද ප්‍රශ්නය :**

අ. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් බස් හිමියන් වෙත පෙර ගෙවුම් කාඩ් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ටිකට් මැෂින් යන්ත්‍ර අනිවාර්ය කර තිබේද?

ආ. මෙය අනිවාර්ය කර නොමැති නම් බස් හිමියන් මෙම පෙර ගෙවුම් කාඩ් යන්ත්‍රය ලබා නොගන්නේ නම් බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරී තැනගේ 2014.09.16 වන බප/ප්‍රඅ/01/04/53 ලිපිය මගින් ප්‍රාදේශීය කළමනාකරුවන්ට

2014 ඔක්තෝබර් මස ලොග් පත්‍ර ලබා නොදෙන ලෙස දන්වා ඇත්තේ කුමන පදනමකින්ද?

ඈ. මෙය බස් හිමියන් වෙත කරනු ලබන බලපෑමක් ලෙස ඔබතුමා පිළිගන්නේද?

ඇ. මෙම ටිකට් යන්ත්‍රය ඇක්සස් නමැති පුද්ගලික ආයතනයෙන් පමණක් ලබා ගත යුතු යැයි අධිකාරිය තීරණය කරනු ලැබුවේ විධිමත් ටෙන්ඩර් කැඳවීමකින්ද?

ඉ. නොඑසේ නම් මේ සඳහා ක්‍රියා කළ මෙම නිලධාරීන්ට විරුද්ධව ඔබතුමා ක්‍රියා කරන්නේද?

***පිළිතුර:***
*Reply:*

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අ. ඔව්.

ආ. විශේෂයෙන් බස්නාහිර පළාතේ බස් හිමියන්ගේ සංගමය මාව විවිධ අවස්ථාවල ඇවිල්ලා හම්බ වුණා. මේ බස් හිමියන්ට තිබෙන ප්‍රධානම කාරණාව තමයි මේ බස්වල එන ආදායම නියමිත පරිදි බස් හිමියාට ලැබෙන්නේ නැහැයි කියන එක. ඒ අනුව මේ අය දිගින් දිගටම කථා කරන කොට කිව්වා, දැනට බස්නාහිර පළාතේ බස් 350 ක් ක්‍රියාත්මක වෙනවා, ඔය ඔබතුමා access කියන ආයතනය දුන්න මැෂින්වලින්. ඊට ඉස්සෙල්ලා දුන්න මැෂින් ටික හොඳ නැහැ. ඒ නිසා මේ ආයතනය ක්‍රියාත්මක කරනවා නම් අපි සියල්ලක් කැමැතියි කියන එක. ඒ අනුව මහ බැංකුවේ විශේෂ අනුමැතියට යටත්ව ඩයලොග් ආයතනය එක්ක, access ආයතනය එක්ක බස් හිමියන්ගේ - මේක අපි ගත්ත තීන්දුවක් නොවෙයි. මේක බස් හිමියන්ගේ සංගමයේ ගැමුණු විජේරත්න මහත්තයා, අංජන සහෝදරයා, බස් හිමියන්ගේ විශේෂයෙන් බස් පහකට වඩා තිබෙන විශාල පිරිසක් එකතු වෙලා, ගත්ත තීන්දුවක්. හෙට කියනවා නම් බස්නාහිර පළාත් සභාවේ මේ පෙර ගෙවුම් ක්‍රමය එපා. පෙර ගෙවුම් ක්‍රමයෙන් බස් හිමියන්ට විශාල කරදරයක් වෙනවා කියලා. අපි කැමැතියි ආපහු ආපස්සට යන්න. නමුත් මේ ක්‍රමය තුළ මගියාට මාරු සල්ලි - අපට ඉල්ලන්න බැහැ. සමහර කොන්දොස්තරලාගෙන් මාරු සල්ලි ගන්න බැහැ. ලැජ්ජයි. කොන්දොස්තර අනෙක් පැත්ත බලාගෙන යනවා. මාරු සල්ලි රුපියල දෙක ඉල්ලන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා තමයි මේ ක්‍රමය අනුගමනය කළේ, පළමුවැනි කාරණාව විධියට. දෙවැනි කාරණාව තමයි, 30% ක් බස් හිමියන්ගේ ආදායම එන්නේ නැහැ. බස් හිමියන්ගෙන් නොවෙයි කොන්දොස්තර පොලී මුදලාලිට ගෙවනවා කියලා ලොකු කථාවක් තිබුණා. මටත් තිබුණා, අලුතෙන් ටෙන්ඩර් කැඳවලා මට හිතවත් ආයතනයකින් මේක කරන්න. මම එහෙම කළේ නැහැ. බස් හිමියන්ගේ කැමැත්ත උඩම තමයි ඒගොල්ලෝ නිර්දේශ කරපු එකම තමයි අපි ගත්තේ. ඒ නිසා මේක අනිවාර්යය කරලා කිව්වාට මේක සාර්ථක කර ගන්න අපි චක්‍රලේඛයක් ඇරලා තිබෙනවා. මේක නැවත වතාවක් සාකච්ඡා කරන්න පුළුවන්. ඔබතුමාට ඕනෑ නම් නැවත වතාවක් සාකච්ඡා කරන්න පුළුවන්. මොකද, මේක 100% ක් අනිවාර්ය කරලා එකවර අපට ක්‍රියාත්මක කරන්න බැහැ. මේක ක්‍රමයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ 100% දක්වා යන්න. අඩුපාඩු තිබෙනවා නම් අපි කැමැතියි, ඕනෑම වෙලාවක මේ පිළිබඳව සාකච්ඡා කරන්න. මම උපදේශක කාරක සභාවට දාන්නම්.

ඇ. නැත. මොකද, බස් හිමියන්ට, පැහැදිලිවම මට කථා කරපු සියලු දෙනාටම කියලා තිබෙනවා, ඕනෑම මැෂින් එකකින් ටිකට් එකක් දෙනවා නම් ඒක පාවිච්චි කරන්න පුළුවන් කියන එක. ඒක මම පැහැදිලිව කියලා තිබෙනවා. ඒ access ආයතනයෙන් දෙන එක නොවෙයි. ඕනෑම එකක්. හැබැයි, ටිකට් පත යන්ත්‍රානුසාරයෙන් දෙන්න ඕනෑය කියන එක විශේෂයි. මොකද, නැත්නම් මාරු සල්ලි දෙන්නේ නැහැ. ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

ඇ. ඒකට තමයි මම කිව්වේ. ඕනෑම තැනකින් ගන්න පුළුවන්. ගැටළුවක් නැහැ.

ඉ. අදාළ නොවේ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අරක ඉවරද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කමක් නැහැ. වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

දැන් මම අපි හැමෝම වෙනුවෙන්. දැන් අපට මේ වාගේ කල් තබන වෙලාවේ ප්‍රශ්නයක් යොමු කරන කොට, අපේ අනෙක් මන්ත්‍රීවරුන් මේ ප්‍රශ්නය මොකක්ද කියලා දන්නේ නැහැ. එක්කෝ අඩු ගණනේ ප්‍රශ්නය කියවන්න අවශ්‍යයි. එහෙම නැත්නම් සියලුම මන්ත්‍රීවරුන්ට ෆොටෝ කොපියක් ලැබිය යුතු ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න ඉදිරිපත් කරන ඒ මන්ත්‍රීතුමා, සියලුම මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සලස්වන්න. සභා ලේකම් කාර්යාලය මගින්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට කියවන්න කිව්වත් ඒත් කමක් නැහැ.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේගේ නියෝගය අපට මේ ළඟදී තමයි ලැබුණේ. මම තමයි පස්දුන් රට ඒකාබද්ධ බස් රථ සංගමයේ සභාපති. අපේ සංගමය මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න හේතු ගොඩක් තිබෙනවා. එකක් access සමාගමෙන් විතරක් අපට මේක ගන්න කියලා තිබෙනවා. අනික් එක පළමුවෙනිදාට බස් එක දුවන්න ලොග් ෂීට් එක දෙන්නේ නැහැ, මේ ක්‍රමය ක්‍රියාත්මක නොකළොත්. දැනට මේ මැෂින් එකක් රුපියල් පන්ස්දාහකට වැඩි මුදලක් වෙනවා. මම දන්නවා. මම වගකීමෙන් කියනවා. access ආයතනයේ සභාපතිතුමාට යනවා මේ මැෂින් ටික ගත්තාම දෙකෝටි පනස් ලක්ෂයක්. ප්‍රාදේශීය කළමනාකරුවෙකුට යනවා රුපියල් තුන් දාහක්. ගරු ඇමතිතුමා අපට බස් රථ හයදහස් පන්සීයක් තිබෙනවා. අධිකරණ නියෝගය තිබෙන්නේ විධිමත් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරන්නය කියලා. විධිමත් ප්‍රවේශ පත්‍රයක් කිව්වාට පස්සේ තමුන්නාන්සේ කිව්වා වාගේ මම පිළිගන්නේ නැහැ මැෂින් එකයි බස් එකකට තිබෙන්නේ කියලා. මැෂින් එක අක්‍රීය වෙනවා. මැෂින් එක කැඩෙනවා. මැෂින් එක කැඩුණාට පස්සේ අපේ බස් රථවල පොත්පත් තිබෙනවා. ඒ පොතෙන් තමයි අපි නිකුත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාවක් වශයෙන් නොවෙයි.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

කථාවක් නොවෙයි. මේ විෂයට අදාළව කථා කරන්නේ. එතකොට ඊට පස්සේ අපි අහනවා, උසාවි නියෝගය තිබෙද්දී විධිමත් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරන්න කියලා මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට නියෝගයක් දෙන්න පුළුවන්ද ක්ෂණිකව පළමුවැනිදා ඉඳලා මේ ටිකට් යන්ත්‍රය මිලදී නොගත්තොත් අපට ලොග් ෂීට් දෙන්නේ නැතෙයි කියලා. මම තමුන්නාන්සේට වගකීමෙන් කියනවා. මේ නියෝගයෙන් පළමුවැනිදාට ලොග් ෂීට් අපට නොදුන්නොත් අපට ලොග් ෂීට් ගන්න වෙන්නේ නැහැ. අපේ බස් රථ දුවන්නේ නැති වෙන්න පුළුවන්. ඒ නිසා මම තමුන්නාන්සේට කියනවා, කරුණාකරලා අපව මීට වඩා දැනුවත් කරලා, අපේ සංගම් කැඳවලා, මේ ගැමුණු විජේරත්න මහත්තයා කොළඹට විතරක් සීමා වෙලා ඉන්න නායකයෙක්. අපි දිස්ත්‍රික් මට්ටමෙන් මේවා නියෝජනය කරන සභාපතිවරු. ඒ නිසා මම කියනවා, මේක අපට දැඩි ප්‍රශ්නයක්. මේ වාගේ දැඩි තීරණ, ඉතා කෙටි කාලයක් තුළ අරගෙන මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ දැන්වීම් පුවරුවේ දානවා පළමුවැනිදා වෙන කොට මේක නොගත්තොත් ලොග් ෂීට් එක දෙන්නේ නැහැයි කියලා. එහෙම නම් මම අහනවා, මේ ඔක්කොම නීති රීති දා ගන්නේ අපට. අපියි බස් කර්මාන්තය කරන්නේ. අපේ බස් රථ 7000 ක්, 6500 ක් මේ රටේ දුවන්නේ. මම අහනවා ගමනා ගමන මණ්ඩලයට මොන නීති රීතිද? ලොග් ෂීට් නැහැ. අන්න

[ගරු ජගත් පින්නගොඩ විතාන]

අපේ පැත්තේ දොර එකේ බස් දුවනවා. කොළඹ - මතුගම. කළුතර - මතුගම. නුවර - මතුගම. මේ හැම තැනම දොර එකේ බස් දුවනවා. මේ කිසිම නීතියක් ඒවාට අදාළ වෙන්නේ නැහැ. දුම් සහතිකයක් නැහැ. රක්ෂණයක් ඕනෑ නැහැ. ආදායම් බලපත්‍රයක් ඕනෑ නැහැ. නමුත් සියලු නීති රීති අපට දාගන්නවා ඇමතිතුමනි. අපේ බස් රථ හිමියෝ ඉතා අසරණ වෙලා ඉන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමා ඉතා ක්ෂණික හොඳ විනිවිද පෙනෙන ආකාරයෙන් හොඳ තීරණ ගන්නා ඇමතිවරයෙක් විධියට අපි බලාපොරොත්තු වෙනවා මීට වඩා කාලයක් මේකට ලබා දීලා මේ තීරණය අත්හිටුවලා අපිත් එක්ක සාකච්ඡා කරලා, මේ වෙන්න යන සට්ටනය නැති කරන්න ඔබතුමා අපට උදව් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිවම බස් හිමියාගේ පැත්ත සහ මගියාගේ පැත්ත බලලා තමයි මේ තීන්දුව අරන් තිබෙන්නේ. ඔබතුමන්ලා දන්නවා මම ආවාට පස්සේ තවම එක බස් මාර්ගයකටවත් අලුතින් නිකුත් කරලා නැහැ. ප්‍රවාහන අධිකාරියට විශාල ආදායම් ලැබුණු ප්‍රධානම අංගය තමයි බස් පර්මිට් නිකුත් කරන එක. ඒක කරලා නැහැ. ඊළඟට අවුරුදු දෙකක් තිස්සේ - අවුරුදු දෙකකට මේ බලපත්‍ර ගත්තේ නැතිව ඉඳලා අවුරුදු දෙකක් ඇතුළත ආවොත් බලපත්‍ර දෙන සීමාවක් තිබුණා. මම ඒක මාස හයකට අඩු කරලා බස් හිමියන්ට සහනයක් සැලසුවා. ඊළඟට පරණ බස් එකක් අයින් කරලා, තව බස් එකක් දාද්දී ඒක ඊට වඩා අලුත් එකක් වෙන්න ඕනෑය කියලා නීතියක් දැම්මා. මේ ඔක්කොම කළේ බස් හිමියන්ගේ සුභ සාධනය සඳහා. ඊළඟට බස් මගියාගේ පහසුව තකා. ඒ නිසා ඔබතුමා යෝජනා කරනවා නම් ගැමුණු විජේරත්න මහත්තයා කොළඹයි, අංජන මහත්තයා මෙතැනයි, අනික් අය වැඩක් නැහැ. ඔබතුමන්ලා තමයි ප්‍රබලම බස් සංගමය කියන එක. ඔබතුමාගේ රූට් එකට විතරක් මම සාකච්ඡාවක් දෙන්නම්. ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. මොකද, මේකට මේ සියලු දෙනා එකඟ වෙලා තිබෙනවා. මම කියන්නම්. ඔබතුමා සභාවේදී මේක ඇහුවා. ඒ නිසා ඔබතුමා එක්ක සාකච්ඡාවක් දෙනවා. සාකච්ඡාවෙන් පස්සේ අපි තීන්දුවක් දෙන්නම්. මොකද, උසාවියෙන් පැහැදිලිව කියලා තිබෙනවා, මගියාට ටිකට් එකක් දිය යුතුයි කියලා. ඒකේදී අපි අනිවාර්ය කරලා නැහැ, අපි කියන මැෂින් එක ගන්නය කියන එක. අපි පැහැදිලිව කියලා තිබෙනවා, ඕනෑම මැෂින් එකකින් ටිකට් එක නිකුත් කරන්න කියලා. ඕනෑ එකකින් ඔබතුමන්ලා නිකුත් කරන්න. හැබැයි, ටිකට් එක නිකුත් නොකර බස් එක යන්න නම් අපි ලොග් ෂීට් දෙන්නේ නැහැයි කියන එක අපි පැහැදිලිව කියනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ඇමතිතුමා, දැනටත් අපි ටිකට් පත් නිකුත් කරනවා නේ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ පත්තරේ අරන් බැලුවොත් තමුන්නාන්සේට මම කියන්නම්. හැමදාම පත්තරේ මොනවාද ලියන්නේ? කොන්දොස්තරට බණිනවා. අපේ ප්‍රවාහන අධිකාරියේ ඉන්න නිලධාරීන්ට බණිනවා. පත්තර ගත්තොත් මම හිතන්නේ, සතියකට වැඩිම News තිබෙන්නේ ප්‍රවාහන අධිකාරිය පිළිබඳව. මේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය නැහැයි කියන එක පිළිබඳව. ඒක ගැන කථා කළොත් වෙනම විවාදයක්. මේ බස්නාහිර පළාතේ පමණක් නොවෙයි ලංකාවේම ප්‍රවාහනය පිළිබඳව තිබෙන, ලංගම හෝ පෞද්ගලික හෝ එකක් තමයි මේ බස්වල මේ පහසුකම් ටික නැහැ. අනික් එක තමයි කොන්දොස්තර විනීත භාවයෙන් කථා කරන්නේ නැහැ. තව එකක් තමයි මේ කොන්දොස්තර හරියට ඉතිරි මුදල් දෙන්නේ නැහැ. ඊළඟට විවිධ කාමුක ආසාවන් තිබෙන අය මගීන්ට විවිධ අඩන්තේට්ටම් කරනවා. ඒ නිසා මේ පිළිබඳව වෙනම විවාදයක් තිබෙනවා. ඔබතුමා කියන්නේ, මේ ලොග් ෂීට් එක අනිවාර්ය කිරීම තුළ තමුන්නාන්සේට අසාධාරණයක් වෙනවා. ඉතින් මම පැහැදිලිව පිළිගන්නවා නේ? තමුන්නාන්සේලාට අසාධාරණයක් වෙනවා නම් තමුන්නාන්සේලාගේ සංගමයට විතරක් මම සාකච්ඡාවක් දෙන්නම්. මුළු බස්නාහිර පළාතටම ගත්තු තීන්දුව මට වෙනස් කරන්න බැහැ. ඒක සියලු සංගම් එක්ක එකතු වෙලා ගත්ත එකක්.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු අමැතිතුමා, දැන් තමුන්නාන්සේ කියනවා ක්‍රමිකව මේ බලපත් නිකුත් වෙනවාය කියලා. මම මේ දැන් වගකීමෙන් කියනවා දක්ෂිණ අධිවේගී මාර්ගයේ දුවන බස් රථ හයක් ව්‍යාජයි. හයක් බොරු ඒවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක මට අදාළ නැහැ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කියන එක -

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

තමුන්නාන්සේ කියන විධියට දැන් කළුතරට පුළුවන්ද මේ තිබෙන ලොග් ෂීට් එක ගන්න. අපේ දැන් කරන මැෂින්වලින් - එපමණයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, මම බස් හිමියන්ගේ සංගම් එක්ක ගත්ත තීන්දුවක් එකපාර මට අද වෙනස් කරන්න බැහැ. ඒ නිසා මම තමුන්නාන්සේට අවස්ථාවක් දෙන්නම්. තමුන්නාන්සේගේ කලාපය පිළිබඳව තීන්දුවක් ගන්න. මොකද, මේක මම ගත්ත තීන්දුවක් නොවෙයි. මේක බස් කර්මාන්තයේ ඉන්න සියලු දෙනා තමුන්නාන්සේලා වාගේ අයිතිකාරයෝ සහ ඒ බස් මගී සංගම් ගෙනැල්ලා අපේ නිලධාරීන් එක්ක ගත්ත තීන්දුවක්. මොකද, මට තිබෙන ප්‍රධානම කාරණාව තමයි එකක් තමුන්නාන්සේලා දන්නවා නේ ප්‍රවාහන අධිකාරිය හොර ගුහාවක් කියනවා කියන එක.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

දන්නවා. ඉතින් ගරු ඇමතිතුමා, බස් රථ හිමියන් එක්ක කථා කරනවා නම් මට තමයි කළුතර දිස්ත්‍රික්කයෙන් බස් රථ වැඩිම සංඛ්‍යාවක් තිබෙන්නේ. මාව කැඳවලා නැහැ නේ මේ වාගේ සාකච්ඡාවකට.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක තමයි මම කිව්වේ. වරදක් සිදු වෙලා තිබෙනවා නම් තමුන්නාන්සේව ගෙනැල්ලා මම සාකච්ඡා කරලා තමුන්නාන්සේගේ අනික් බස් හිමියොත් එක්ක -

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

අපට පළමුවැනිදා වෙන කොට ලොග් ෂීට් එක ගත හැකිද ඇමතිතුමා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම දැන් තමුන්නාන්සේට කිව්වා නේ? තමුන්නාන්සේගේ බස් දුවන රූට් එකට විතරක් මම ඒ පිළිබඳව සාකච්ඡා කරන කල් මම ඕක නවත්වන්නම්. ඒක ගැටළුවක් නැහැ. හැබැයි, අපි පොදු තීන්දුවකට තමයි මේ සාකච්ඡාවෙන් පස්සේ එන්නේ. ඒකත් තමුන්නාන්සේ පිළිගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව ඉදිරිපත් කරන්න අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබා දෙනවා.

# කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව

## MOTION PRESENTED AT THE TIME OF ADJOURNMENT

[අ.භා. 01.48]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 31(ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 31(ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් පාසල්වල ක්‍රියාත්මක වන විශේෂ අධ්‍යාපන ඒකකවල දරුවන්ගේ අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් යෝජනාවක් 2014 ජූනි මස 17 වන දින බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු කළෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස වයස අවුරුදු 16 ඉක්මවූ පාසල් හැර යන විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ මේ වන විට අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා වට දෙකක් පවත්වා*

*ව්‍යාපෘති යෝජනාවක් සකස් කොට ඇත. මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපය තුළ ඇති වැසී ගිය අක්කර 1 ¾ ක් පමණ ඉඩමක් සහිත දැස්ගම කනිෂ්ට විද්‍යාලය 2014 සැප්තැම්බර් මස 09 වැනි දින පවරා ගනු ලබයි. මෙම උතුම් කටයුත්ත වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කළ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි. නියමු ව්‍යාපෘතිය 2015 වසර මුල් කාර්තුව තුළ ආරම්භ කිරීමට අදහස් කරන අතර 2015 අයවැයෙන් ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිමි. ව්‍යාපෘති යෝජනාව හා ඊට අදාළ මූල්‍ය අයවැය වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරමි.*

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා. 02.08]

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ මගේ මංගල කථාව. මේ සඳහා මට අවස්ථාව ලබා දුන් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ගම්පහ දිස්ත්‍රික්කයෙන් මා ඇතුළු මන්ත්‍රීවරු හතර දෙනෙක් පත් කළා. ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටත්, විශේෂයෙන්ම අත්තනගල්ල මාගේ ජනතාවටත් පක්ෂය වෙනුවෙන් මාගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම මෙම පළාත් සභාව තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරපු මේ විශේෂ යෝජනාවට එතුමා මේ වන කොට විශාල ප්‍රතිචාරයක් දක්වා සිටිනවා. ඒ ගැන පෞද්ගලිකවම මේ ව්‍යාපෘතියේ නියමුවා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන අතර අපේ මන්ත්‍රීවරුන්ගේ අවධානයත් මේ සඳහා යොමු කොට විශේෂයෙන්ම තමන්ගේ ප්‍රතිපාදනවලින් විශේෂ අධ්‍යාපන ඒකකයේ දරුවන් සඳහා යම්කිසි මුදලක් තමුන්නාන්සේලාගේ ප්‍රතිපාදන තුළින් ලබන වසරේ සිට හෝ වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටිමින්, මේ අවස්ථාව මට ලබා දීම සම්බන්ධව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.10 ට, 2014 ඔක්තෝබර් මස 07 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 02.10 p.m till 9.30 a.m. on 07.10.2014*